මෙම නඩුවේ, පැමිණිල්ලේ සාක්ෂි අංක 1958 අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ විශේෂ අංශයේ ස්ථානාධිපති ලෙස කටයුතු කළ ප්‍රධාන පොලිස් පරීක්ෂක ලලිත ගීතාංජන දිසානායක මහතා විසින් 2019 අප්‍රේල් 21 වන දින සිදු වූ පාස්කු ඉරුදින ත්‍රස්ත ප්‍රහාර මාලාවේ කොච්චිකඩේ ශාන්ත අන්තෝනි දේවස්ථාන පිපිරීම සහ ඊට අදාළ විමර්ශන සම්බන්ධයෙන් සාක්ෂි ලබා දෙන ලද අතර, 2019 අප්‍රේල් 22 වන දින CID අධ්‍යක්ෂක සහ සහකාර පොලිස් අධිකාරී තිසේරා මහතාගේ නියෝග පරිදි ඔහු මෙම විමර්ශන භාරගෙන ඇති බවත්, එකී දේවස්ථානයේ ස්වයංඝාතක බෝම්බකරු ලෙස අලවිදීන් මුවහද් නැමැත්තා කටයුතු කර ඇති බව අනාවරණය වී ඇත.

එසේම නාවික හමුදාව සහ සොකෝ (SOCO) නිලධාරීන් විසින් වහලයේ හුළං කවුළුවක තිබී සොයාගන්නා ලද මරාගෙන මැරෙන බෝම්බකරුගේ හිස කොටස අධිකරණ නියෝග මත මෘත ශරීරාගාරයට යොමු කර තිබූ අතර, අංක 04, නිව්හැම් චතුරස්‍රය, කොළඹ 14 ලිපිනයේ අල්පොන්සු ප්‍රනාන්දුගේ නිවසේ සවිකර තිබූ (නියමිත වේලාවට වඩා මිනිත්තු 30 ක් අඩුවෙන් පටිගත වූ) CCTV කැමරා දර්ශන පරීක්ෂා කිරීමෙන් සැකකටයුතු සුදු පැහැති වෑන් රථයක් හඳුනාගත් බවට සාක්ෂි දී ඇත. එකී WP PJ-4080 දරන නිසාන් ටිපර් වර්ගයේ වෑන් රථය විශේෂ කාර්ය බලකායේ පොලිස් පරීක්ෂක ප්‍රියන්ත මහතා ලවා පරීක්ෂා කරවීමේදී එහි බෝම්බයක් අටවා ඇති බව හෙළි වූ බවත්, ජනතාව ඉවත් කර සහකාර පොලිස් අධිකාරී සමරනායක මහතාගේ මෙහෙයවීමෙන් එය ආරක්ෂිතව පුපුරුවා හැරීමට කටයුතු කළ බවත්, එම දෙවන පිපිරීමෙන් ජීවිත හානියක් සිදු නොවුවද දේපළ හානි සිදු වූ බවටත් සාක්ෂි දී ඇත.

එසේම පිපිරීමෙන් පසු ස්ථානය පරීක්ෂා කිරීමේදී හමු වූ නඩු භාණ්ඩ අතුරින්, දේපල කුවිතාන්සි අංක 43/2019 යටතේ මුද්‍රා තබන ලද ලිපිකවරය පැ.1727 වශයෙන්ද, එකී ලිපිකවරය තුළ තිබූ කැබැලි වී ගොස් සෙලෝටේප් මඟින් අලවා සකස් කරන ලද අංක B 2692766 දරන අලවිදීන් අහමඩ මුවාත්ගේ රියදුරු බලපත්‍රය පැ.1728 වශයෙන්ද ලකුණු කරන ලද අතර, එමෙන්ම WP PJ 4080 දරන රථයේ අංක තහඩුව බහා තිබූ ලිපිකවරය පැ.1731 වශයෙන්ද, එහි වූ සුදු පැහැති පසුබිමේ කළු අකුරු

සහිත ඇදවී ගිය WP PJ 4080 අංක තහඩුව පැ.1732 වශයෙන්ද, PR 78/19 අංකය සහිත ලිපිකවරය පැ.1733 වශයෙන්ද, එහි අන්තර්ගත වූ කහ පැහැති පසුබිමේ කළු අකුරු සහිත ඇදවී සිදුරුවී දැවී ගිය WP PJ 4080 අංක තහඩුව පැ.1734 වශයෙන්ද සාක්ෂිකරු විසින් හඳුනාගෙන ලකුණු කරන ලදී.

එසේම එම රථය මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක්, අංක 138B, නිව් මුවර් වීදිය, කොළඹ 12 නමට ලියාපදිංචි වී තිබූ බවට වූ වාහන ලියාපදිංචි සහතිකය, උපදෙස් සහතිකය, කඳාන කාගිල්ස් ෆුඩ්සිටි බිල්පතක්, ජපන් භාෂාවෙන් ලියන ලද පොත් සහ කළු පැහැති මුදල් පසුම්බියක්ද භාරයට ගෙන ඇත. තවද රියදුරු බලපත්‍රයේ සඳහන් අංක 722B, බිලූමැන්ඩල් පාර, කොළඹ ලිපිනය ඔස්සේ සිදුකළ විමර්ශනවලදී, CIDයේ රඳවාගෙන සිටි 8 වන චූදිත අබ්දුල් මනාෆ් මොහොමඩ් ෆිරිදවුස් 2019.05.16 දින ලබාදුන් ප්‍රකාශය සහ විදේශයක සිට රැගෙන ආ 3 වන චූදිත හයාතු මොහොමදු අහමදු මිල්හාන් 2019.06.21 දින ලබාදුන් ප්‍රකාශය මත සාක්ෂි ආඥා පනතේ 27(1) වගන්තිය ප්‍රකාරව තොරතුරු අනාවරණය කරගෙන ඇති අතර, 2019.06.21 දින පැය 09.00 ට උප පොලිස් පරීක්ෂක මෙන්ඩිස් විසින් සටහන් කරගන්නා ලද මිල්හාන්ගේ ප්‍රකාශයේ සහතික කරන ලද උද්ධෘත කොටස (C 696/2018 විමර්ශන ගොනුවට අදාළ) පැ.1737 වශයෙන් ලකුණු කරන ලදී. ඒ අනුව 2019.06.26 දින KP-5844 රථයෙන් සැකකරුවන් දෙදෙනාද සමඟ පිටත්වූ විමර්ශන කණ්ඩායම,

පොළොන්නරුවේදී WP BC-2903 කැබ් රථයෙන් පැමිණි අමතර CID නිලධාරීන් කණ්ඩායමක්ද එකතු කරගෙන මඩකලපුව බලා ගොස් ඇති බව පෙනී යයි.

තවද, 2019.06.27 දින ඔල්ලිකුලම්, ආරියම්පති ප්‍රදේශයේ පිහිටි ඉඩම් දෙකකට සැකකරුවන් දෙදෙනා තනි තනිව කැඳවාගෙන ගිය අතර, මුලින්ම මිල්හාන් විසින් සහ පසුව ඔහු පෙන්වූ ස්ථානම පිරිදවුස් විසින්ද පෙන්වා දෙන ලදී. එහිදී මොහොමඩ් සිද්ධික් මොහොමඩ් මෆාස්ට අයත් (පෙර මිල්හාන්ට අයත්ව තිබූ) වැලි සහිත ඉඩමේ ස්ථාන 7 ක් (C සිට I දක්වා) සහ ඊට අඩි 100 ක් පමණ ආසන්නයේ තිබූ අබ්දුල් රවුෆ්ගේ ඉඩමේ ස්ථාන 2 ක් (A සහ B) වශයෙන් ස්ථාන 9 ක් හඳුනාගෙන ඇත.

එසේම විශේෂ කාර්ය බලකායේ සහාය ඇතිව එම ස්ථාන හෑරීමේදී සොයාගත් නඩු භාණ්ඩ ලකුණු කරන ලද අතර, A ස්ථානයෙන් හමු වූ ප්ලාස්ටික් බට දෙක අතුරින් A1 බටයේ තිබූ විදේශීය අලුත් කඩු 19 පැ.1741 වශයෙන්ද, A2 බටය අඩංගු PR 195/19 දරන කවරය පැ.1742 වශයෙන්ද, එකී A2 ප්ලාස්ටික් බටය පැ.1743 වශයෙන්ද, එහි තිබී සොයාගත් මෙරට නිෂ්පාදිත කඩු 11 පැ.1744 වශයෙන්ද ලකුණු කරන ලද අතර, B ස්ථානයෙන් සොයාගත් 7.62mm ජීව උණ්ඩ 475 ක්, 5.56mm ජීව උණ්ඩ 33 ක්, HK 11 ජීව උණ්ඩ 11 ක් සහ පුහුණු උණ්ඩ 4 ක් අඩංගු රජයේ රසපරීක්ෂක මුද්‍රා සහිත PR 194/2019 (CF 243/19) පාර්සලය

පැ.1745 වශයෙන්ද, ඒ තුළ වූ උණ්ඩ පෙට්ටිය පැ.1746 වශයෙන්ද ලකුණු කරන ලදී. C ස්ථානයෙන් ජෙලටි නයිට් සාන්ද්‍රණය අඩංගු බාල්දි දෙකක්ද (C1, C2), D, E, F ස්ථානවලින් පිළිවෙලින් ජෙලටි නයිට් කූරු 81, 93, 93 බැගින්ද සොයාගන්නා ගෙන ඇති අතර, G ස්ථානයෙන් සොයාගත් බටයේ තිබූ ප්ලාස්ටික් ලන්ච් බොක්ස් 5 (ඩෙටනේටර් 1000 ක් අඩංගු) පැ.1757(1) සිට පැ.1757(5) දක්වා ලකුණු කරන ලදී. H ස්ථානයෙන් රතු සේවානුල් අඩි 35 ක් සහ ජෙලටි නයිට් කූරු 87 ක්ද, I ස්ථානයෙන් සේවානුල් කොටස් 5 ක් සහ ඩෙටනේටර් 500 ක් අඩංගු පෙට්ටි 3 ක්ද හමු වී ඇති අතර, ජෙලටි නයිට්, ඩෙටනේටර් සහ සේවානුල් මඩකලපුව මහේස්ත්‍රාත් අධිකරණයේ B/621/19 නඩුවේ 2019.08.30 දිනැති නියෝගය පරිදි විශේෂ කාර්ය බලකාය මඟින් විනාශ කරන ලද අතර, එකී අධිකරණ නියෝගයේ පිටපත පැ.1748 වශයෙන්ද, පුපුරන ද්‍රව්‍ය අඩංගු වූ බට 6 පැ.1749 වශයෙන්ද, එම බට ආවරණය කළ කවර පැ.1749(1) සහ පැ.1749(2) වශයෙන්ද, PR 194/2019 දේපළ කුවිතාන්සිය පැ.1750 වශයෙන්ද, PR 195/2019 දේපළ කුවිතාන්සිය පැ.1751 වශයෙන්ද, ප්ලාස්ටික් එන්ඩ් කැප් 9 පැ.1754 වශයෙන්ද ලකුණු කරන ලදී. ඊට අමතරව 28 වන දින STF පරීක්ෂාවේදී සොයාගත් J1 බටයේ තිබූ විදේශීය කඩු 13 ක් හා දේශීය කඩු 5 ක්ද, J2 බටයේ තිබූ විදේශීය කඩු 16 ක්ද භාරයට ගෙන ඇත.

එසේම හරස් ප්‍රශ්න කිරීම්වලදී 2, 7, 10, 15, 18 සහ 19 යන චූදිතයන් වෙනුවෙන් පෙනී සිටි නීතිඥ කනිල් මද්දුමාගේ මහතා යෝජනා කර ඇත්තේ, 8 වන චූදිත පිරිදවුස් හට CID විශේෂ අංශයේදී පහරදී අතවර කරමින් මුහුණට කිහිපවරක් පහරදුන් බව වේ. තවද 2019 දී ඔහුට සිංහල කතා කිරීමට නොහැකිව තිබියදී දෙමළ පරිවර්තකයෙකු නොමැතිව සිංහලෙන් ප්‍රකාශ සටහන් කරගත් බවත්, රාමසාන් උපවාස කාලයේදී ඔහුට බලෙන්ම කෑම හා ඌරු මස් කන්න දෙමින් කෲර ලෙස වධහිංසා කළ බවත්, ඔහු නොකී කරුණු ලියා අත්සන් ගත් බවත් යෝජනා කරන ලද අතර, 2019.05.16 දින ප්‍රකාශය ලබාගෙන මාස 1 යි දින 11 ක් යන තෙක් ස්ථානය පරීක්ෂා කිරීමට නොගිය බවත්, එම ඉඩම තහඩුවලින් වටකර තිබුණද ඉඩිබන් දමා මුද්‍රා තබා ආරක්ෂා නොකළ නිසා ඕනෑම අයෙකුට ඇතුළුවිය හැකිව තිබූ බවත්, චූදිතට එරෙහිව සාක්ෂි නැති නිසා CIDය විසින් බොරුවට පටලවන ලද බවත් යෝජනා කරන ලදී.

ඒ අනුව මෙම සාක්ෂිකරු මෙම සියලු චෝදනා හා පහරදීම් තදින්ම ප්‍රතික්ෂේප කළ අතර, පිරිදවුස් සිංහල පාසලක ඉගෙනුම ලබා සිංහල හොඳින් තේරුම්ගත හැකි අයෙකු බවත්, වෙනත් විමර්ශන කණ්ඩායම් මඟින් ඔහුව ප්‍රශ්න කිරීම්වලට ලක්කළ නිසා කාලය ගතවූ බවත්, ප්‍රකාශය මත පදනම්ව මෙම සියලු දෑ සොයාගත් බවත් ප්‍රකාශ කරන ලදී.

තවද 3 වන චූදිත මිල්හාන් විසින් සිදුකළ හරස් ප්‍රශ්න කිරීමේදී ඔහු යෝජනා කළේ 2019.06.14 දින විදේශයක සිට ලංකාවට රැගෙන ආ පසු සහකාර පොලිස් අධිකාරී තිසේරා මහතාගේ කාර්යාලයේදී කෲර වධහිංසාවලට ලක්කළ බවත්, තමන්ට සිංහල කතා කිරීමට හෝ ලිවීමට/කියවීමට නොහැකිව තිබූ බවත්, අත්අඩංගුවේ සිටි බිරිඳ සහ මල්ලී නිදහස් කිරීමට නම් කියන තැන්වල අත්සන් කරන ලෙසට සාක්ෂිකරු ඇතුළු නිලධාරීන් තර්ජනය කරමින් නොදන්නා සිංහල ලේඛනවල අත්සන් ලබාගත් බවත්, කිසිදු ප්‍රකාශයක් නොදුන් බවත්, ඉඩම්වල කිසිදු තැනක් නොපෙන්වූ අතර රවුෆ්ගේ ඉඩමේ තිබූ නිවසක තමන්ව රඳවාගෙන සිටි බවත් යෝජනා කර ඇති අතර, 2019.02.19 දිනම එම ඉඩම මෆාස්ට විකුණා තිබූ බවත්, පාතාල ප්‍රබලයෙකු වන බඩෝවිට ලොකුගේ ඡායාරූප වෙනුවට තමන්ගේ විදේශ ගමන් බලපත්‍රයේ ඡායාරූප මාධ්‍යයට ලබාදෙමින් දේශපාලන අවශ්‍යතා මත තමන්ව ත්‍රස්තවාදියෙකු කිරීමට බොරු සාක්ෂි දෙන බවටත් යෝජනා කරන ලද අතර, සාක්ෂිකරු එකී සියලු යෝජනා ප්‍රතික්ෂේප කළ අතර, මිල්හාන්ට සිංහල තේරුම් ගත හැකි වූවත් අපැහැදිලි තැන් දෙමළ භාෂාවෙන් තේරුම් කරදීමට කිශෝර් සහ යාදවී යන නිලධාරීන් යොදාගත් බවත්, බිරිඳ හෝ සහෝදරයා අත්අඩංගුවට ගෙන නොතිබූ බවත්, තර්ජනය කිරීමකින් තොරව නිවැරදිව ප්‍රකාශ සහ සාක්ෂි ලබාගත් බවත් පැවසීය.

5 වන චූදිත මොහොමඩ් ඊබ්‍රාහිම් සාහිඩ් අබ්දුල් හක් විසින් හරස් ප්‍රශ්න කිරීමේදී, ස්ථාන හැරීමේදී ඡායාරූප හෝ වීඩියෝ ලබා නොගැනීම සහ සොකෝ (SOCO) නිලධාරීන් කැඳවා නොතිබීම පිළිබඳ ප්‍රශ්න කරන ලද අතර, එකී සොයාගත් ජෙලට් නයිට් කූරුවල එකතුව (81+93+93+87) 354 ක් වන නමුදු දේපළ කුවිතාන්සියේ 369 ක් ලෙස සටහන් කර තිබීම පිළිබඳව ප්‍රශ්න කරමින් 15 ක් කඩෙන් ගෙනැවිත් දැමුවේදැයි යෝජනා කල අතර, තවද සැකකරුවන් තනි තනිව කැඳවාගෙන ගිය බවටත්, මෆාස්ට අයත් ඉඩමේ ස්ථාන 07 කින් භාණ්ඩ ගත් බවටත් නිලධාරියා තැබූ සටහන්වල සහ ලබාදුන් සාක්ෂිවල පරස්පරතා ඇති බව පෙන්වා දෙන ලදී. සාක්ෂිකරු ඡායාරූප නොගත් බව පිළිගත් අතර, ජෙලට් නයිට් කූරු සියල්ල එකට ගණන් කිරීමේදී නිවැරදි ප්‍රමාණය 369 ක් වූ බවත්, සටහන්වල එක් ස්ථානයක රවුල්ගේ ඉඩම ලෙස ලියැවී තිබුණේ ලිඛිත වැරදීමකින් බවත් පැහැදිලි කරමින් අසත්‍ය සාක්ෂි දුන් බවට වූ යෝජනාව සාක්ෂිකරු ප්‍රතික්ෂේප කරන ලදී.

<u>පැමිණිල්ලේ සාක්ෂි අංක 1958 ප්‍රධාන පොලිස් පරීක්ෂක ලලිත ගීතාංජන දිසානායක සාක්ෂිය විශ්ලේෂණය</u>

මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය තුලින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ භාරයේ සිටි 03 වන චූදිත හයාතු මොහොමදු අහමදු

මිල්හාන් සහ 08 වන චූදිත අබ්දුල් මනාෆ් මොහොමඩ් ෆිරිදවුස් යන අය විසින් ලබාදෙන ලද ප්‍රකාශයන්හි අඩංගු වූ තොරතුරු මත සාක්ෂි ආඥා පනතේ 27(1) වගන්තිය ප්‍රකාරව මඩකලපුව, ඔල්ලිකුලම් ප්‍රදේශයේ සඟවා තිබූ විශාල නඩු භාණ්ඩ ප්‍රමාණයක් සොයාගැනීම පිළිබඳ සාක්ෂි ඉදිරිපත් වී ඇත. පොලිස් භාරයේ සිටින සැකකරුවෙකුගේ ප්‍රකාශයක් සාමාන්‍යයෙන් සාක්ෂියක් ලෙස ඇතුළත් කරගත නොහැකි වුවද, එකී ප්‍රකාශය මත පදනම්ව යම් භෞතික නඩු භාණ්ඩයක් සොයාගනු ලබන්නේ නම්, එම සොයාගැනීමට සෘජුවම හේතු වූ ප්‍රකාශ කොටස පමණක් සාක්ෂි ආඥා පනතේ 27(1) වගන්තිය යටතේ නීත්‍යානුකූලව මෙහෙයවිය හැක. ඒ අනුව මිල්හාන්ගේ ප්‍රකාශයේ සහතික කළ උද්ධෘතය පැ.1737 ලෙසද, ෆිරිදවුස්ගේ ප්‍රකාශයේ උද්ධෘතය පැ.1738 ලෙසද ලකුණු කර අධිකරණය හමුවට ඉදිරිපත් කර තිබේ. එම ප්‍රකාශයන්ට අනුව ඔල්ලිකුලම් ප්‍රදේශයේ පිහිටි ඉඩම් දෙකක වළදමා තිබූ විදේශීය හා දේශීය කඩු, 7.62mm, 5.56mm ඇතුළු විවිධ ජීව උණ්ඩ, ජෙලටි නයිට්, ඩෙටනේටර් සහ සේවානුල් අඩංගු ප්ලාස්ටික් බට හා පෙට්ටි සොයාගැනීමට හැකි වීමෙන් 27(1) වගන්තියේ නීතිමය පදනම තහවුරු වේ.

විත්තිය විසින් හරස් ප්‍රශ්න කිරීම්වලදී මෙම ප්‍රකාශවල ස්වේච්ඡාභාවය (Voluntariness) සහ සාක්ෂිමය වටිනාකම බරපතල ලෙස අභියෝගයට ලක් කරන ලදී. 08 වන චූදිත පිරිදවුස්ට CID නිලධාරීන් විසින් මුහුණට පහරදෙමින් වධහිංසා කළ බවත්, රාමසාන් උපවාස

කාලයේදී බලහත්කාරයෙන් ආහාර හා ඌරු මස් දුන් බවත්, 03 වන චූදිත මිල්හාන්ගේ බිරිඳ සහ සහෝදරයා අත්අඩංගුවේ සිටින බවට තර්ජනය කරමින් නොදන්නා ලේඛනවල අත්සන් ලබාගත් බවත් යෝජනා විය. එමෙන්ම, චූදිතයන්ට සිංහල භාෂාව කතා කිරීමට, ලිවීමට හෝ කියවීමට නොහැකිව තිබියදී නිල දෙමළ භාෂා පරිවර්තකයෙකු නොමැතිව සිංහලෙන් ප්‍රකාශ සටහන් කරගත් බවටද චෝදනා කෙරිණි. කෙසේ වෙතත්, සාක්ෂිකරු මෙම සියලු චෝදනා සහ පහරදීම් තදින්ම ප්‍රතික්ෂේප කළ අතර, පිරිදවුස් සිංහල පාසලක ඉගෙනුම ලබා සිංහල තේරුම් ගත හැකි අයෙකු බවත්, මිල්හාන්ගෙන් ප්‍රශ්න කිරීමේදී අවශ්‍ය ස්ථානවලදී දෙමළ භාෂාව දන්නා කිශෝර්, යාදවී සහ මෙන්ඩිස් යන නිලධාරීන් ලවා කරුණු පැහැදිලි කරදුන් බවත් සඳහන් කළේය.

නඩු භාණ්ඩවල සුරක්ෂිතභාවය (Chain of Custody) සහ විමර්ශන ක්‍රියාපටිපාටියේ නීත්‍යානුකූලභාවය සම්බන්ධයෙන්ද අධිකරණය හමුවේ ප්‍රශ්න කෙරිණි. ප්‍රකාශය සටහන් කරගැනීමෙන් (2019.05.16) ස්ථානය පරීක්ෂා කිරීමට (2019.06.27) මාස 1 යි දින 11 ක දීර්ඝ කාලයක් ගතවීම, අදාළ ඉඩම් මුද්‍රා තබා ආරක්ෂා නොකිරීම, හෑරීම් සිදුකිරීමේදී සොකෝ (SOCO) නිලධාරීන් නොකැඳවීම සහ ඡායාරූප හෝ වීඩියෝ දර්ශන ලබා නොගැනීම විත්තිය විසින් ක්‍රියාපටිපාටික දුර්වලතා ලෙස පෙන්වා දෙන ලදී. තවද, ජෙලටි නයිට් කූරු එකතුවේ පැවති සංඛ්‍යාත්මක වෙනස (354 ද නැතහොත් 369 ද යන්න) සහ සටහන් පොතේ ඉඩම් හිමිකරුවන්ගේ නම්

(මෆාස්ගේ ඉඩම වෙනුවට රවුෆ්ගේ ඉඩම ලෙස) සටහන් වීම පිළිබඳ පැවති පරස්පරතා මඟින් සාක්ෂියේ විශ්වසනීයත්වය බිඳහෙළීමට චිත්තිය උත්සාහ කළේය. එහෙත් සාක්ෂිකරු කියා සිටියේ සැකකරුවන් වෙනත් විමර්ශන කණ්ඩායම් භාරයේ සිටීම නිසා ප්‍රමාදයක් සිදු වූ බවත්, සංඛ්‍යාත්මක එකතුව නිවැරදිව 369 ක් වූ බවත්, නාමයන් සටහන් වීම ලිඛිත වැරදීමක් බවත්ය.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ විශේෂ අංශයේ එවකට ස්ථානාධිපති ලෙස කටයුතු කළ ප්‍රධාන පොලිස් පරීක්ෂක ලලිත ගීතාංජන දිසානායක මහතාගේ (සාක්ෂි අංක 1958) සාක්ෂියට අනුව, 2019 අප්‍රේල් 21 වන දින සිදුවූ පාස්කු ඉරුදින ත්‍රස්ත ප්‍රහාර මාලාවට අදාළව කොච්චිකඩේ ශාන්ත අන්තෝනි දේවස්ථානයේ සිදුවූ පිපිරීම හා ඒ ආසන්නයේ තිබූ PJ-4080 දරන වෑන් රථයේ පිපිරීම සම්බන්ධ විමර්ශනවලදී පැමිණිල්ල විසින් ප්‍රබල නෛතික හා සාක්ෂිමය පදනමක් ගොඩනගා ඇත. මෙම විමර්ශනයට අනුව කොච්චිකඩේ දේවස්ථානයේ ස්වයංඝාතක බෝම්බකරු ලෙස අලවිදීන් අහමඩ මුවාද් නමැත්තා අනාවරණය කරගෙන ඇති අතර, සිද්ධිය වූ ස්ථානයේ තිබී සොයාගන්නා ලද CCTV දර්ශන, මරාගෙන මැරෙන බෝම්බකරුගේ ශරීර කොටස් සහ අදාළ වෑන් රථය තුළින් හා ඒ ආසන්නයෙන් සොයාගත් විසිරී ගිය රියදුරු බලපත්‍ර කොටස් (අංක B 2692766), වාහන ලියාපදිංචි සහතික සහ අංක තහඩු වැනි නඩු භාණ්ඩ මගින් අපරාධ ස්ථානීය සාක්ෂි (Crime Scene

Evidence) තහවුරු කර ඇත. තවද මුවාද්ගේ නාමික අනන්‍යතාවය ඔහුගේ ඥාතීන් ලවා CCTV දර්ශන පෙන්වා හඳුනාගැනීමෙන් සහ ඩී.එන්.ඒ. (DNA) පරීක්ෂණ මගින් විද්‍යාත්මකව තහවුරු කරගෙන තිබේ.

මෙම විමර්ශනයේ ප්‍රධානතම නෛතික කාරණය ලෙස පෙනී යන්නේ සාක්ෂි ආඥා පනතේ 27(1) වගන්තිය ප්‍රකාරව චූදිතයන් විසින් කරනු ලැබූ ප්‍රකාශ මත පදනම්ව නඩු භාණ්ඩ හා පුපුරන ද්‍රව්‍ය සොයාගැනීමේ නෛතික ක්‍රියාවලියයි. මෙහිදී 3 වන චූදිත වන හයාතු මොහොම්මදු අහමදු මිල්හාන් (2019.06.21 දින ලබාදුන් ප්‍රකාශය) සහ 8 වන චූදිත වන අබ්දුල් මනාෆ් මොහොමඩ් පිරිදවුස් (2019.05.16 දින ලබාදුන් ප්‍රකාශය) යන අය විසින් පොලිසිය හමුවේ තබන ලද ප්‍රකාශවල සහතික කළ උදෘත මගින් මඩකලපුව, කාත්තන්කුඩි සහ ඔල්ලිකුලම් ප්‍රදේශවල සඟවා තිබූ ආයුධ හා පුපුරන ද්‍රව්‍ය පිළිබඳ තොරතුරු අනාවරණය වී ඇත. 2019.06.27 වන දින මෙම සැකකරුවන් දෙදෙනා වෙන් වෙන් වශයෙන් අදාළ ස්ථාන වෙත කැඳවාගෙන ගොස්, ඔවුන්ගේ මගපෙන්වීම යටතේ මොහොමඩ් සිද්ධික් මොහොමදු මෆාස්ට අයත් ඉඩමේ ස්ථාන 7ක් සහ අබ්දුල් රවුෆ්ට අයත් ඉඩමේ ස්ථාන 2ක් නිරීක්ෂණය කර පසුව හෑරීම් සිදුකර ඇත. එහිදී ප්ලාස්ටික් බට සහ බාල්දි තුළ සීල් කර පොළව යට අඩි 3-4ක් ගැඹුරට තිරස් අතට වළදමා තිබූ විදේශීය කඩු 19ක්, මෙරට නිෂ්පාදිත කඩු 11ක්, T56 ජීව උණ්ඩ 475ක් ඇතුළු විවිධ උණ්ඩ, ජෙලටිනයිට්, ඩෙටනේටර් සහ සේවා නූල් වැනි විශාල පුපුරන ද්‍රව්‍ය

ප්‍රමාණයක් සොයාගනු ලැබ ඇති අතර, ඊට පසුදින (ජූනි 28) වැඩිදුර පරීක්ෂාවලදී තවත් කඩු 34ක් (J1 සහ J2 ස්ථානවලින්) සොයාගෙන ඇත.

නීතිමය වශයෙන් සාක්ෂි ආඥා පනතේ 27(1) වගන්තිය යටතේ පොලිස් භාරයේ සිටින සැකකරුවකුගේ ප්‍රකාශයකින් අනාවරණය වන තොරතුරකට අනුරූපව යම් භෞතික නඩු භාණ්ඩයක් සොයාගනු ලබන්නේ නම්, එකී ප්‍රකාශයේ එම සොයාගැනීමට සෘජුවම හේතු වූ කොටස පමණක් අධිකරණය හමුවේ සාක්ෂියක් ලෙස ඉදිරිපත් කිරීමට හැකිවීම මෙහි ප්‍රධාන නෛතික පදනම වේ. ඒ සම්බන්ධයෙන් අප ***Ariyasena and others vs The Attorney General (2004) 2 SLR 360,*** නඩුවේදී ගාමිණී අමරතුංග විනිසුරුතුමාණන් පැහැදිලිව පෙන්වා දී ඇත්තේ *“ in this case the accused were facing serious charges and in the circumstances if they had any innocuous explanation about the manner in which they acquired their knowledge or came to possess those notes one would expect them to give those explanations to exculpate themselves* **".** යන කරුණු කෙරෙහි ද අපගේ අවධානය යොමු කරන ලදී. ඒ අනුව සාක්ෂි ආඥා පනතේ 27 (1) වගන්තිය යටතේ යම් දේපලක් සොයා ගත් විට ඒ දේපල සම්බන්ධයෙන් චූදිතයෙකුට දැනීමක් තිබූ බව විනා ඔහු විසින් වෙනත් පැහැදිලි කිරීමක් අවශ්‍ය නොවූවද ඇතැම් පරිවේශනීය, අවස්ථානුගත කරුණු අනුව පවතින යම් ප්‍රබල කරුණු සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් කිරීමට අසමත්වීම එවැනි චූදිතයෙකුට

එරෙහිව ප්‍රබල පරිවේශනීය සාක්ෂියක් ලෙස එය භාවිතා කළ හැකි බව පෙන්වා දී ඇති අතර**, *Seetin vs Attorney General 68 NLR 316*** නඩුවේදී ද *ඒ බව මනාව පෙන්වා දී ඇත. තවද* ***Nissanka vs. The State (2001) 3 SLR 78****, නඩුවේදී කුලතිලක විනිසුරුතුමාණන් විසින් පෙන්වා දී ඇති "Hence in the attendance circumstances of this case Section 27 statements P6, P7 and P9 consequent to which productions marked P3, P4, P5 and PI were discovered not only embrace the knowledge of the accused and as to these items being hidden in the places from which they were detected but that it was evidence connecting them with the murder".* යන කරුණු කෙරෙහි ද අපගේ අවධානය යොමුකරමින් මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය ඇගැයීමට ලක් කරන ලදී. මෙම සාක්ෂිකරුගේ සක්ෂියට අනුව නඩු භාණ්ඩ නීත්‍යානුකූලව ආරක්ෂිතව තබාගැනීම ලේබල් කිරීම සහ අධිකරණ හඳුනාගැනීමේ ක්‍රියාවලියද මෙහිදී සක්‍රියව ඉටු කර ඇත. සොයාගන්නා ලද සියලුම නඩු භාණ්ඩ දේපළ කුවිතාන්සි (PR/43/2019, PR/194/2019, PR/195/2019 ආදී) යටතේ ඇතුළත් කර, මුද්‍රා තබා මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කර ඇති අතර, රජයේ රසපරීක්ෂක දෙපාර්තමේන්තුව (CF/243/19 සහ CE/316/19) වෙත යොමු කර ඇත. පසුව අතිශය විනාශකාරී ජෙලටිනයිට් සහ පුපුරන ද්‍රව්‍ය, මඩකලපුව මහේස්ත්‍රාත් අධිකරණයේ B/621/2019 නඩුවේ නියෝගයක් ප්‍රකාරව පොලිස් විශේෂ

කාර්ය බලකාය (STF) මගින් 2019.08.30 දින ආරක්ෂිතව නිශ්ක්‍රීය කර/විනාශ කර ඇති අතර, ඒවායේ හිස් ආවරණ සහ බට පමණක් නඩු භාණ්ඩ (පැ.1749) ලෙස අධිකරණයට ඉදිරිපත් කර ඇත. විචෝදනා පත්‍රයට අදාළව මෙම සියලු නඩු භාණ්ඩ (පැ.1726 සිට පැ.1757 දක්වා) අධිකරණය හමුවේ සාක්ෂිකරු විසින් විධිමත්ව හඳුනාගෙන සලකුණු කර ඇත.

විත්තියේ නීතිඥවරුන් සහ චූදිතයන් විසින් නැගූ හරස් ප්‍රශ්නවලදී සහ ඉදිරිපත් කළ නෛතික අභියෝගවලදී ප්‍රධාන කාරණා කිහිපයක් මතුවිය. පලමුව, ප්‍රකාශ ලබාගැනීමේදී චූදිතයන්ගේ භාෂා දැනුමයි; 3 වන සහ 8 වන චූදිතයන්ට සිංහල භාෂාව තේරුම් ගැනීමේ හැකියාව තිබූ බව සාක්ෂිකරු ප්‍රකාශ කළ අතර, බැරෑරුම් අවස්ථාවලදී ද්‍රවිඩ භාෂාව දන්නා නිලධාරීන්ගේ (උප පොලිස් පරීක්ෂක කිශෝර් සහ කාන්තා පොලිස් කොස්තාපල් යාදවී) සහාය ලබාගත් බව පිළිගන්නා ලදී. දෙවනුව, 8 වන චූදිතගේ ප්‍රකාශය (2019.05.16) ලබාගෙන මාසයකට වැඩි කාලයක් (දින 40ක්) ගතවන තෙක් අදාළ ස්ථානයට නොයාමේ ප්‍රමාදය පිළිබඳව විත්තිය ප්‍රශ්න කළ අතර, වෙනත් විමර්ශන කණ්ඩායම් විසින් අදාළ සැකකරු ප්‍රශ්න කිරීම සහ විමර්ශනය කිරීම නිසා එම කාලය ගතවූ බව සාක්ෂිකරු පැහැදිලි කළේය. තුන්වනුව, චූදිතට පහරදීම් හෝ තර්ජනය කිරීම් සිදුකර බිරිඳ සහ සහෝදරයා නිදහස් කරන බවට පවසා බලහත්කාරයෙන් අත්සන් ලබාගත්තේ යැයි විත්තිය කළ යෝජනා සාක්ෂිකරු සම්පූර්ණයෙන්ම

ප්‍රතික්ෂේප කර ඇත.සතරවනුව, සාක්ෂි සටහන්වල සහ දේපළ කුවිතාන්සිවල A සිට I දක්වා ස්ථාන ලකුණු කිරීමේදී මෆාස්ගේ ඉඩම සහ රවුෆ්ගේ ඉඩම පිළිබඳව සිදුවූ ලිපිකරු දෝෂයන් රජයේ අධිනීතිඥවරයාගේ නැවත ප්‍රශ්න කිරීමේදී සාක්ෂිකරු විසින් නීතිමය වශයෙන් පැහැදිලි කර නිවැරදි කර ඇති ආකාරය මෙම සාක්ෂිකරුගෙ සාක්ෂිය මනාව පරික්ෂා කර බැලීමේ දී පෙනී යයි.

ආරක්ෂිත නිවාස සහ පුහුණු මධ්‍යස්ථානයන් ලෙස පවත්වාගෙන ගිය ස්ථාන සම්බන්ධ සාක්ෂි

මෙම නඩුවේ ආරක්ෂිත ස්ථාන, පුහුණු මධ්‍යස්ථාන සහ වැඩමුළු පැවැත්වූ මධ්‍යස්ථාන කිහිපයක් සම්බන්ධව පැමිණිල්ලෙන් සාක්ෂි ඉදිරිපත් කර තිබෙන අතර මෙම මාතෘකාව යටතේ එලෙස ඉදිරිපත් වී තිබෙන සාක්ෂි සළකා බලා ඇති අතර, එම සාක්ෂි විශ්ලේෂණය කර එම සාක්ෂි මත අප විසින් එළඹිය හැකි නිගමනයන් සම්බන්ධවද කරුණු සාක්ච්ඡා කර ඇත.

නුවරඑළිය ශාන්තිපුර පිහිටි නිවාඩු නිකේතනයෙහි පුහුණු වැඩසටහනක් පැවැත්වීමට අදාළ සාක්ෂි

පැ.සා.2229 නුගවෙල පතිරන්නැහැලාගේ තක්ෂිල ඉන්දික් කුමාර සාක්ෂි දෙමින් පවසා සිටියේ, තමා කැළණිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකු

බවත්, රැකියාවක් වශයෙන් දීර්ඝ කාලයක පටන් ව්‍යාපාරික කටයුතු වල යෙදී සිටින බවත්, ප්‍රධාන වශයෙන් එළවළු ව්‍යාපාරයේ නිරත වී සිටින බවත්, තමාගේ ව්‍යාපාර කටයුතු සඳහා නිතරම නුවරඑළිය ප්‍රදේශයට යන බැවින් 2018 කාල වකවානුවේදී නුවරඑළිය ශාන්තිපුර ප්‍රදේශයේ දෙමහල් ගොඩනැගිල්ලකින් යුත් නිවාඩු නිකේතනයක් මිළදී ගත් බවත්, මිළදී ගන්නා අවස්ථාවේදී එම ගොඩනැගිල්ල සම්පූර්ණ කර නොතිබූ ගොඩනැගිල්ලක් බවත්, අංක 01/56, ශාන්තිපුර, නුවරඑළිය ලිපිනයේ පිහිටි එම ස්ථානය තමා විසින් අවුරුදු 08 ක් තිස්සේ අලුත්වැඩියා කිරීම් සිදු කර සම්පූර්ණ කළ බවත්, මිළදී ගත් පසු එම නිවාඩු නිකේතනය නුවරඑළිය ප්‍රදේශයට පැමිණෙන සංචාරකයින් සඳහා කුලී පදනම මත ලබා දුන් බවත්, ඒ සම්බන්ධව Ikman.lk වෙබ් අඩවියේ දැන්වීමක් පළකර තිබූ බවත්, තමාගේ නිවාඩු නිකේතනය අවශ්‍ය පුද්ගලයන් තමාට දුරකථනයෙන් අමතා එය වෙන් කරවා ගන්නා බවත්, සාමාන්‍යයෙන් වෙන් කිරීමක් සිදුකරන අවස්ථාවේදී තමාගේ ගිණුමට අත්තිකාරම් මුදලක් තැන්පත් කරන බවත්, ඉතිරි මුදල නිවාඩු නිකේතනයේ නිවාඩුව ගත කිරීමෙන් පසුව ඒ ස්ථානය භාරව කටයුතු කිරීම සඳහා තමා විසින් පත් කර සිටින තැනැත්තාට ලබා දෙන බවටත් පවසා සිටී.

2018 අප්‍රේල් මාසයේදී තමාගේ අංක 071-8510539 දරන ජංගම දුරකථනයට පුද්ගලයෙකු අමතා කිහිපදෙනෙකු වෙනුවෙන් දින තුනක්

සඳහා තමාගේ නිවාඩු නිකේතනය වෙන් කරවා ගත් බවත්, ඒ සඳහා රුපියල් 10,000/- ක අත්තිකාරම් මුදලක් තමාගේ අංක 6696262 දරණ ලංකා බැංකු ගිණුමට බැර කළ බවත්, පසුව 2018 මැයි මස මුල් කාලයේදී පුද්ගලයන් කිහිපදෙනෙක් තමාගේ නිවාඩු නිකේතනයට ගොස් තිබූ බවත්, ඒ බව එවකට නිවාඩු නිකේතනය බලා ගත් රංග යන අය විසින් තමාට දැනුම් දුන් බවත්, එම පුද්ගලයන් එසේ පැමිණ නිවාඩු නිකේතනය වෙන්කරවා ගැනීම දින 07 කට දීර්ඝ කර ගත් බවත්, ඔවුන් පැමිණ දින 02 ක් හෝ 03 කට පසුව රංග තමාට දුරකථනයෙන් අමතා පැමිණ සිටින පිරිස් සාමාන්‍ය සංචාරකයන් මෙන් නොහැසිරෙන බවත්, ඔවුන් පිටතට නොගොස් නිවාඩු නිකේතනය තුළම සිටින බවත්, ඒ සම්බන්ධයෙන් තමාට දැඩි සැකයක් පවතින බවට පැවසූ බවත්, ඒ පිළිබඳව පොලිසියට දැනුම් දෙන ලෙසට තමා රංගට උපදෙස් ලබා දුන් බවත්, ඉන්පසුව රංග විසින් ඒ බව පොලිසියට දැනුම් දුන්නද පොලිසියෙන් ඒ සම්බන්ධව සොයා බැලීමට නොපැමිණි බවත්, ඉන්පසු ඒ අවට සිටින ඉලේසිංහ අංකල් යන තැනැත්තා 119 දුරකථන අංකයට අමතා ඒ පිළිබඳව පොලිසියට දැන්වූ බවත්, ඉන්පසුව පොලිසිය විසින් පරීක්ෂා කිරීම සඳහා තමාගේ නිවාඩු නිකේතනයට පැමිණි බව රංග විසින් තමාට දැනුම් දුන් බවත්, එම ස්ථානය පරීක්ෂා කරන අවස්ථාවේදී එම ගොඩනැගිල්ල තුළට ඇතුල් වීමට පොලිස් නිලධාරීන් තමාට අවසර නොදුන් බවට රංග තමාට පවසා සිටි බවත්, එම

සිද්ධියත් සමඟ එම පැමිණි පිරිස නිවාඩු නිකේතනයෙන් පිටව ගිය බවටත් සාක්ෂිකරු විසින් පවසා සිටින ලදි.

තවද, තමාගේ අංක 6696262 දරන ලංකා බැංකු ගිණුමට අදාළ 2016.08.11 සිට 2019.05.27 දක්වා වූ ගිණුම් වාර්තා සාක්ෂිකරු විසින් හඳුනා ගත් අතර, පැමිණිල්ල විසින් එම වාර්තාව පැ.808 වශයෙන් ලකුණු කරන ලදි. තවද තමාගේ 071-8510539 දරන දුරකථනයට අදාළ 2018.04.01 සිට 2018.06.30 දක්වා වූ දුරකථන විස්තර වාර්තාවද සාක්ෂිකරු හඳුනාගත් අතර, එම වාර්තාවද පැමිණිල්ල විසින් පැ.809 වශයෙන් ලකුණු කරන ලදි.

මෙම සාක්ෂිකරු 05 සහ 09 වන චූදිතයන් විසින් හරස් ප්‍රශ්න වලට භාජනය කළ අතර, හරස් ප්‍රශ්නවලදී සාක්ෂිකරු පවසා සිටියේ තමාට දුරකථනයෙන් කතා කර තමාගේ නිවාඩු නිකේතනය වෙන් කරවා ගත් පුද්ගලයා තමා හඳුනන්නේ නැති බවත්, එලෙස තමාගේ නිවාඩු නිකේතනය වෙන් කරවා ගෙන නිවාඩු නිකේතනයේ දවස් කීපයක් නැවතී සිටි පුද්ගලයින්වත් තමා හඳුනන්නේ නැති බවත් ය. 05 වන චූදිතගේ හරස් ප්‍රශ්නවලදී ඌණතා 03 ක් අධිකරණයේ අවධානයට යොමු කරන ලද අතර, එයින් පළවෙනි ඌණතාවය වූයේ සාක්ෂිකරු විසින් අදාළ කාලයේදී තමාගේ නිවාඩු නිකේතනයේ නැවතී සිටි කණ්ඩායම් සම්බන්ධව එවකට එම නිවාඩු නිකේතනය බලා ගත් රංග විසින් පොලිසියට දැනුම් දුන්නද පොලිසිය ඒ සම්බන්ධව සොයා බැලීමට නිවාඩු නිකේතනයට නොපැමිණි

බවට පවසා සිටියද ඒ සම්බන්ධව සාක්ෂිකරු විසින් ත්‍රස්ත මර්ධන සහ විමර්ශන කොට්ඨාශයට කරන ලද ප්‍රකාශ වල එවැනි කිසිදු කරුණක් පවසා නොමැති බවය. දෙවන ඌණතාවය වූයේ සාක්ෂිකරු විසින් මෙම අධිකරණයේ පවසා සිටින ලද ආකාරයට තමාගේ නිවාඩු නිකේතනය අවට සිටි ඉලේසිංහ අංකල් යන තැනැත්තා විසින් 119 දුරකථන අංක මාර්ගයෙන් පොලිසියට මේ සම්බන්ධයෙන් දැනුම් දුන් බව කියා සිටියද, අදාළ කරුණ සම්බන්ධයෙන් සාක්ෂිකරු විසින් ත්‍රස්ත මර්ධන සහ විමර්ශන කොට්ඨාශයට කරන ලද ප්‍රකාශ වල එවැනි කිසිදු සඳහනක් නොමැති බවය. තුන්වන ඌණතාවය වුයේ සාක්ෂිකරු මෙම අධිකරණයේ සාක්ෂි දෙමින්, පොලිස් කණ්ඩායමක් තමාගේ නිවාඩු නිකේතනයට පැමිණ එහි නැවතී සිටි පුද්ගලයන් සම්බන්ධව සොයා බැලීමේදී නිවාඩු නිකේතනයට ඇතුළු වීමට ඔහුට අවසර ලබා නොදුන් බවට රංග විසින් තමාට පැවසු බවට සාක්ෂි ලබා දෙමින් කියා සිටියද, ඒ සම්බන්ධයෙන් කිසිදු සඳහනක් මෙම සාක්ෂිකරු විසින් ත්‍රස්ත මර්ධන සහ විමර්ශන කොට්ඨාශයට කරන ලද ප්‍රකාශ වල පවසා නොමැති බවය.

පැ.සා.1389 රංග ඉන්දික වීරසිංහ යන අය සාක්ෂි ලබා දෙමින් කියා සිටියේ, 2018.2019 කාලවකවානුවේදී තමා පදිංචි වී සිටි නිවස අවට තක්ෂිල කුමාර යන අයට අයත් නිවාඩු නිකේතනයක් තිබූ බවත් තක්ෂිල Holiday Bungalow නමින් හඳුන්වන එම නිවාඩු නිකේතනය තමා විසින්

ඒ කාලයේදී බලා ගත් බවත් සංචාරකයන් පැමිණ එම නිවාඩු නිකේතනයේ නැවතී සිටි බවත්, එසේ පැමිණෙන සංචාරකයන් පැමිණීමට පෙර එම නිවාඩු නිකේතනය වෙන් කරවා ගන්නා බවත්, ඒ කාලවකවානුවේ දිනකදී පුද්ගලයන් හතර දෙනෙකු පැමිණ නිවාඩු නිකේතනය බලා ඉන්පසු එය වෙන් කරවා ගෙන කිහිපදෙනෙකු පැමිණ නැවතී සිටි බවත්, සාමාන්‍යයෙන් පුද්ගලයන් 17 දෙනෙකු පමණ වාහන 03 කින් පැමිණි බවත්, ඔවුන් නැවතී සිටි කාලයේදී නිවාඩු නිකේතනයෙන් පිටතට නොගිය බවත්, තමාට එම නිවාඩු නිකේතනයට ඇතුල් වීමටද ඉඩ ලබානොදුන් බවත්, ඉන්පසුව දින 03 ක් යන විට තමාට ඔවුන් සම්බන්ධයෙන් සැකයක් ඇති වූ බවත්, ඒ සම්බන්ධයෙන් තමා එම නිවාඩු නිකේතනයේ හිමිකරුට දන්වා 119 හදිසි දුරකථන ඇමතුම් මඟින් පොලිසියට දැනුම් දීමක් කළ බවත්, නමුත් පොලිසියෙන් කිසිවෙකු නොපැමිණි හෙයින් ඒ අවට පදිංචි වී සිටි ඉලේසිංහ නමැති තැනැත්තා මාර්ගයෙන් DIG කාර්යාලයට මේ සම්බන්ධයෙන් දැනුම් දුන් බවත්, ඉන්පසු පොලිසියෙන් පැමිණ එම නිවාඩු නිකේතනය පරීක්ෂා කළ බවත්, පොලිසියෙන් පැමිණෙන අවස්ථාවේදී තමා එම ස්ථානයේ නොසිටි බවත් ඉන්පසු තමා පැමිණි පසු පොලිස් නිලධාරීන් තමා අමතා එම ස්ථානයට පැමිණෙන ලෙසට දැනුම් දුන් බවත් එම නිවාඩු නිකේතනයට පැමිණෙන අවස්ථාවේදි එහි ඉන්ද්‍රජිත් යන තමා හඳුනන පොලිස් නිලධාරීයෙකු සිටි බවත් නැවතී සිටි සියලු දෙනාගේම හැඳුනුම්පත් රැගෙන ඊට පසු දින පොලිස් ස්ථානයට පැමිණෙන ලෙසට

ඔවුන්ට අවවාද කර පොලිස් නිලධාරීන් පිටත් වූ බවත් එම සිද්ධිය සිදුවීමෙන් පසුව එදිනම එම පිරිස නිවාඩු නිකේතනයෙන් පිටත් වී ගිය බවත් එම පිරිස පිටත් වූවායින් පසුව තමා නිවාඩු නිකේතනය පරීක්ෂා කරන අවස්ථාවේදී එහි තිබූ බුදු පිළිමයන් දෙක අනෙක් පසට හරවා තිබූ බවට තමා නිරීක්ෂණය කළ බවටත් සාක්ෂි ලබා දෙන ලදි.

මෙම සාක්ෂිකරු 05 වන චූදිත විසින් හරස් ප්‍රශ්න වලට භාජනය කරන ලද අතර, හරස් ප්‍රශ්නවලදී මෙම සාක්ෂිකරුගේ පොලිස් ප්‍රකාශය අසුරින් 5D-1 ලෙස ලකුණු කරන ලදි. එනම්, මෙම අධිකරණයේ සාක්ෂි දෙමින් සාක්ෂිකරු පවසා සිටියේ අදාළ පිරිස නිවාඩු නිකේතනයෙන් පිටත් වූවායින් පසුව එහි තිබූ බුදු පිළිමයක් කඩා දමා තිබූ බවය. කෙසේ වුවද ඔහු විසින් ත්‍රස්ත මර්ධන හා විමර්ශන කොට්ඨාශයේ නිලධාරීන් හට ලබා දුන් ප්‍රකාශයේ, ‘‘ තබා තිබූ බුදුපිළිම වහන්සේලා දෙනම මූණින් අතට හරවා තිබුනා’’ යනුවෙන් සඳහන් කර ඇති අතර එය 5D-1 ලෙස ලකුණු කරන ලද අතර සාක්ෂිකරු අධිකරණයේ පවසා ඇත්තේ එම පිරිස පිටත් වීමෙන් පසුව එම නිවාඩු නිකේතනයේ තිබූ බුදු පිළිම 02 න් එකක් අතුරුදහන් වී ඇති බවට සඳහන් කර ඇති බවය.

නුවරඑළිය, ශාන්තිපුර පිහිටි නිවාඩු නිකේතනයෙහි පුහුණු වැඩසටහනක් පැවැත්වීමට අදාළ සාක්ෂි විශ්ලේෂණය සහ නිගමනය

ඉහත පරිදි නුවරඑළිය, ශාන්තිපුර ප්‍රදේශයේ අංක 01/56 යන ලිපිනයේ පිහිටි නිවසක් සම්බන්ධව පැමිණිල්ල විසින් සාක්ෂි ඉදිරිපත් කර ඇත. එම නිවස පැ.සා.2229 තක්ෂිල ඉන්දිත් කුමාර යන අයට අයත් නිවසක් වන අතර, වර්ෂය 2018 වන විට එය නිවාඩු නිකේතනයක් ලෙස පවත්වාගෙන ගොස් ඇත. 2018 අප්‍රේල් මස දිනකදී එම නිවාඩු නිකේතනයේ හිමිකරු වන තක්ෂිල ඉන්දිත් කුමාර යන අයට පුද්ගලයෙකු අමතා එම නිවාඩු නිකේතනය වෙන් කරවා ගෙන තිබූ අතර පසුව 2018 මැයි මස මුල් කාලයේදී පුද්ගලයින් 17 දෙනෙකු පමණ වාහන 03 කින් පැමිණ එම ස්ථානයේ නැවතී සිට ඇති අතර, සාමාන්‍යයෙන් නුවරඑළිය ප්‍රදේශයේ නිවාඩුව ගත කිරීමට පැමිණෙන සංචාරකයන් මෙන් හැසිරීමකින් තොරව ඔවුන් පිටතට නොගොස් නිවාඩු නිකේතනය තුළම නැවතී සිට ඇති අතර, ඒ කාලය වන විට එම නිවාඩු නිකේතනය බලා ගත් එකී භාරකරු පැ.සා.1389 රංග ඉන්දික වීරසිංහ යන අයට එම නිවාඩු නිකේතනය තුළට ඇතුළු වීමට හෝ ඉඩ ලබා දී නොමැති බැවින් එම පුද්ගලයන්ගේ ක්‍රියා කලාපය සම්බන්ධයෙන් රංග ඉන්දික වීරසිංහ යන අයට දැඩි සැකයක් ඇති වී තිබෙන අතර, ඒ සම්බන්ධව ඔහු එම නිවාඩු

නිකේතනය හිමිකාර ඉන්දික් කුමාර යන අයට දැනුම් දී ඔහුගේ උපදෙස් මත පොලිසියට ඒ සම්බන්ධයෙන් දැනුම් දී ඇත. එලෙස දැනුම් දීමෙන් පසුව නුවරඑළිය පොලිසියේ නිළධාරීන් කීපදෙනෙකු පැමිණ නිවාඩු නිකේතනය සහ එහි නැවතී සිටි පුද්ගලයන් පරීක්ෂා කර ඇති බවටත් කරුණු අනාවරණය වී තිබේ.

පොලිස් නිළධාරීන් එම නිවාඩු නිකේතනය සහ එම පුද්ගලයන් පරීක්ෂාවට ලක් කිරීමෙන් පසුව ඔවුන් තවදුරටත් එම ස්ථානයේ රැඳී නොසිට පිටත්ව ගොස් ඇත. ඔවුන් පිටත් වීමෙන් පසුව එම නිවාඩු නිකේතනය තුළ තිබූ බුදුපිළිම 02 ක් අනෙක් පසට හරවා තිබූ බවට නිවාඩු නිකේතනය බලා ගත් එකී භාරකරු පැ.සා.1389 රංග ඉන්දික වීරසිංහ යන අයට නිරීක්ෂණය වී ඇත.

මෙම අධිකරණයේ සාක්ෂි දුන් ඉහත සඳහන් සාක්ෂිකරුවන් දෙදෙනාගේ සාක්ෂි අනුව පෙනී යන කරුණක් වන්නේ, අදාළ නිවාඩු නිකේතනය ඉහත පරිදි වෙන්කරවාගෙන සිට ඇති පුද්ගලයන් සාමාන්‍යයෙන් නිවාඩු ගත කිරීමට පැමිණෙන සංචාරකයන් ලෙස මෙම නිවාඩු නිකේතනය දවස් 07 කට වෙන් කරවා ගෙන තිබුණද, එම තැනැත්තන් සාමාන්‍ය සංචාරකයන් ලෙස හැසිරී නොමැති බවත්, එනම්, පිටතට ගොස් නිරීක්ෂණය කිරීම් හෝ විනෝද වීම් කිසිවක් නොමැතිව එම නිවාඩු නිකේතනය තුළම රැඳී සිට ඇති අතර, පිටත පුද්ගලයන් එම නිවාඩු

නිකේතනය තුළට පැමිණීම හෝ තමන්ගේ ක්‍රියා කලාපයන් පිටත අයවළුන් දැකීම හෝ නිරීක්ෂණය කිරීම වළක්වා ගැනීමට ඔවුන් කටයුතු කර ඇති බවයි.

මෙම නඩුවේ සාක්ෂි ලබා දී ඇති පැමිණිල්ලේ සාක්ෂි අංක 1400 අබ්දුල් ජබාර් මොහොමඩ් අනස් යන සාක්ෂිකරුද තම සාක්ෂියේදී මෙම නිවාඩු නිකේතනය සම්බන්ධයෙන් සඳහන් කර ඇති අතර, ඔහුගේ සාක්ෂියේදී පවසා සිටියේ, 2018 අප්‍රේල් හෝ මැයි මස කාලයේ දිනකදී තමා ඇතුළු පුද්ගලයින් කිහිප දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් වැන් රථ 02 කින් මාවනැල්ල ප්‍රදේශයෙන් පිටත් වී නුවරඑළිය ශාන්තිපුර ප්‍රදේශයේ පිහිටි නිවාඩු නිකේතනයක් ලෙස පවත්වාගෙන ගිය දෙමහල් නිවසකට ගිය බවත්, එලෙස තමන්ලාව නුවරඑළියට රැගෙන යනු ලැබුවේ මෙම නඩුවේ 04 වන චූදිත බවත්, එම නිවාඩු නිකේතනයට යන විටත් එහි තවත් පුද්ගලයින් කිහිපදෙනෙකු සිටි බවත්, තමන්ලාත් සමඟ පුද්ගලයන් 20 ක් හෝ 25 දෙනෙකු එහි නැවතී සිටි බවත්, එම නිවාඩු නිකේතනයේ රාත්‍රී 02 ක් ගත කර ඉන්පසු එයින් පිටත් වූ බවත් ය. තවද, මෙම නඩුවේ 05 වන චූදිතද එහි සිටි බවත්, එම ස්ථානයේ සිටි පුද්ගලයන් සමඟ එකිනෙකා ආමන්ත්‍රණය කරනු ලැබුවේ ‘අබු’ නම් වලින් බවත්, ‘අබු සෙයිදි’ යනුවෙන් හඳුන්වනු ලැබූ මෙම නඩුවේ 01 වන චූදිත වන නවුෆර් මවුලවි යන අය සහ , ‘අබු හදීත්’ ලෙස හඳුන්වනු ලැබූ මෙම නඩුවේ 02 වන චූදිත වන ගෆූර් අංකල් යන අය සහ ‘අබු හිනා’ ලෙසට හැඳන්වූ මෙම නඩුවේ 15

වන චූදිත වන මොහොමඩ් හනීෆා සෙයිනුල් ආබ්දීන් යන අය සහ මෙම නඩුවේ 05 වන චූදිත තැනැත්තා එහි සිටි බවත් ය. තවද, 'අබු සිලා' නමින් හැඳින්වූ මිල්හාන් යන තැනැත්තෙකු සිටි බවත්, දැනට ඔහුව හඳුනා ගැනීමට හැකියාවක් නොමැති බවටත් පවසා ඇත. එහි 'අබු මුහාරිබ්' ලෙස හැඳින්වූ සහරාන් යන තැනැත්තා සහ 'අබු මොහොම්මත්' ලෙස හැඳින්වූ හස්තූන් යන තැනැත්තාද සිටි බවත්, ඔවුන් දෙදෙනා මරාගෙන මැරෙන බෝම්බකරුවන් ලෙස බෝම්බ පුපුරවාගෙන මිය ගිය බවට තමා දැන ගත් බවටත් මෙම සාක්ෂිකරු කියා ඇත. තවද, එම තැනැත්තන්ගේ සත්‍ය නම් ඒ වන විට තමා දැන නොසිටි බවත්, පසුව මෙම නඩුවට අදාළ පොලිස් විමර්ශනයේදි අබු නමින් හැඳින්වූ එම තැනැත්තන්ගේ ඇත්ත නම් දැන ගත් බවටත් මෙම සාක්ෂිකරු සාක්ෂි දෙමින් අධිකරණයට පවසා ඇත. ඒ අනුව ඉහත කී නිවාඩු නිකේතනයේ නවාතැන්ගෙන සිට ඇති පුද්ගලයින් වන්නේ ස්වයංඝාතක බෝම්බකරුවෙකු වන සහරාන් ඇතුළු පිරිසක් වන අතර මෙම සාක්ෂිකරු විසින් හඳුනාගන්නා ලද සහ විස්තර කර ඇති මෙම නඩුවේ ඉහත කී චූදිතයින්ද එම වැඩමුළුවට සහභාගි වී ඇති බව ඒ අනුව මැනවින් සනාථ වේ.

පැ.සා.2229 ඉන්දික් කුමාර යන සාක්ෂිකරුගෙන් 05 වන චූදිත විසින් හරස් ප්‍රශ්න ඇසීමේදී උෂ්ණතා 03 ක් අධිකරණයේ අවධානයට යොමු කරන ලද අතර, එම උෂ්ණතා 03 ම අදාළ කාලයේදී එකී නිවාඩු නිකේතනයේ නැවතී සිටි පුද්ගලයින් සම්බන්ධයෙන් එම නිවාඩු

නිකේතනය බලා ගත් රංග යන සාක්ෂිකරුට සැකයක් මතු වී ඒ සම්බන්ධව පොලිසියට දැනුම් දුන් ආකාරයට අදාළ ඌණතා වේ. කෙසේ වෙතත්, රංග යන එම නිවාඩු නිකේතනයේ නැවතී සිටි පුද්ගලයන් සම්බන්ධයෙන් පොලිසියට දැනුම් දුන් බව සහ එම දැනුම් දීම පරිදි නුවරඑළිය පොලිසියට අනුයුක්ත නිළධාරීන් එම ස්ථානයට පැමිණ නිවාඩු නිකේතනය සහ එහි සිටි පුද්ගලයන් පරීක්ෂා කළ බවට මෙම නඩුවේ 04 වන චූදිත විසින් විත්තියේ සාක්ෂිකරුවකු ලෙස කැඳවන ලද ඇල්ල පොලිස් ස්ථානයේ පො.කො.76735 කපිල බණ්ඩාර නිළධාරියාගේ සාක්ෂියෙන්ද හෙළිවන අතර, එම කරුණු විත්තිය විසින්ද අභියෝගයට ලක් නොකරන ලදි. ඒ අනුව එකී ඌණතාවයන් මෙම නඩුවේ සැළකිය යුතු ඌණතාවයන් ලෙසට අපහට පෙනී යන්නේ නැත.

මෙම නඩුවේ 01 වන චුදිත වන මොහොම්මදු ඊබ්‍රාහිම් මොහොම්මදු නවුෆර් යන අය විසින් සහකාර පොලිස් අධිකාරි විජිත පෙරේරා යන අයට 2020.09.11 දින දමිළ භාෂාවෙන් ලබා දී ඇති පාපොච්චාරණයේ සිංහල භාෂා පරිවර්තනය පැමිණිල්ල විසින් පැ.803(A) ලෙස ලකුණු කර ඇති අතර, එම ලේඛණයේ පැ.803(A2) (10) ලෙස ලකුණු කර ඇති පහත සඳහන් කොටස අන්තර්ගත වී ඇත.

“මා ඇතුළු NTJ සංවිධානයේ ප්‍රධානීන් විසින් නුවරඑළියේ ශාන්තිපුර සහ බ්ලැක්පූල්, මහනුවර, හම්බන්තොට යන ප්‍රදේශවල දින

දෙකක work shop (වැඩමුළු) පැවැත්වූ අතර එක් එක් කඳවුර සඳහා 15-20 දෙනෙකු පමණ සහභාගී වූහ. මා සහ සහරාන් පුහුණුවට සහභාගීවන්නන්ට එනම් මම ආගමික කරුණු සම්බන්ධවත්, IS සංවිධානය සම්බන්ධවත් දේශන පැවැත්වූවෙමි. සහරාන්ද ඒ අයුරෙන්ම ඉස්ලාමීය අරගලයේ ඉතිහාසය සහ ජාත්‍යන්තර මට්ටමින් මුස්ලිම් ජනතාවට සිදුව ඇති ගැටලු සම්බන්ධවත් දේශන කළේය.සමහර තැන්වලදී වීඩියෝ මඟින් ගෝලීය මට්ටමෙන් මුස්ලිම් ජනතාවට සිදුවී ඇති ගැටලු සම්බන්ධවත්, IS සංවිධානයට අදාළ වීඩියෝ දර්ශනත් අපි ප්‍රදර්ශනය කළෙමු.දුරකතන භාවිතය සම්බන්ධවත්, පිහියෙන් පහරදීම සහ ආයුධ සම්බන්ධවත් කස්තූන් පුහුණුව ලබාදුන්නේය.එම වැඩසටහන් සඳහා සාෆික්, මිල්හාන්, සාජිත්, සාදික් යන අයද සහභාගි වූහ.එහිදී අබූ යන නම් තබන ලදි.ඒ අනුව එම සංවිධානය විසින් මට අබූ ෂෙයිඩ් යන නම තබන ලදි. මම work shop (වැඩමුළු) 09කට වගේ සහභාගී වුණෙමි.”

ඒ අනුව නුවරඑළිය වැඩමුළුවේ දී සැබැවින්ම අන්තවාදී ක්‍රියාකාරකම් හා සම්බන්ධ ක්‍රියාවන් සිදු වී ඇති බව මනාව පැහැදිලි වේ.

මෙම නඩුවේ 15 වන වූදිත වන මොහොමඩ් හනීෆා සෙයිනුල් ආබ්දීන් යන අය විසින් මහේස්ත්‍රාත් උපුල් රාජකරුණා මහතාට අපරාධ නඩු විධාන සංග්‍රහයේ 127 වගන්තිය ප්‍රකාරව ලබා දී ඇති

පාපොච්චාරණමය ප්‍රකාශයේ (2019.11.01 වන දින) පහත සඳහන් කොටස් අන්තර්ගත වී ඇත.

" නුවරඑළිය ශාන්තිපුර කියන තැන දේශනාවකට ගියා මම. ඒ දේශනාව උදේ 9.00 ට විතර පටන් ගත්තා. ඒ පටන් ගනිද්දි ----- ---------- ඇවිත් හිටියා "

ඒ අනුව ද ඉහත කී 15 වූදිත ද නුවරඑළිය ශාන්තිපුර වැඩමුළුවට සහභාගී වී ඇති බව පෙනී යයි.

මෙම අධිකරණයේ ඉදිරිපත් වී තිබෙන සාක්ෂි සම්පූර්ණයෙන් විශ්ලේෂණය කිරීමේදී අපහට පෙනී යන්නේ, නුවරඑළිය ශාන්තිපුර ප්‍රදේශයේ අංක 01/56, දරණ ලිපිනයේ පිහිටි නිවාඩු නිකේතනයක් ලෙස පවත්වාගෙන ගිය නිවසේ මෙම නඩුවේ 01,02,04,05 යන චූදිතයන් සහ 2019.04.21 වන දින ෂැන්ග්‍රිලා හෝටලයේ සිදුවූ බෝම්බ පිපිරීමේදී ස්වයංඝාතක බෝම්බකරුවකු ලෙස බෝම්බ පුපුරවා ගත් සහරාන් යන අයත්, කටුවාපිටිය ශාන්ත සෙබස්තියන් දේවස්ථානයේ ස්වයංඝාතක බෝම්බකරුවකු ලෙස බෝම්බය පුපුරවා ගත් හස්තූන් යන අය සහ මෙම නඩුවේ 01,02,04,05 සහ 15 යන චූදිතයින්ද තවත් පුද්ගලයන් කිහිපදෙනෙකු සමඟ නැවතී සිට ඇති අතර, ඔවුන් සූක්ෂම ලෙස සංවිධානය වී යම් වරදක් කිරීමට සූදානම් වීම පිණිස හෝ සැලසුම් කිරීම පිණිස IS සංවිධානයේ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන්, අවිආයුධ පාවිච්චි

කිරීම සම්බන්ධයෙන් සහ පිහි වලින් පහර දීම සම්බන්ධයෙන් අවබෝධයක් සහ පුහුණුවක් ලබා ගෙන ඇති බවත්, එවැනි ක්‍රියාකාරකම් වලට මෙම නිවස භාවිතා කර ඇති බවත්ය. තවදුරටත් පෙනී යන්නේ, මෙකී ක්‍රියාවලියන්හි මෙම නඩුවේ 01,02,04,05 සහ 15 වූදිතයන් දැනට මියගොස් සිටින ඉහත සඳහන් කර ඇති ස්වයංඝාතක බෝම්බකරුවන් වන සහරාන්, හස්තූන් සහ තවත් පුද්ගලයන් සමඟ යම් ක්‍රියාවක් සිදු කිරීම පිණිස සංවිධානය වී එක කණ්ඩායමක් ලෙස කටයුතු කර ඇති බවටය.

තවද පැ.සා.1389 රංග ඉන්දික වීරසිංහ යන සාක්ෂිකරුගේ පොලිස් ප්‍රකාශය ආශ්‍රයෙන් 5(D)(1) ලෙස ඉහතින් අප සඳහන් කල පරස්පරතාවය ලකුණු කර තිබුනද මෙහිදී වැදගත් වන්නේ, එම ස්ථානයේ බුදු පිළිම සැබැවින්ම තිබුණාද යන්න වන අතර එලෙස බුදු පිළිම කඩා දමා තිබීමක් හෝ අතුරුදහන් වීමක් යන්න මෙහිදී වැදගත් වන්නෙ නැත. ඒ අනුව ඉහත කී පරස්පරතාවය මගින් එම සාක්ෂිකරුගේ සාක්ෂියෙහි විශ්වාසනීයභාවය සම්බන්ධයෙන් සැකයක් අප හට පෙනී යන්නේ නැත.

<u>නො:01/81 රුවන්එළිය, නුවරඑළිය බ්ලැක්පූල් ප්‍රදේශයේ පිහිටි Blue eye–in නිවාඩු නිකේතනයෙහි පුහුණු වැඩසටහනක් පැවැත්වීමට අදාළ සාක්ෂි</u>

පැ.සා.1391 නීටා කාමලින් මාකන්ටිස් ටයිමිස් යන අය සාක්ෂි දෙමින් කියා සිටියේ, නො:01/81 රුවන්එළිය, නුවරඑළිය ලිපිනයේ තමාට අයත් දෙමහල් ගොඩනැගිල්ලක් තිබූ බවත්, එම ගොඩනැගිල්ල නිවාඩු නිකේතනයක් ලෙස පවත්වාගෙන යාම සඳහා 2018 ජූනි මස සිට අවුරුදු 02 ක කාලයක් සඳහා සුනිල් කුලරත්න යන අයට කුලී පදනම මත ලබා දී තිබූ බවත්, ඔහු විසින් එම ගොඩනැගිල්ලේ නිවාඩු නිකේතනයක් පවත්වාගෙන ගිය කාලයේදී යම් දිනක පොලිසිය විසින් එම ගොඩනැගිල්ල පරීක්ෂා කළ බවත්, එකී සුනිල් කුලරත්න යන අයව පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන රැගෙන ගොස් තිබෙන බවට තමා දැනුවත් වූ බවත් කියා සිටින ලදි.

මෙම සාක්ෂිකාරියගෙන් සියළුම චූදිතයන් වෙනුවෙන් හරස් ප්‍රශ්න අසා නොමැත.

පැ.සා.1390 නිකපිටිය කැකිරිගොඩ ගෙදර සුනිල් කුලරත්න යන අය සාක්ෂි දෙමින් පවසා සිටියේ, තමා සංචාරක ව්‍යාපාර කටයුතු වල යෙදී සිටින බවත්, 2018 කාලවකවානුවේ නුවරඑළිය බ්ලැක්පූල් ප්‍රදේශයේ Blue

eye–in නමින් සංචාරක හෝටලයක් පවත්වාගෙන ගිය බවත්, එම ගොඩනැගිල්ල නීටා යන මහත්මියට අයත් ගොඩනැගිල්ලක් බවත්, නිවාඩු නිකේතනයක් පවත්වාගෙන යාම සඳහා එම ගොඩනැගිල්ල අවුරුදු 02 ක කාලසීමාවක් සඳහා තමා විසින් කුලී පදනම මත ලබා ගත් බවත්, එය කාමර 04 කින් යුත් දෙමහල් ගොඩනැගිල්ලක් බවත්, එම හෝටලයේ කාමර කුලී පදනම මත සංචාරකයන් සඳහා ලබා දුන් බවත්, එසේ නැවතීම සඳහා පැමිණෙන සංචාරකයන්ගේ තොරතුරු සටහන් කර ගැනීමට පොතක් පවත්වාගෙන ගිය බවටත් පවසා සිටිමින් සාක්ෂිකරු විසින් එම පොත විවෘත අධිකරණයේදී හඳුනා ගන්නා ලද අතර, පැමිණිල්ල විසින් එම පොත පැ.811 වශයෙන් ලකුණු කරන ලදි. තවදුරටත් සාක්ෂි දෙමින් සාක්ෂිකරු පවසා සිටියේ, එලෙස නිවාඩු නිකේතනය පවත්වාගෙන යන කාලයේ දිනකදී පුද්ගලයන් දෙදෙනෙක් මෝටර් සයිකලයකින් ආ බවත් ඔවුන් ගම්පොල ප්‍රදේශයේ සිට පැමිණෙන බව පවසමින් නිවාඩු නිකේතනය 2018.10.05 දින සිට දින 03 ක් සඳහා වෙන් කළ බවත් අදාළ දින තුනෙහි කීපදෙනෙකු පැමිණ එහි නැවතී සිටි බවත්, ඒ සම්බන්ධ තොරතුරු තමා පැ.811 දරන පොතෙහි සඳහන් කර තිබෙන බවත්, එම තොරතුරු අඩංගු පිටුව සාක්ෂිකරු විසින් අධිකරණයට පෙන්වා සිටිමින් විවෘත අධිකරණයේ හඳුනා ගත් අතර, පැමිණිල්ල විසින් එම පිටුව පැ.811 (B) ලෙසද, එම පිටුවේ සාක්ෂිකරු විසින් දමා තිබෙන සටහන් පැ811 (B) (a) ලෙසද ලකුණු කරන ලදි. තවද, කලින් නිවාඩු නිකේතනය වෙන් කරන

ලද එම පුද්ගලයන් නැවතත් 2018.11.16 දින සිට දවස් 03 ක් සඳහා වෙන් කළ බවත් එම දිනයේද පුද්ගලයන් කිහිපදෙනෙක් පැමිණ නැවතී සිටි බවත්, ඊට අදාළ තොරතුරුද පැ.811 දරන පොතේ තමා විසින් දමා තිබෙන බවත් එම තොරතුර අඩංගු පිටුව අධිකරණය ඉදිරියේ හඳුනා ගත් අතර, එය පැමිණිල්ල විසින් පැ.811 (A) ලෙසත්, එම පිටුවේ සාක්ෂිකරු විසින් දමා තිබෙන සටහන් පැ811 (A) (a) ලෙසද ලකුණු කරන ලදි.

මෙම සාක්ෂිකරුව 09 වන චූදිත විසින් හරස් ප්‍රශ්න වලට භාජනය කරන ලද අතර, හරස් ප්‍රශ්නවලදී සාක්ෂිකරු කියා සිටියේ, අවස්ථාවන් දෙකේදීම තමාගේ හෝටලය කිහිපදෙනෙකුට නැවතීම සඳහා වෙන් කරගනු ලැබුවත්, එම අවස්ථාවන් දෙකේදී එහි කීදෙනෙකු නැවතී සිටියාදැයි තමා නොදන්නා බවය. තවද, එම අවස්ථා දෙකේදීම නැවතී සිටි පිරිස පිටත් වූවායින් පසුව එම බංගලාව පරීක්ෂා කිරීමේදී ඔවුන් පැමිණෙන විට බංගලාව තිබූ ආකාරයෙන්ම පැවති බවත් කිසිම වෙනසක් පෙනෙන්නට නොතිබූ බවත් අවි ආයුධ පුහුණුවක් ලබාදුන් බවට සැක කිරීමට කිසිදු නිරීක්ෂණයක් නොතිබුණු බවටත් සාක්ෂිකරු විසින් පවසා සිටින ලදි.

<u>නො:01/81 රුවන්එළිය, නුවරඑළිය බ්ලැක්පූල් ප්‍රදේශයේ පිහිටි Blue eye–in නිවාඩු නිකේතනයෙහි පුහුණු වැඩසටහනක් පැවැත්වීමට අදාළ සාක්ෂි විශ්ලේෂණය සහ නිගමනය</u>

මෙම නඩුවේ ඉහත සාක්ෂි මගින් නුවරඑළිය බ්ලැක්පූල් ප්‍රදේශයේ පිහිටි දෙමහල් ගොඩනැගිල්ලක් සම්බන්ධවද පැමිණිල්ල විසින් සාක්ෂි ඉදිරිපත් කර ඇත. Blue eye–in නමින් පවත්වාගෙන ගිය එම නිවාඩු නිකේතනයේ 2018.10.05 වන දින සිට දින 03 ක් පුද්ගලයන් කීපදෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් නැවතී සිට ඇති අතර, ඉන්පසුව එම පුද්ගලයන්ව නැවතත් 2018.11.16 සිට දින 03 ක් එහි නැවතී සිට ඇති බව පෙනී යයි.

මෙම නඩුවේ 01 වන චුදිත වන මොහොම්මදු ඊබ්‍රාහිම් මොහොම්මදු නවුෆර් යන අය විසින් සහකාර පොලිස් අධිකාරි විජිත පෙරේරා යන අයට 2020.09.11 දින දමිළ භාෂාවෙන් ලබා දී ඇති පාපොච්චාරණයේ සිංහල භාෂා පරිවර්තනය පැමිණිල්ල විසින් පැ.803(A) ලෙස ලකුණු කර ඇති අතර, එම ලේඛණයේ පැ.803(A2) (10) ලෙස ලකුණු කර ඇති පහත සඳහන් කොටසේ මෙලෙස සඳහන් වී ඇත.

“මා ඇතුළු NTJ සංවිධානයේ ප්‍රධානීන් විසින් නුවරඑළියේ ශාන්තිපුර සහ බ්ලැක්පූල්, මහනුවර, හම්බන්තොට යන ප්‍රදේශවල දින දෙකක work shop (වැඩමුළු) පැවැත්වූ අතර එක් එක් කඳවුර සඳහා 15-

20 දෙනෙකු පමණ සහභාගී වූහ. මා සහ සහරාන් පුහුණුවට සහභාගීවන්නන්ට එනම් මම ආගමික කරුණු සම්බන්ධවත්, IS සංවිධානය සම්බන්ධවත් දේශන පැවැත්වූවෙමි. සහරාන්ද ඒ අයුරෙන්ම ඉස්ලාමීය අරගලයේ ඉතිහාසය සහ ජාත්‍යන්තර මට්ටමින් මුස්ලිම් ජනතාවට සිදුව ඇති ගැටලු සම්බන්ධවත් දේශන කළේය. සමහර තැන්වලදී වීඩියෝ මඟින් ගෝලීය මට්ටමෙන් මුස්ලිම් ජනතාවට සිදුවී ඇති ගැටලු සම්බන්ධවත්, IS සංවිධානයට අදාළ වීඩියෝ දර්ශනත් අපි ප්‍රදර්ශනය කළෙමු.දුරකතන භාවිතය සම්බන්ධවත්, පිහියෙන් පහරදීම සහ ආයුධ සම්බන්ධවත් කස්තූන් පුහුණුව ලබාදුන්නේය. එම වැඩසටහන් සඳහා සාෆික්, මිල්හාන්, සාජිත්, සාදික් යන අයද සහභාගී වූහ. එහිදී අබූ යන නම් තබන ලදි. ඒ අනුව එම සංවිධානය විසින් මට අබූ ෂෙයිඩ් යන නම තබන ලදි. මම work shop (වැඩමුළු) 09කට වගේ සහභාගී වුණෙමි.”

ඒ අනුව ඉහත කරුණු සහ මෙම අධිකරණයේ ඉදිරිපත් වී තිබෙන සාක්ෂි සම්පූර්ණයෙන් විශ්ලේෂණය කිරීමේදී අපහට පෙනී යන්නේ, නුවරඑළිය බ්ලැක්පූල් ප්‍රදේශයේ Blue eye–in නමින් පවත්වාගෙන ගිය එම නිවාඩු නිකේතනයේදී මෙම නඩුවේ 01 වන චූදිත 2019.04.21 වන දින ෂැන්ග්‍රිලා හෝටලයේ සිදුවූ බෝම්බ පිපිරීමේදී ස්වයංඝාතක බෝම්බකරුවකු ලෙස බෝම්බ පුපුරවා ගත් පුද්ගලයන් දෙදෙනාගෙන් එක් පුද්ගලයෙක් වන සහරාන් යන අය සහ කටුවාපිටිය ශාන්ත සෙබස්තියන්

දේවස්තානයේ ස්වයංඝාතක බෝම්බකරුවකු ලෙස බෝම්බ පුපුරවා ගත් හස්තූන් නැමැත්තා සහ මෙම නඩුවේ 3 වූදිත මිල්හාන්,4 වූදිත සාදික් අබ්දුල්ලා, 9 වූදිත සාජිත් 10 වූදිත සාෆි ඇතුළු තවත් පුද්ගලයන් කිහිපදෙනෙකු සමඟ නැවතී සිට ඇති අතර, සූක්ෂම ලෙස සංවිධානය වී යම් වරදක් කිරීමට සූදානම් වීම පිණිස හෝ සැලසුම් කිරීම පිණිස ජාත්‍යන්තර වශයෙන් ත්‍රස්තවාදී සංවිධානයක් ලෙස නම් කර ඇති IS සංවිධානය සහ එහි ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් දැනුවත් කර අවිආයුධ පාවිච්චි කිරීම සම්බන්ධයෙන්, පිහි වලින් පහර දීම සම්බන්ධයෙන් අවබෝධයක් සහ පුහුණුවක් ලබා ගෙන ඇති බවටය.

<u>අංක 50/1D මයුරා පෙදෙස, වැල්ලවත්ත, කොළඹ 06</u>

<u>ලිපිනයේ පිහිටි මහල් නිවාසයක පැවති ආරක්ෂිත නිවස</u>

<u>සම්බන්ධ සාක්ෂි</u>

පැමිණිල්ලේ සාක්ෂි අංක 2271 මොහොමඩ් රිල්වාන් මොහොමඩ් යන අය සාක්ෂි දෙමින් පවසා සිටියේ, තමා 2019 වර්ෂයේ අකාරා නමින් හඳුන්වන Real Estate ආයතනයක සේවය කළ බවත්, එම ආයතනය විසින් මයුරා ප්‍රදේශයේ තිබූ මහල් නිවාස සංකීර්ණයක් එහි අයිතිකරු වන සාගර සේනාරත්න යන අයගෙන් අවුරුදු 03ක කාලයකට කුලියට ලබාගෙන තීබූ බවත්, එම ගොඩනැගිල්ලේ තිබූ නිවාස තම ආයතනය

විසින් සංචාරකයන්ට කෙටි කාලීනව කුලියට ලබාදෙන බවත්, 2019 වර්ෂයේ මුබාරක් යන තැනැත්තකු විසින් එම ගොඩනැගිල්ලේ නිවසක් කුලියට ලබා ගත් බවත්, එනම් 2019.01.21 සිට 2019.02.20 දින දක්වා වූ දවස් 30ක කාලයකට ඔහු විසින් එම නිවස කුලියට ලබා ගත් බවත්, එම නිවස සංචාරකයන්ට කුලියට දෙන විට ඔවුන්ට රිසිට්පතක් ලබා දෙන බවත්, මෙම මුබාරක් යන තැනැත්තාට එවැනි රිසිට්පතක් ලබා දුන් බවටත් පවසමින් සාක්ෂිකරු විසින් රිසිට් පතක් විවෘත අධිකරණයේ හඳුනාගත් අතර, පැමිණිල්ල විසින් එම රිසිට් පත පැ.845 වශයෙන් ලකුණු කරන ලදි.

තවදුරටත් සාක්ෂි දෙමින් මෙම සාක්ෂිකරු කියා සිටියේ මුබාරක් යන තැනැත්තා නැවතත් එම නිවස 2019.02.21 සිට 2019.02.22 දක්වා වූ දවස් කීපයකට වෙන් කරවාගනු ලැබූ බවත්, එලෙස වෙන්කරවා ගැනීමේ දී නැවතත් රිසිට්පතක් ඔහුට රිසිට් පත් ලබා දුන්බවත් පවසා එම රිසිට්පතද විවෘත අධිකරණයේ හඳුනාගත් අතර එකී රිසිට් පත පැමිණිල්ල විසින් පැ.846 ලෙස ලකුණු කරන ලදී. තවද මුබාරක් යන තැනැත්තා ඔහුගේ දුරකථන අංකය 0767217842 ලෙස තමාට ලබා දුන් බවත්, මුබාරක් යන තැනැත්තාව තමා විසින් දැක තිබෙන බවටත් ප්‍රකාශ කරන ලදි. මෙම සාක්ෂිකරුට පැ.834 ලෙස දැනටමත් ලකුණු කර තිබෙන පුද්ගලයෙකුගේ පින්තූරයක් පෙන්වා සිටි අතර, සාක්ෂිකරු එම පින්තූරය පරීක්ෂා කර එහි සිටින පුද්ගලයා තමා විසින් සඳහන් කළ මුබාරක් යන තැනැත්තා ලෙසට හඳුනාගන්නා ලදී. තවද 2018.12.14 වන දින සිට 2018.12.18 වන දක්වා වූ

කාලයක් සඳහා එම නිවස ඉන්සාෆ් යන තැනැත්තකු විසින් කුලියට ගත් බවත්, එම තැනැත්තා තමාගේ දුරකතන අංකය ලෙස 0756644444 යන අංකය ලබා දුන් බවත් පවසා සිටිමින් ඉන්සාෆ් යන අයටත් ඔහු විසින් නිවස වෙන්කරවා ගැනීමේදී රිසිට් පතක් ලබා දුන් බවත් පවසමින් එකී රිසිට් පත විවaත අධිකරණයේ සාක්ෂිකරු විසින් හඳුනාගත් අතර පැමිණිල්ල විසින් එකී රිසිට් පත පැ.847 ලෙස ලකුණු කර ඇත. දැනටමත් අධිකරණයේ පැ.123 ලෙස ලකුණු කර ඇති පුද්ගලයකුගේ පින්තූරයක් මෙම සාක්ෂිකරුට පෙන්වා සිටි අතර එම පින්තූරයේ සිටින පුද්ගලයාව තමාට හඳුනාගැනීමට නොහැකි බවට සාක්ෂිකරු පවසා සිටින ලදි.

මෙම සාක්ෂිකරුගෙන් කිසිදු චූදිතයකු විසින් හරස් ප්‍රශ්න අසා නොමැති අතර, ඒ අනුව ඔහුගේ සාක්ෂියට අභියෝගයට ලක්වී නොමැත.

පැමිණිල්ලේ සාක්ෂි අංක 2270 ඥානරාජ් පෝල්රාජ් යන අය සාක්ෂි දෙමින් පවසා සිටියේ, තමා 2019 වර්ෂය වන විට Anka Security යන ආයතනයේ සේවය කළ බවත්, එම ආයතනය මගින් ආරක්ෂක නිළධාරීන් විවිධ ස්ථාන වලට යොදවන බවත්, 2019 වර්ෂයේ මයුරා ප්‍රදේශයේ පිහිටි Akara Apartments නමින් හඳුන්වන මහල් නිවාස සංකීරණයේ ආරක්ෂක නිළධාරී ලෙස තමා කටයුතු කර ඇති බවත්, එම ගොඩනැගිල්ලට ඇතුල් වන වාහන සටහන් කර ගැනීම සඳහා පොතක් පවත්වාගෙන ගිය බවටත් පවසා සිටිමින් සාක්ෂිකරු විසින් එම පොත

විවෘත අධිකරණයේදී හඳුනා ගත් අතර, පැමිණිල්ල විසින් එම රෙජිස්ටරය පැ.849 ලෙස ලකුණු කරන ලදි.

මෙම සාක්ෂිකරු තවදුරටත් සාක්ෂි දෙමින් පවසා සිටියේ, එම රෙජිස්ටරයේ තිබෙන සටහන් අනුව 2019.02.07 වන දින එම ගොඩනැගිල්ලේ 3B අංකය දරණ නිවසට BGV-7799 දරණ වාහනය පැය 13.00 ට පැමිණ රාත්‍රී කාලයේ 12:20ට පමණ පිටත් වී තිබෙන බවත්, නැවත 2019.02.10 වන දින එම වාහනයම පැය 17.50 ට එම නිවසට පැමිණ පැය 16.05 ට පිටත් වී තිබෙන බවයි.

පැ.849 දරණ රෙජිස්ටරයේ 2019.02.07 වන දිනට BGV-7799 දරණ වාහනය සම්බන්ධව තිබෙන සටහන් පැ.849(1) ලෙසත්, 2019.2.10 වන දින එකී වාහන සම්බන්ධව තිබෙන සටහන් පැ.849(2) ලෙසත් පැමිණිල්ල විසින් ලකුණු කර ඇත.

මෙම සාක්ෂිකරුගෙන් ද කිසිදු චූදිතයකු විසින් හරස් ප්‍රශ්න අසා නොමැත.

පැමිණිල්ලේ සාක්ෂි 2272 හේරත් මුදියන්සේලාගේ සිසිර කුමාර හේරත් යන අය සාක්ෂි දෙමින් පවසා සිටියේ, තමා 2002 වර්ෂයේ සිට ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු ලෙස කටයුතු කරන බවත්, 2018 අප්‍රේල් 03වන දින තමා විසින් බදු ඔප්පුවක් ලියා සහතික කර ඇති බවත් පවසමින් එම බදු ඔප්පුව විවෘත අධිකරණයේදී හඳුනා ගත් අතර, එකී ඔප්පුව පැමිණිල්ල විසින් පැ.848 ලෙස ලකුණු කරන ලදී. තවදුරටත් සාක්ෂි

දෙමින් මෙම සාක්ෂිකරු කියා සිටියේ පැ. 848 ලේඛනය අනුව අංක 50/1D මයුරා ප්‍රදේශය, කොළඹ 06 යන ලිපිනයේ පිහිටි නිවසක් එම නිවසේ අයිතිකරු වන සාගර සේනාරත්න යන අය විසින් Akara Suits and Residencies Private Limited යන ආයතනයට 2018 අප්‍රේල් 03 වෙනිදා සිට අවුරුදු තුනක කාලයකට කුලියට ලබා දී ඇති බවත් ය.

මෙම සාක්ෂිකරුගෙන් ද කිසිදු චූදිතයකු විසින් හරස් ප්‍රශ්න අසා නොමැත.

<u>අංක 50/1D මයුරා පෙදෙස, වැල්ලවත්ත, කොළඹ 06</u>

<u>ලිපිනයේ පිහිටි මහල් නිවාසයක පැවති ආරක්ෂිත නිවස</u>

<u>සම්බන්ධ</u>

<u>සාක්ෂි විශ්ලේෂණය සහ නිගමනය</u>

මෙම නඩුවේ අංක 50/1D මයුරා පෙදෙස, වැල්ලවත්ත, කොළඹ 06 ලිපිනයේ පිහිටි මහල් නිවාසයක් සම්බන්ධ සාක්ෂි පැමිණිල්ල විසින් ඉදිරිපත් කර ඇත. ඒ සම්බන්ධයෙන් මෙම අධිකරණයේ සාක්ෂි ලබා දුන් පැ.සා.2277 රිල්වාන් අහමඩ්, පැ.සා.2270 ඥාණරාජ් පෝල් රාජ්, සහ පැ.සා. 2272 ප්‍රසිද්ධ නොතාරිස් සිසිර කුමාර හේරත් යන සාක්ෂිකරුවන්ගෙන් චූදිතයන් හරස් ප්‍රශ්න අසා නොමැති අතර, එම සාක්ෂිකරුවන්ගේ සාක්ෂිය කිසිදු අභියෝගයකටද ලක්ව නොමැත.

ඔවුන්ගේ සාක්ෂි තුළින් පෙනී යන්නේ, එකී ලිපිනයේ පිහිටි මහල් කිහිපයකින් යුත් ගොඩනැගිල්ල Akara Suits and Residencies Private Limited යන ආයතනය විසින් එම ගොඩනැගිල්ලේ අයිතිකරුගෙන් කුලියට ගෙන එහි තිබූ නිවාස සංචාරකයන්ට කෙටි කාලීනව කුලියට ලබා දී ඇති බවත්, 2019 වර්ෂයේ මුබාරක් යන තැනැත්තකු විසින් 2019.02.21 වන දින සිට 2019.02.22 දක්වා වූ දිනයක කාලයක් සඳහා සහ 2019.01.21 දින සිට 2019.02.20 දක්වා වූ දින 30ක කාලයක් සඳහා වෙන් කර ගෙන ඇති බවයි. එසේ වෙන් කරවා ගැනීමේදී මුබාරක් යන තැනැත්තාට ලබා දී තිබෙන පැ.845 සහ පැ846 දරණ ලේඛණ පරීක්ෂා කර බැලීමේදී එම මහල් ගොඩනැගිල්ලේ අංක 302 දරණ නිවස එලෙස මුබාරක් යන අය විසින් වෙන් කරවාගෙන ඇති බවටය. ඔහු තමාගේ දුරකථන අංකය ලෙස 0767217842 දරණ අංකය ලබා දී ඇත. තවද, මෙම මුබාරක් යන තැනැත්තා පැමිණිල්ල විසින් පැ.834 ලෙස ලකුණු කර ඇති ඡායාරූපයේ සිටින පුද්ගලයකු බවටද සාක්ෂි මඟින් පෙනී යයි. තවද, මෙම මුබාරක් යන අයගේ අනන්‍යතාවය සම්බන්ධයෙන් අධිකරණයේ පිළිගැනීම් වාර්තා කර ඇති අතර, එමඟින් එකී මුබාරක් යන අය 2019.04.21 වන දින කිංග්ස්බරි හෝටලයේ මරාගෙන මැරෙන බෝම්බකරුවකු ලෙස බෝම්බයක් පුපුරවා ගත් පුද්ගලයා ලෙසට කරුණු අනාවරණය වී ඇත.

එසේම 2018. 12.14 වන දින සිට 2018.12.18 යන දින දක්වා වූ කාලයකට ඉන්සාෆ් යන අයකු විසින් වෙන් කරවා ගෙන තිබෙන බවත් ඔහු තමාගේ දුරකථන අංකය ලෙස 0756644444 දරණ අංකය ලබා දී ඇති බවත්, තවද එම ගොඩනැගිල්ලේ 3/බී, අංක දරණ නිවසට 2019.02.07 සහ 2019.02.10 යන දිනයන්හිදී BGV- 7799 අංකය දරණ වාහනයක් පැමිණ ඇති බවටත් පෙනී යයි. මෙම ඉන්ෂාෆ් යන අයගේ අනන්‍යතාවය සම්බන්ධයෙන් අධිකරණයේ පිළිගැනීම් වාර්තා කර ඇති අතර, එමඟින් එකී ඉන්ෂාෆ් යන අය 2019.04.21 වන දින කොළඹ සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ මරාගෙන මැරෙන බෝම්බකරුවකු ලෙස බෝම්බයක් පුපුරවා ගත් පුද්ගලයා ලෙසට කරුණු අනාවරණය වී ඇත.

මෙම නඩුවේ 01 වන චුදිත වන මොහොම්මදු ඊබ්‍රාහිම් මොහොම්මදු නවුෆර් යන අය විසින් සහකාර පොලිස් අධිකාරි විජිත පෙරේරා යන අයට 2020.09.11 දින දමිළ භාෂාවෙන් ලබා දී ඇති පාපොච්චාරණයේ සිංහල භාෂා පරිවර්තනය පැමිණිල්ල විසින් පැ.803(A) ලෙස ලකුණු කර ඇති අතර, එම ලේඛණයේ පහත කොටස අන්තර්ගත වී ඇත.

> ***“ පසුව සහරාන් මල්වාන, එඩේරමුල්ල, රිදීතැන්න, ස්පෑන් ටවර්, මයුරා පෙදෙස පානදුර සරිකාමුල්ල යන ප්‍රදේශවල නිවාස සහ ස්ථාන කුලියට ගෙන Safe House එකක් (ආරක්ෂිත නිවසක්) ලෙස භාවිත කළේ ය..... මයුරා පෙදෙසේ Safe House***

*එකේ (ආරක්ෂිත නිවසේ) සහරාන් සමඟ සිටියදී ඔහු සතුව **T-56** ගිනි අවියක් තිබුණි ”*

ඒ අනුව පෙනී යන්නේ මෙම මයුරා පෙදෙස නිවස Safe House එකක් (ආරක්ෂිත නිවසක්) ලෙස සවයංඝාතක බෝම්බකරුවන් වන කිංග්ස්බරි හෝටලයේ මරාගෙන මැරෙන බෝම්බකරුවකු වන ඉන්ෂාෆ් යන අය සහ කොලඹ ශැන්ග්‍රීලා හෝටලයේ ස්වයංඝාතක බෝම්බයක් පුපුරුවාහරින ලද සහරාන් නැමත්තා ද සිට ඇති බවය.

මෙම නඩුවේ 04 වන චුදිත වන මොහොමඩ් ඊබ්‍රාහිම් සාදික් අබ්දුල්ලා යන අය විසින් සහකාර පොලිස් අධිකාරි කාවින්ද පියසේකර යන අයට 2020.10.04 වන දින ලබා දී ඇති පාපොච්චාරණය පැමිණිල්ල විසින් පැ.183 ලෙස ලකුණු කර ඇති අතර, එම ලේඛණයේ පහත පරිදි 04 වන චූදිත විසින් පවසා ඇත.

*“ මම සහරාන්ට කතා කරලා මාගේ බිරිඳත් සමඟ **AAX-3774** දරණ ටීවීඑස් වර්ගයේ කොළ පාට ත්‍රීරෝද රථයෙන් කුරුණෑගල බම්මන්නේ අබු සනාගේ ගෙදරට ගියා.එතනින් කුලියාපිටිය අබුතාරික්ගේ (රිස්කාන්) ගෙදර, මීගමුව කොච්චිකඩේ ආරක්ෂිත නිවසක, කල්මුණේ අබු මුක්තාර් නොහොත් අසාද්ගේ නිවස , කාත්තංකුඩි අබු සෙයිද්ගේ නිවස, කාත්තංකුඩි මිල්හාන්ගේ නිවස, මයුරා ප්ලැට් වැල්ලවත්ත යන ස්ථාන වල මාගේ බිරිඳ හා*

දරුවා සමඟ සහරාන් විසින් පැවසූ ආකාරයට රැඳී සිටියා. අවසානයට අපි තුන්දෙනා හිටියේ වත්තල එඩේරමුල්ල ආරක්ෂිත නිවසෙයි ”

ඒ අනුව් ඉහත පරිදි අධිකරණයේ ඉදිරිපත් වී තිබෙන සාක්ෂි මනාව පරීක්ෂා කිරීමේදී පෙනී යන්නේ, මෙම නඩුවේ 01 වන 04 වන චූදිතයන් 2019.04.21 වන දින සිදු වූ පාස්කු ඉරු දින බෝම්බ ප්‍රහාරයේ මරාගෙන මැරෙන බෝම්බකරුවන් ලෙස කටයුතු කළ සහරාන්, මුබාරක් සහ ඉන්ෂාෆ් යන අයවළුන් වැල්ලවත්ත මයුරා පෙදෙසේ අංක 50/1/D දරණ මහල් නිවාස ගොඩනැගිල්ලේ 302 දරණ නිවස ආරක්ෂිත නිවසක් ලෙස භාවිතා කර ඇති බවත්, තවද, සහරාන් යන අය එම නිවසේ සිටියදී ඔහු සන්තකයේ T-56 ගිනි අවියක් තබා ගෙන ඇති බවයි. ඒ අනුව මෙම නඩුවේ 01 වන සහ 04 වන චූදිතයන් පාස්කු ඉරු දින බෝම්බ ප්‍රහාරයේදී මරාගෙන මැරුණ බෝම්බකරුවන් වූ සහරාන්, මුබාරක් සහ ඉන්ෂාෆ් යන අය සමඟ සමීප සම්බන්ධතාවයක් පවත්වා ගනිමින් යම් අපරාධයක් සිදු කිරීමට සූදානම් වෙමින් කටයුතු කර ඇති බවට මනාව පෙනී යයි.

<u>නෝ: 484/3 වීදිය පාර වත්තල එඩේරමුල්ල ලිපිනයේ පැවති</u>

<u>ආරක්ෂිත නිවස සම්බන්ධ සාක්ෂි</u>

පැමිණිල්ලේ සාක්ෂි අංක 2248 ඉර්ෆාන් අයුබ් සාක්ෂි දෙමින් පවසා සිටියේ තමාගේ සොහොයුරයා වන අයුබ් සමාහි යන අයට අයත් නිවසක්

අංක 484/3 වීදිය පාර, එඩේරමුල්ල, වත්තල යන ලිපිනයේ පිහිටා තිබූ බවත්, තම සොහොයුරා 2015 වර්ෂයේ විදේශ ගත වූවායින් පසුව එම නිවස බලාගනු ලැබුවේ තමා විසින් බවත්, විටින් විට එම නිවස පුද්ගලයන්ට කුලියට දුන් බවත්, 2019 වර්ෂයේ මුල් කාලය වන විට එම නිවස අසාම් මොහම්මද් මුබාරක් මොහම්මද් අසාම් යන අයෙකුට වසරක කාලයකට කුලියට දුන් බවත්, එනම් 2019 පෙබරවාරි මාසයේ සිට වසරක කාලයක් සඳහා කුලියට ලබා දුන් බවත්, එලෙස කුලියට දීම සම්බන්ධව ප්‍රසිද්ධ නොතාරිස් රම්සීන් මහතා විසින් ලියා සහතික කරන ලද කුලී ගිවිසුමක් සකස් කරගත් බවත්, තමා සහ එම මුබාරක් යන තැනැත්තා විසින් අත්සන් කරන ලද එකී කුලී ගිවිසුම සාක්ෂිකරු විවෘත අධිකරණයේදී හඳුනාගත් අතර, එම ගිවිසුම පැමිණිල්ල විසින් පැ.830 ලෙස ලකුණු කරන ලදී. සාක්ෂිකරුට දැනටමත් අධිකරණයේ පැ.831 ලෙස ලකුණු කරන ලද පුද්ගලයෙකුගේ ඡායාරූපයක් පෙන්වූ අතර, එම ඡායාරූපය පරීක්ෂා කර එම ඡායාරූපයේ සිටින පුද්ගලයා තමාගේ නිවස කුලියට ගත් මුබාරක් යන තැනැත්තා බවට සාක්ෂිකරු විසින් හඳුනා ගන්නා ලදී. තවදුරටත් සාක්ෂි දෙමින් මෙම සාක්ෂිකරු පවසා සිටියේ 2019.04.21 වන දින සිදුවූ පාස්කු ඉරුදින බෝම්බ ප්‍රහාරයෙන් දවසක් හෝ දෙකකට පසුව පොලීසිය විසින් තමාට දුරකථනයෙන් අමතා වහාම මුබාරක් යන අයට කුලියට දුන් තම නිවසට එන ලෙසට දැනුම් දුන් බවත්, තමා එම නිවසට යන විට පොලිස් හා විමර්ශන නිලධාරීන් එම ස්ථානයේ සිටි බවත්, තමාගෙන් කුලියට ගත්

මුබාරක් යන තැනැත්තා නිවස අතහැර ගොස් ඇති බව තමාට පෙනී ගිය බවයි.

මෙම සාක්ෂිකරුගෙන් චූදිතයන් විසින් ප්‍රශ්න ඇසීමක් සිදු කර නොමැත.

පැමිණිල්ලේ සාක්ෂි අංක 2246 අබ්දුල් වහාබ් රම්සීන් යන අය සාක්ෂි දෙමින්, තමා වෘත්තීය නීතීඥවරයෙකු සහ නොතාරිස්වරයෙකු ලෙස සේවය කරන බවත්, තමා විසින් වර්ෂ 2019.02.15 වන දින ඉර්ෆාන් අයුබ් සහ මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක් යන අය අතර වත්තල, එඩේරමුල්ලේ වීදිය පාරේ, අංක 484/3 දරණ පරිශ්‍රය සම්බන්ධයෙන් බදු ගිවිසුමක් සකස් කළ බවත් කියා සිටි අතර, පැමිණිල්ල විසින් එකී බදු ගිවිසුම පැ.830 වශයෙන් සලකුණු කරන ලදී. එයින් බදු දීමනාකරු වන ඉර්ෆාන් අයුබ් යන අය තමාගේ සේවාදායකයකු වශයෙන් දීර්ඝ කාලයක සිට හඳුනන බවත්, ඔහු මේ වන විට මහා බ්‍රිතාන්‍යයේ විදේශගත ව සිටින බවටත් කියා සිටින ලදී. එහි නම් සඳහන් බදු ගැනුම්කාර පාර්ශවකාර මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක් යන අය තමා පුද්ගලිකව නොහඳුනන අතර, ඔහුගේ ලිපිනය 138/බී, නව යොවුන් වීදිය, කොළඹ 12 වන අතර ඔහුගේ ජාතික හැඳුනුම්පත් අංකය 873340312 බව කියා සිටින ලදී. එසේම එම සාක්ෂිකරුට බදු ගැණුම්කරුගේ යයි කියා සිටින ඡායාරූපයක් පෙන්වන ලද අතර එම ඡායාරූපය සාක්ෂිකරු විසින් ඉහත පැ.830 ලෙස සලකුණු කරන ලද බදු ගිවිසුමේ බදු ගැණුම්කරු මොහොමඩ්

අසාම් මොහොමඩ් මුබාරක්ගේ බවට හඳුනාගන්නා ලදී. එකී ඡායාරූපය පැ.831 වශයෙන් සලකුණු කරන ලදී. තවද මෙම බදු ගැනුම්කරු වර්ෂ 2019.04.21 වන දින සිදුවූ බෝම්බ පිපිරීම් වලදී මරාගෙන මැරෙන බෝම්බකරුවකු වශයෙන් මිය ගිය බව තමා ප්‍රවෘත්ති මගින් දැනගත් බවටද සාක්ෂි දෙමින් කියා සිටින ලදී.

මෙම සාක්ෂිකරුගෙන් කිසිදු චූදිතයකු විසින් හරස් ප්‍රශ්න අසා නොමැත.

පැමිණිල්ලේ සාක්ෂි අංක 2273 කන්නන්ගර ආරච්චිගේ ඈන් චමරි විජේකෝන් යන අය සාක්ෂි දෙමින්, ඇය වත්තල, එඩේරමුල්ලේ වීදි පාරේ, අංක 484/1/1 හි පදිංචිව සිටින බවත්, තමාගේ නිවස ඉදිරිපිට පිහිටි නිවසේ පදිංචිකරුවන් පිළිබඳව පාස්කු ප්‍රහාරයෙන් පසුව පොලිසියෙන් පැමිණ විමසීමක් කළ බවත්, එම නිවස වටා අඩි 12කටත් වඩා උස තාප්පයක් තිබූ බවත්, බොහෝ අවස්ථාවන්හිදී එම නිවස වසා තිබූ අතර රිශාඩ් බදුර්දීන් නැමති අයෙකුගේ සහෝදරිය විසින් එම නිවස මිලදී ගත් බව තමාට ආරංචි වූ බවත්, පාස්කු බෝම්බ ප්‍රහාරයට ආසන්න කාලය තුළ කළු පැහැති මුස්ලිම් ජාතිකයන් අදින ආකාරයේ ඇඳුමක් හැඳ සිටි කාන්තාවක් එම නිවසේ සිටි බව තමා දුටු අතර පිරිමි පුද්ගලයෙක් යතුරු පැදියකින් එම නිවසට පැමිණ පිටව යන බවට තමා නිරීක්ෂණය කළ බවටත් කියා සිටින ලදී.

මෙම සාක්ෂිකාරියගෙන් ද කිසිදු චූදිතයකු විසින් හරස් ප්‍රශ්න අසා නොමැත.

පැ.සා.2332 ඥානමුත්තු රත්නසිංහම් සාක්ෂි දෙමින් පවසා සිටියේ, තමා දැනට රැකියාවක් ලෙස ගොවිතැන් කටයුතු කරන බවත්, ඉන් පෙර රැකියාවක් ලෙස කාත්තන්කුඩි පාලමුණ ප්‍රදේශයේ සියාත් යන අයගේ වත්තක වැඩ කළ බවත්, එම ඉඩම අක්කර එකයි කාලක් පමණ විශාල ඉඩමක් බවත්, එම ඉඩම තුළ ගොඩනැගිලි දෙකක් තිබෙන බවත්, එම ඉඩම සංචාරකයන්ට කුලියට ලබා දුන් බවත්, යම් අවස්ථාවක එම ගොඩනැගිල්ල වෙන් කරවා ගැනීම සඳහා පුද්ගලයකු කතා කළ බවත්, ඔහුව තමා නොදන්නා බවත්, ඉන්පසු පුද්ගලයන් කණ්ඩායමක් පැමිණ අවස්ථා 02 කදී නැවතී සිටි බවත්, එලෙස ගොඩනැගිල්ල කුලියට ගනු ලැබුවේ සහරාන් නමැති අයකු බවත්, ඔහු සමඟ තවත් පුද්ගලයින් 15 දෙනෙක් හෝ 20 දෙනෙක් සිටි බවත්, කුමන අවශ්‍යතාවයක් සඳහා එලෙස පැමිණියාදැයි තමා නොදන්නා බවත්, එලෙස ඔවුන් නැවතී සිටි දවස් දෙකෙහිදී සහරාන්ව තමා නොදුටු බවටත් සාක්ෂිකරු සාක්ෂි ලබා දෙන ලදි.

මෙම සාක්ෂිකරුගෙන් කිසිදු චූදිතයකු විසින් හරස් ප්‍රශ්න අසා නොමැත.

කාත්තන්කුඩි, පාලමුණේ 10, ෆුර්කාන් මස්ජිද් පාර, හර්බලා වීදියේ අංක 20 දරණ ලිපිනයේ පිහිටි ගොඩනැගිල්ලෙහි පැවති ආරක්ෂිත නිවස සම්බන්ධ සාක්ෂි විශ්ලේෂණය සහ නිගමනය

මෙම නඩුවේ කාත්තන්කුඩි, පාලමුණේ - 10 ප්‍රදේශයේ ෆුර්කාන් මස්ජිද් පාර, හර්බලා වීදියේ අංක 20 දරණ ලිපිනයේ පිහිටි ගොඩනැගිල්ලක් සම්බන්ධයෙන් පැ.සා.2131 මොහොමඩ් සියාත් සහ පැ.සා.2332 ඥානමුත්තු රත්නසිංහම් යන අය විසින් පැමිණිල්ල වෙනුවෙන් සාක්ෂි ඉදිරිපත් කර ඇත.

මොහොමඩ් සියාත් යන අයව 03 වන චූදිත විසින් හරස් ප්‍රශ්න වලට භාජනය කර තිබුණද, එයින් මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය කිසිදු බිද වැටීමකට ලක් වී නොමැත. අනෙකුත් චූදිතයන් මෙම සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න අසා නොමැත.

ඉදිරිපත් වී ඇති සාක්ෂි සළකා බැලීමේදී අධිකරණයට පෙනී යන්නේ, එම ගොඩනැගිල්ල පැ.සා.2131 සියාත් යන අයට අයත් ගොඩනැගිල්ලක් බවත්, එම තැනැත්තා අදාළ ගොඩනැගිල්ල විටින් විට පිටස්තර පුද්ගලයින්ට කෙටි කාලීනව කුලියට ලබා දී ඇති බවත්, අක්කරයක් පමණ විශාල ඉඩමක පිහිටි එම ගොඩනැගිල්ල බලා ගැනීම සඳහා පැ.සා. 2332 ඥානමුත්තු රත්නසිංහම් යන අයව පත්කර තිබූ අතර, 2018 වර්ෂයේ අවස්ථා 02 කදී සහරාන් නමින් හඳුන්වන

තැනැත්තකු විසින් එම ගොඩනැගිල්ල වෙන් කරවා ගෙන ඒ අවස්ථා 02 දීම පුද්ගලයන් 15 ක් හෝ 20 දෙනෙකු පමණ එම ගොඩනැගිල්ලට පැමිණ නැවතී සිට ඇති බවයි. එම සහරාන් යන තැනැත්තා 2019.04.21 වන දින සිදුවූ පාස්කු ඉරු දින බෝම්බ ප්‍රහාරයේදී කොළඹ ෂැන්ග්‍රිලා හෝටලයේ සිදුවූ බෝම්බ පිපිරීමේදී ස්වයංඝාතක බෝම්බකරුවකු ලෙස බෝම්බ පුපුරවා ගත් තැනැත්තා ලෙසට අනාවරණය වී ඇත.

මෙම නඩුවේ සාක්ෂි ලබා දුන් පැ.සා.2233, සෙයියදු අහමදු අස්මියා යන අයගේ සාක්ෂිය අනුව කාත්තන්කුඩි, පාලමුණේ පිහිටි මෙම ගොඩනැගිල්ල වැඩමුළු පැවැත්වීම සඳහා භාවිතා කර ඇති බවට තහවුරු වේ.

<u>අංක 275/1, පොල්හේන පාර, මල්වාන ලිපිනයේ පිහිටි නිවසෙහි පැවති ආරක්ෂිත නිවස සම්බන්ධ සාක්ෂි</u>

පැමිණිල්ලේ සාක්ෂි අංක 2249 මොහොමඩ් ෆාතිමා නසූහා යන නීතීඥ සහ ප්‍රසිද්ධ නොතාරිස්වරිය සාක්ෂි දෙමින් 2018.03.22 වන දින තමා විසින් අංක 1752 දරණ බදු ගිවිසුමක් සකස් කර සහතික කළ බවට සාක්ෂි ලබා දෙන ලද අතර, එකී බදු ඔප්පුව අධිකරණයේ හඳුනා ගැනීමෙන් පසුව පැමිණිල්ල විසින් එකී බදු ඔප්පුව පැ.822 වශයෙන් ලකුණු කරන ලදි. සාක්ෂිකාරිය තවදුරටත් කියා සිටියේ පැ.822 අනුව බදු ගිවිසුමේ දීමනාකරු වශයෙන් මොහොමඩ් අවුන් මොහොමඩ් හසන් අලි ලෙසත්, බදු

ගැනුම්කරු වශයෙන් ජාතික හැඳුනුම්පත් අංක 730784724V දරන අබ්දුල් ලතීෆ් මොහොමඩ් සාෆි යන සහ ජාතික හැඳුනුම්පත් අංක 873340312V දරන මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක් යන අය අත්සන් කළ බවත්, එම බදු ඔප්පුවට අදාළ 2018.03.22 දින සිට අවුරුද්දක කාලයක් සඳහා කුලියට ලබා දුන් බවත්ය.

මෙම සාක්ෂිකාරියගෙන් චූදිතයින් විසින් හරස් ප්‍රශ්න අසා නොමැත.

මෙම සාක්ෂිය විශ්ලේෂණය කිරීමේ දී පෙනී යන්නේ කිංග්ස්බරි හෝටලයේ මරාගෙන මැරුන ස්වයංඝාතක බෝම්බ කරුවෙකු වන ජාතික හැඳුනුම්පත් අංක 873340312V දරන මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක් යන අය මෙම ආරක්ෂිත නිවස බදු ගැනීමට අදාළ බදු ගිවිසුම අත්සන් කර ඇති බව සහ මෙම අධිකරණයේ සිටින 10 චූදිත වන ජාතික හැඳුනුම්පත් අංක 730784724V දරන අබ්දුල් ලතීෆ් මොහොමඩ් සාෆි යන අයද එකී ස්වයංඝාතක බෝම්බකරු සමගම මෙම බදු ගිවිසුම අත්සන් කර තිබීම මගින්ම 10 චූදිත ද ඔහු සමග එකට කටයුතු කර ඇති බව මනාව පෙනී යයි.

පැ.සා. 2296 මොහොමඩ් අවුම් මොහොමඩ් අසන් අලි යන අය සාක්ෂි දෙමින්, පැ.822 ලෙස ලකුණු කරන ලද ප්‍රසිද්ධ නොතාරිස් මොහොමඩ් ෆාතිමා නසූහා යන ප්‍රසිද්ධ නොතාරිස්වරිය විසින් සහතික කරන ලද අංක 1752 දරන ඔප්පුවේ සඳහන් මල්වාන ප්‍රදේශයේ නිවසේ

අයිතිකරු තමා බවත්, එහි පර්චස් 272ක් පමණ විශාලත්වයෙන් යුතු රැුුටන් ගස් සහිත ඉඩමක කාමර දෙකක ලොකු නිවසක් තිබෙන බවත්, සිය බිරිඳගේ සොහොයුරියගේ පුතා විසින් රැගෙන ආ බදු ගැනුම්කරුවෙකු සමඟ එනම්, තමාගේ අක්කාගේ පුතා වන ඉෆ්තිකාර් විසින් රැගෙන පැමිණි සාෆි සහ නමින් හඳුනන්නැති තවත් පුද්ගලයෙකු මෙම බදු ගිවිසුමට අත්සන් කළ අතර, බදු ගිවිසුම වසර 01 ක කාලයක් සඳහා වලංගුව තිබුණද මාස 08ක කාලයකින් ගේ ආපසු ලබාදීමට ඔවුන් කටයුතු කළ බවත්, ඒ අනුව 2019 ජනවාරි මාසයේදී බදු ගිවිසුම අවලංගු කළ බවත් කියා සිටින ලදී. එහිදී බදු ගැනුම්කරුවෙකු වශයෙන් අත්සන් තැබූ සාෆි යන අය අද දින සාක්ෂි දෙන අවස්ථාවේදී අධිකරණයේ පෙනී සිටි විත්තිකරුවන් අතරින් 10 වැනි විත්තිකරු වශයෙන් අසුන්ගෙන සිටින ස්ථානය පෙන්වා හඳුනාගන්නා ලදී. ඒ අනුව පැසා.2249 ෆාතිමා නසූහා ගේ සාක්ෂියට අනුව මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක් යන අය සමඟ පැ.822 දරන බදු ගිවිසුම අත්සන් කිරීම සඳහා පැමිණ ඇත්තේ මෙම නඩුවේ 10 වූදිත වන අබ්දුල් ලතීෆ් මොහොමඩ් සාෆි බව මනාව පෙනී යන අතර මෙම සාක්ෂිකරු විසින් 10 වූදිත ව විවෘත අධිකරණයේ දී පෙන්වා හඳුනා ගෙන ද ඇත.

මෙම සාක්ෂිකරුගෙන් කිසිදු චූදිතයකු විසින් හරස් ප්‍රශ්න අසා නොමැත.

පැමිණිල්ලේ සාක්ෂි අංක 2247 මොහොමඩ් සබීර් මොහොමඩ් ඉම්තිසාම් යන අය ඉහත සාක්ෂි ලබා දෙන ලද පැමිණිල්ලේ සාක්ෂි අංක 2296 දරණ සාක්ෂිකරුගේ නිවස බදු දීම සඳහා පැ.882 දරන ඔප්පුව මඟින් ගැනුම්කරුවන් හඳුනාගත් අතර, ඔහු එකී පැ.සා.2296 දරන සාක්ෂිකරුගේ නෑකමට ඥාති පුත්‍රයෙකු වන බවත්, අදාළ ඉඩම අක්කර එකහමාරක පමණ තාප්පයකින් වට වූ රඹුටන් ගස් සහිත ඉඩමක් බවත්, එහි ලිපිනය 275/1, පොල්හේන පාර, මල්වාන බවත්, 2018 සිට 2019 දක්වා කාලය සඳහා එය බදු දීම සිදු කළ අතර උමන් ෆාරුක් නමැති තමාගේ යහළුවෙකු මඟින් එම නිවස බදු දීම සඳහා අදාළ මොහොමඩ් අසාමි මොහොමඩ් මුබාරක් යන අය හඳුන්වාදුන් බවත්, ඔහු සමඟ සාෆි යන අයද පැමිණ තමාත්, සිය බාප්පාත් මොහොමඩ් සාෆි සහ මුබාරක් යන සියලුදෙනා බදු ගිවිසුම අත්සන් කළ බව කියා සිටින ලද අතර මොහොමඩ් සාෆි යන අයගේ ජාතික හැඳුනුම්පත් අංකය 730784724V බවත්, මුබාරක් යන අයගේ ජාතික හැඳුනුම්පත 873340312V බවටත් හඳුනාගන්නා ලද අතර, පැ.882හි සාක්ෂිකරු වශයෙන් තමාත්, උමාර් ෆාරුක් යන අයත් අත්සන් කළ බව කියා සිටිමින් එහි සාෆි යනුවෙන් අත්සන් තබා ඇති තැනැත්තා 10 වන විත්තිකරු බවටත් කියා සිටිමින් මීට පෙර අවස්ථාවේදී පැමිණිල්ලේ සාක්ෂි අංක 2249 නොතාරිස්වරිය සාක්ෂි දෙන අවස්ථාවේදී පැ.822(A) වශයෙන් සලකුණු කරන ලද අත්සන හඳුනාගන්නා ලදී. 2019 ජනවාරි මාසයේ සිට මෙම ගිවිසුම අවලංගු කළ අතර, ඒ දක්වා මාසික කුලිය සාෆි

විසින් තමාට ලබාදුන් බවත්, තමා නිවසට ගිය අවස්ථාවේදී ගහූර් නමින් හඳුන්වන 02 වෙනි චූදිතද එම නිවසේ ගේට්ටුව අසළ කටයුතු කරමින් සිටි බව තමා දුටු බවත් කියා සිටීමින් විවෘත අධිකරණයේ සිටින 02 වෙනි චූදිතද හඳුනාගන්නා ලදී. මුබාරක් යන අයගේ ජාතික හැඳුනුම්පතේ පිටපතක් ඊට පෙර අවස්ථාවකදී පැ.81 වශයෙන් සලකුණු කර ඇති අතර එය හඳුනාගන්නා ලද සාක්ෂිකරු මුබාරක් යන අය සාක්ෂිකරු දකින අවස්ථාව වන විට රැවුල වවා, තොප්පියක් දමා ජුබ්බා නමැති ඇඳුමක් ඇඳ සිටි බවත්, පැ.81හි විස්තර සහ තමා ඔප්පු ලියන අවස්ථාවේදී සඳහන් කරනු ලැබූ විස්තර සමඟ ගැළපෙන බවත් කියා සිටින ලදි. එසේම මුබාරක් නමැති අය කිංග්ස්බරි හෝටලයේ බෝම්බයක් පුපුරවා ගනිමින් මියගිය බව ප්‍රවෘත්ති වලින් තමා දැනගත් බවයත් කියා සිටින ලදී.

මෙම සාක්ෂිකරු වැඩිදුරටත් සාක්ෂි දුන් එකී සාක්ෂිකාර මොහොමඩ් සබීර් මොහොමඩ් ඉම්තිසාම් (පැ.සා.2247) ඔහුට වීඩියෝ තිරය හරහා පෙන්වන ලද පැ.13 ලෙසට මේ වනවිටත් සලකුණු කර ඇති CD පටයේ ඇති විනාඩි1යි තත්පර 16දී නවත්වනු ලබන දර්ශනයක සිටින (cap) පැළඳ, වම්අතේ බෑගයක් රැගෙන ලාපාට ටී ෂර්ට් එකකින් සහ කලු කලිසමකින් සැරසුණු කනෙහි earphone සහ ඔරලෝසුවක් පැළඳ සිටින තැනැත්තා හැඩහුරුකමින් මෙම ගිවිසුමට එනම්, පැ.822 දරන ගිවිසුමට එළඹුන අවස්ථාවේදී එහි සිටි මුබාරක් නමැති අය ලෙසට තමා හඳුනාගැනීමට හැකි බව කියා සිටින ලදී.

මෙම සාක්ෂිකරුගෙන් 2වන සහ 10 වන විත්තිකරුවන් වෙනුවෙන් නීතීඥ කනිල් මද්දුමාගේ මහතා හරස් ප්‍රශ්න විමසන ලද අතර, එකී හරස් ප්‍රශ්න වලට පිළිතුරු දෙමින් සාක්ෂිකරු කියා සිටින ලද්දේ, කුලී නිවස වසරක කාලයකට ගිවිසුම්ගත වුවද මාස 8ක පමණ කාලයක් පැවති බවත්, අවට නිවාස කිසිවක් නොමැති අතර පොල්හේන පාරේ ඇතුළට වන්නට එය පිහිටි අතර තමාගේ නිවසත්, කුලී නිවසත් එහි අයිතිකරුගේ නිවසත් අතර 700mක, 800mක පමණ දුරක් ඇති බවත් ය.

එසේම එම නිවසේ ගේට්ටුවේ සිට බැලූ විට නිවස පෙනෙන අතර තමා කඩන ලද පොල් එකතු කිරීමට සහ කුලී ගැනීමට එම ස්ථානයට ගිය අතර PHI නැතහොත් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා එම නිවස පරීක්ෂා කළේද යන්න තමා නොදන්නා අතර අසල්වාසීන්ගෙන් පැමිණිලි කිසිවක් නොතිබූ බවද කියා සිටින ලදී. තමා නිවසට ගිය අවස්ථාවේදී 02 වැනි චූදිත එම නිවසේ සිටි අතර, 10 වන චූදිත කුලිය දීමට පැමිණි අතර ඔවුන් මොනවා කළේද යන්න තමා නොදුටුව බව කියා සිටින ලදී.

මෙම නිවස ආපසු භාරදීමේදී 2022 ජනවාරි 21 වන දින ඔහුට චෙක්පතකින් අත්තිකාරම් මුදල ආපසු ගෙවූ බවත්, ඉන් අනතුරුව වෙනත් පුද්ගලයෙකුට ගබඩාවක් ලෙස කුලියට දුන් බවත්, ඉන් අනතුරුව මාස 2කින් පසුව වෙනත් පුද්ගලයෙකුට ගබඩාවක් ලෙස කුලියට දුන් බවටත් කියා සිටින ලදී. ආපසු ලබා ගැනීමෙන් පසුව නිවස පරීක්ෂා කළ අතර එහිදී

කිසිවක් සොයා නොගත් බවත්, එම නිවසට පැමිණි පුද්ගලයන් කවුරුන්ද යන්න තමා නොදන්නා බවටත් කියා සිටින ලද අතර, එම අවස්ථාවේදී සාක්ෂිකරු විසින් පවත්වාගෙන යන ගොනුවෙහි ඇති බදු ඔප්පුව, අවලංගු කිරීමේ ලේඛන, මුදල් ගෙවූ වෙක්පත් සහ හැඳුනුම්පත් අනුව මෙම විස්තර සඳහන් කරන බවට ඔහු කියා සිටින ලදී.

නැවත ප්‍රශ්න විමසීමේදී 10 වන විත්තිකරුගේ හැඳුනුම්පත පැ.823 ලෙසත්, මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක් යන අයගේ හැඳුනුම්පත පැ.827 ලෙසත් පැමිණිල්ලෙන් සලකුණු කරන ලද අතර, ඒ සම්බන්ධයෙන් විත්තියට නැවත හරස් ප්‍රශ්න විමසීමට අවස්ථාව ලබාදුන්නද ඒ සම්බන්ධයෙන් හරස් ප්‍රශ්න විමසීමක් සිදු නොකරන බවට චූදිතයින් කියා සිටින ලදී.

<u>අංක 275/1, පොල්හේන පාර, මල්වාන ලිපිනයේ පිහිටි නිවසෙහි පැවති ආරක්ෂිත නිවස සම්බන්ධ සාක්ෂි විශ්ලේෂණය සහ නිගමනය</u>

මෙම නඩුවේ 275/1, පොල්හේන පාර, මල්වාන යන ලිපිනයේ පිහිටි නිවසක් සහිත ඉඩමක් සම්බන්ධව පැමිණිල්ල විසින් සාක්ෂි ඉදිරිපත් කර ඇත. මෙම ඉඩම අක්කර එකහමාරක පමණ විශාල තාප්පයෙන් වට වූ

රඹුටන් ගස් සහිත ඉඩමක් වන අතර එම ඉඩමේ විශාල නිවසක්ද තිබී ඇත. එම නිවස සහ ඉඩම, මෙම නඩුවේ 10 වූදිත වන අබ්දුල් ලතීෆ් මොහොමඩ් සාෆි සහ මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක් යන අය විසින් එම ඉඩමෙ අයිතිකරු වන පැ.සා 2296 මොහොමඩ් අවුම් මොහොමඩ් අසන් අලි යන අයගෙන් 2018 මාර්තු මස සිට වසරක කලයකට කුලියට ලබාගෙන ඇත. ජාතික හැඳුනුම්පත් අංක 873340312V හිමි එකී මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක් යන අයගේ අනන්‍යතාවය සම්බන්ධයෙන් මෙම නඩුවේ පිළිගැනීම් වාර්තා කර ඇති අතර, එමඟින් එකී මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක් යන තැනැත්තා කොළඹ කිංග්ස්බරි හෝටලයේ මරාගෙන මැරෙන බෝම්බකරුවකු ලෙස බෝම්බ පුපුරවා ගනු ලැබූ තැනැත්තා ලෙසට කරුණු අනාවරණය වී ඇත.

මෙම නඩුවේ 01 වන චුදිත වන මොහොම්මදු ඊබ්‍රාහිම් මොහොම්මදු නවුෆර් යන අය විසින් සහකාර පොලිස් අධිකාරි විජිත පෙරේරා යන අයට 2020.09.11 දින දමිළ භාෂාවෙන් ලබා දුන් පාපොච්චාරණයේ සිංහල භාෂා පරිවර්තනය පැමිණිල්ල විසින් පැ.803(A) ලෙස ලකුණු කර ඇති අතර, එම ලේඛණයේ පහත කොටස අන්තර්ගත වී ඇත.

“ පසුව සහරාන් මල්වාන, එඩේරමුල්ල, රිදීතැන්න, ස්පෑන් ටවර්, මයුරා පෙදෙස පානදුර සරිකාමුල්ල යන ප්‍රදේශවල නිවාස

සහ ස්ථාන කුලියට ගෙන Safe House එකක් (ආරක්ෂිත නිවසක්) ලෙස භාවිත කළේ ය. ”

01 වන චූදිතගේ ඉහත සඳහන් ප්‍රකාශය අනුව මල්වාන ප්‍රදේශයේ සහරාන් විසින් ආරක්ෂිත නිවසක් පවත්වාගෙන ගොස් ඇති බවට කරුණු සනාථ වේ.

ඉහත සියළු සාක්ෂි මනා විශ්ලේෂණය කිරීමේ දී පෙනී යන්නේ, මෙම නඩුවේ 10 වන චූදිත වන අබ්දුල් ලතීෆ් මොහොමඩ් සාෆි නැමැත්තා, මල්වාන පොල්හේන පාරේ අංක 275/1, දරණ ලිපිනයේ පිහිටි මෙම නිවස බදු ගැනීම සඳහා කිංග්ස්බරි හෝටලයේ පිපිරීම සිදුකල ස්වයංඝාතක බෝම්බකරුවෙකු වන මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක් යන අය සමග එක්ව කටයුතු කර ඇති බවයි. තවද, එකී නිවසේ මෙම නඩුවේ 02 වන චූදිත වන මොහොමඩ් සරීබු ආදම් ලෙබ්බේ නොහොත් ගපූර් මාමා යන අයත් නැවතී සිටි බවටද සාක්ෂි මඟින් හෙළි වී ඇත. මෙම ආරක්ෂක නිවස පවත්වාගෙන යාම සඳහා 2019.04.21 වන දින සිදුවූ පාස්කු ඉරු දින බෝම්බ ප්‍රහාරයේදී කොළඹ ෂැන්ග්‍රිලා හෝටලයේ සිදුවූ බෝම්බ පිපිරීමේදී ස්වයංඝාතක බෝම්බකරුවකු ලෙස බෝම්බ පුපුරවා ගත් සහරාන් යන අය විසින් කටයුතු කර ඇති බැවින් මෙම නඩුවේ 02 වන සහ 10 වන චූදිතයන් 2019.04.21 දින පාස්කු ඉරු දින බෝම්බ ප්‍රහාරයේ මරාගෙන මැරෙන බෝම්බකරුවන් වන ඉහත සඳහන් සහරාන් සහ මොහොමඩ් අසාම්

මොහොමඩ් මුබාරක් යන අය සමඟ යම් අපරාධයක් සිදු කිරීම සඳහා එක්ව කටයුතු කර ඇති බවද පෙනී යයි.

මාවනැල්ල, දෙල්ගහගොඩ තව්හීද් පල්ලියේ පැවති

පුහුණු මධ්‍යස්ථානයක් සම්බන්ධ සාක්ෂි

පැමිණිල්ලේ සාක්ෂි අංක 1401, ජාසිර්කාන් ජවුෆර් සාදික් යන සාක්ෂිකරු හිගුල, දෙල්ගහගොඩ ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවෙක් වන අතර, ඔහු සාක්ෂි දෙමින් කියා සිටියේ, තමා දෙල්ගහගොඩ මුස්ලිම් කණිෂ්ඨ විද්‍යාලයේ තමාගේ පාසල් අධ්‍යාපනය ලබා ගත් බවත්, දැනට මොරටුව විශ්වවිද්‍යාලයේ NDT එනම්, ජාතික තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව හදාරන ලද බවත්ය. තමාගේ ගමේ එනම්, දෙල්ගහගොඩ තව්හීද් පල්ලියක් තිබෙන බවත් තමා එම පල්ලියටත් වන්දනා කරන්න යන බවත්, 2018 වර්ෂයේ Sri Lanka Islamic Student Movement මඟින් දින 04 ක් හෝ 05 ක වැඩමුළුවක් සංවිධානය කර තිබූ බවත්, එවැනි වැඩසටහන් හැම අවුරුද්දේම සංවිධානය කරන බවත්, ලංකාව පුරාවටම එවැනි වැඩමුළුවල් සංවිධානය කරන බවත් එම වැඩමුළුවල්වලට ලංකාවේ සෑම පළාත්වලම ඉදන් පුද්ගලයන් සහභාගි වෙන බවත්, මීට පෙරද එවැනි වැඩසටහන් දෙල්ගොඩ ප්‍රදේශයේ සංවිධානය කර තිබෙන බවත්, 2018 වර්ෂය වෙනකොට තමා අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය අවසන් වී

ප්‍රතිඵල අපේක්ෂාවෙන් සිටිය අතර අ.පොස. උසස් පෙළ විෂයන් සඳහා උපකාරක පන්ති වලට යෑමට පටන්ගෙන තිබූ බවත්, තමාගේ බාල මාමා කෙනෙකු වූ මුනීෆ්ගේ දැනුම් දීම මත තමාද එම වැඩමුලුවට ස්වේච්ඡා සේවකයෙකු ලෙස තේ පැන් සැපයීම වැනි කටයුතුවලට සහාය වීම සඳහා සහභාගීවූ බවත්, තමාට උදේ වරුවේ උපකාරක පන්ති තිබූ බැවින් මෙම වැඩමුළුවට සවස් කාලයේදී පමණක් සහභාගී වූ බවත් එම වැඩමුළුවට දිවයිනේ විවිධ ප්‍රදේශවලින් සිසුන් 40ක් පමණ පැමිණ පල්ලියේ නවාතැන් ගෙන සිට ඊට සහභාගී වූ බවත්, මෙම වැඩසටහන සංවිධානය කිරීම සඳහා එම පල්ලියේ සම්බන්ධීකරණ කටයුතු සිදු කරනු ලැබුවේ මෙම නඩුවේ 5 වන චූදිත සහ 4 වන චූදිත යන දෙදෙනා විසින් බවත්, ඔවුන් දෙදෙනා එකම පවුලේ සහෝදරයන් වන අතර මෙම නඩුවේ 14 වන චූදිතගේ පුත්‍රයන් බවත්, මෙම වැඩමුළුව අතරතුර පැවැත්වුණු දේශනවලදී අන්තවාදී ඉගැන්වීම් සිදු කරන ලද බවටත් සාක්ෂිකරු පවසා සිටින ලදි.

එම වැඩමුළුවේ දෙවන දිනයේදී මෙම නඩුවෙ 9 වන චූදිත මොහොමඩ් රමීෂ් මොහොමඩ් සාජිත් විසින් සහජීවනය පිළිබඳ දේශනයක් පවත්වමින් ‘‘සහජීවනය කියල එහෙම දෙයක් නැහැ, ආගම් අතර එහෙම සහජීවනයක් පැවැත්වෙන්න බැහැ,’’ යනුවෙන් පැවසූ බවත් එසේම ‘‘මුස්ලිම් රටක් නොවන රටක මුස්ලිම් කට්ටියට ජීවත් වෙන්න බැහැ’’ යැයි ප්‍රකාශ කළ බවත්, එසේම මුස්ලිම් රටක් නොවනවා නම් ඒ රට මුස්ලිම් රටක් විධියටම අපි චේන්ජ් කරන්න ඕනෑ.’’ ‘‘එසේම මේ අප ඉන්න රට

මුස්ලිම් රටක් නොවන නිසා මේ රට මුස්ලිම් රටක් බවට අප පවත්වාගන්න ඕනෑ.'' යැයි පැවසුව බවත්, එසේම ශ්‍රී ලංකාවේ දිගන සහ අලුත්ගම වැනි ප්‍රදේශවල සිදු වූ මුස්ලිම් විරෝධී ප්‍රහාර, බොදුබල සේනා වැනි සංවිධානවල ක්‍රියාකාරකම් සහ හිජාබ්, හලාල් වැනි ප්‍රශ්න පෙන්වා දෙමින් රට මුස්ලිම් රටක් බවට පත් කිරීම සඳහා "සටනක්" කළ යුතු බවටත් දේශනා කළ බව මෙම සාක්ෂිකරු සාක්ෂි ලබා දෙන ලදි.

එසේම වැඩමුළුවේ අවසාන දිනයේදී මෙම නඩුවෙ 4 වන චූදිත මොහොමඩ් ඉබ්‍රාහිම් සාදික් අබ්දුල්ලා විසින් දේශනයක් පවත්වමින් ''මුස්ලිම් නොවන රටක් මුස්ලිම් රටක් බවට පත් කරනවා නම් අපි යුද්ධයක් කරන්න ඕනේ. අපි යුද්ධයක් පටන් ගන්න යන්නේ.'' ලෙසට 4 වන චූදිත ප්‍රකාශ කළ බව සාක්ෂිකරු පවසා සිටී. තවද, ඔහු වයිට් බෝඩ් සහ ප්‍රොජෙක්ටරයක් භාවිතා කරමින් සන්නද්ධ පුද්ගලයන්ගේ සහ යුධ උපකරණවල ඡායාරූප පෙන්වමින් පලස්තීනය වැනි අරාබි රටවල සහ ඉස්ලාම් ඉතිහාසයේ යුද්ධ පිළිබඳව කරුණු පැහැදිලි කර දුන් බවත්, අනෙක් ආගම්වල අයට විරුද්ධව කරන මෙම යුද්ධයේදී මියයන පුද්ගලයන් කෙළින්ම ස්වර්ගයට යන බව පවසා ඔවුන්ගේ සංවිධානය සමඟ එක්වී අවසානය තෙක් රැඳී සිටින ලෙසට ඉල්ලා සිටි බවත් සාක්ෂිකරු සාක්ෂි ලබා දෙන ලදි. එසේම ''මේකෙන් එළියට ගියාට පස්සේ අනිත් කට්ටිය මේක වැරදියි කියලා කියන්න පුළුවන්. හැබැයි මේක තමයි හරි.'' යැයි 04 වන චූදිත තවදුරටත් පැවසූ බවත් සාක්ෂිකරු පවසා ඇත.

තවද, 14 වන චූදිතද රෂීඩ් මොහොමඩ් ඉබ්‍රාහිම් එහි දේශනයක් පැවැත්වූ බවත්, තමා එහි යන විටත් දේශනය අවසන් වීමට ආසන්නව තිබූ බැවින් එහි අන්තර්ගතය පිළිබඳ තමාට මතකයක් නොමැති බවටත් සාක්ෂිකරු පවසා සිටින ලදී.

වැඩමුළුව අවසානයේ තමා මෙම දේශනවල අන්තර්ගතය පිළිබඳව තම මවට පැවසූ විට, ඇය එම මතයන් වැරදි බව පවසා ඒ පිළිබඳව සිතීම පසෙකලා උසස් පෙළ විභාගයේ අධ්‍යයන කටයුතු කෙරෙහි අවධානය යොමු කරන ලෙසට තමාට උපදෙස් දුන් බවත්, ඒ අනුව තමා එම උපදෙස් පිළිපැද අධ්‍යාපන කටයුතු සඳහා යොමු වූ බවටත් පවසා සිටී. පසුව, පාස්කු ඉරුදින ප්‍රහාරයෙන් අනතුරුව 2020 ජනවාරි 22 දින තමාගේ ජංගම දුරකථන විස්තර පරීක්ෂා කිරීමෙන් පසුව ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය (TID) විසින් තමාව අත්අඩංගුවට ගෙන මාස නවයකට ආසන්න කාලයක් රක්ෂිත බන්ධනාගාරයේ සහ රැඳවුම් භාරයේ තබා ගෙන සිටි බවත්, තමාට විභාගවලට පෙනී සිටීමට තිබූ බැවින් සහ පවුල රැකබලා ගැනීමට ඉක්මනින් නිදහස් වීමේ දැඩි අවශ්‍යතාවයක් තිබූ බැවින්, පොලිසියට පැවසූ දේම මහේස්ත්‍රාත්වරයා ඉදිරියේ ප්‍රකාශ කළහොත් ඉක්මනින් එළියට යන්න පුළුවන් බවට TID නිලධාරීන් දුන් උපදෙස් මත ඔහු මහේස්ත්‍රාත්වරයා ඉදිරියේ 127 වගන්තිය යටතේ ප්‍රකාශයක් ලබා දී පසුව නිදහස් වූ බවටත් පවසා සිටින ලදි. කෙසේ වෙතත් ‘‘මෙහෙම මෙහෙම

කියන්න ඕනේ'' යැයි TID නිලධාරීන් තමාට කියලා දුන්නේ නැති බවත් සාක්ෂිකරු තම සාක්ෂියේදී පවසා ඇත.

මෙම සාක්ෂිකරුගෙන් 4, 9, 11 සහ 14 වන චුදිතයන් විසින් හරස් ප්‍රශ්න අසන ලදී.

4 වන චූදිතගේ හරස් ප්‍රශ්නවලට පිළිතුරු ලබා දෙමින් මෙම සාක්ෂිකරු පවසා සිටියේ තමා මෙම වැඩසටහන් මාලාවට සහභාගී වෙන්නට ගිය පුද්ගලයෙක් නොවෙන බවත්, එම වැඩසටහනේ තේ පැන් සංග්‍රහය කිරීම සඳහා ගිය බවත්, කෙසේ නමුත්, එම වැඩමුලුවෙ තමා හිටපු කාලයේදී තම විසින් දුටු දේවල් සම්බන්ධව තම සාක්ෂි දෙන බවටය. තවද, ''එහෙම පල්ලි කඩන්න එන කට්ටියත් එක්ක තමයි එහෙම සටහන් කරන්න ඕනෙ. යුද්ධ කරන්න ඕනෙ. ඔවුන්ව මරන්න අවශ්‍යතාවයක් ආවොත් ඒ මරන්නත් ඕනෙ'' යැයි එම දේශනාවේදී පැවසූ බවට සාක්ෂිකරු පවසා ඇත. තවද, '' සාමාන්‍ය පුද්ගලයන්ව මරන්න ඕනෙ කියලා කිව්වේ නැහැ. කියලා ඔබට මතකයක් තිබෙනවාද. සාමාන්‍ය ඉන්න තැනැත්තන්ව මරන්න ඕන කියලා එම ස්ථානයේදී කිව්වේ නැහැ කියලා කිව්වොත් ඔබ ඒක පිළිගන්නවද? ලෙස අසන ලද ප්‍රශ්නයට සාක්ෂිකරු මට ඒක මතක නැහැ යනුවෙන් උත්තර ලබා දී ඇත.

9 වන චූදිත විසින් හරස් ප්‍රශ්න ඇසීමේදී '' ඔය සහජීවනය කරගෙන රටේ නැත්තේ බොදුබල සේනා යන සංවිධානවල් මුස්ලිම් විරෝධී

ක්‍රියාවන් සිදු කරන නිසාත් ඔය හිජාබ්, හලාල් වැනි ප්‍රශ්නවල් අනවශ්‍ය ලෙස අවුස්සන නිසාත් කියලා කියපු එකක් මතකද? ” ලෙස අසන ලද ප්‍රශ්නයට සාක්ෂිකරු ඔව් ලෙස පිළිතුරු ලබා දී ඇත. තවද, “ දිගන සහ අලුත්ගම වැනි ප්‍රදේශවල සිදු වූ ප්‍රශ්නවලත් ඥාණසාර හාමුදුරුවෝ යන පුද්ගලයෙක් ගැන මම කතා කරලා ඒ අය ඇති කරන ප්‍රශ්න නිසා එම අවස්ථාවේදි අපේ රටේ සහජීවනයක් නැහැ. කියලා මම කියපු දෙයක් මතකද?” ලෙස අසන ලද ප්‍රශ්නයටත් “ඒ සිදුවීම ගැන කිව්වා” ලෙස සාක්ෂිකරු පිළිතුරු ලබා දී ඇත. 9 වැනි චූදිත විසින් “ මුස්ලිම් රටක් නොවන බෞද්ධ රටක් වන ශ්‍රී ලංකාවේදී ඔය වගේ මුස්ලිම් පිරිසට හිරිහැර ඇතිවනකොට මෙම මුස්ලිම් නොවන රටක අපට ජීවත් වීමට හැකියාවක් නැහැ. ”, “ අපි නිකන් ඉද්දී අපිත් එක්ක නිකන් රණ්ඩුවට, සටහනට එන මිනිසුන් සමඟ ආත්මාරක්ෂක විදියට තමයි සටන් කිරීමට අනුමැතිය තියෙන්නේ. ’’ ලෙස එම දේශනාවලදී ප්‍රකාශ කළ බවට මතක තිබේදැයි සාක්ෂිකරුගෙන් ඇසූ අතර ඒ සම්බන්ධයෙන් නිශ්චිත මතකයක් නොමැති බවට සාක්ෂිකරු පවසා ඇත. 09 වන විත්තිකරු මෙම සාක්ෂිකරුට යෝජනා කර ඇත්තේ මෙම සාක්ෂිකරු දවස් 04 ක් එම වැඩ සටහනට සහභාගී වුනේ සවස් වෙලාවේ බැවින් එහි සිදු කල දේශනාවන් වල සම්පූර්ණයෙන්ම සඳහන් කලේ කුමක්ද යන්න මෙම සාක්ෂිකරුට හැකියාවක් නොමැති බවට වුවද සාක්ෂිකරු එයට පිළිතුරු දෙමින් පවසා ඇත්තේ තමා පවසා සිටින්නේ සම්පූර්ණයෙන්ම සවස් වරුවේ තමා ගොස්

අහපු දේවල් බවයි. මෙම 09 වන චූදිත එදින තමා විසින් පවත්වන ලද දේශනයේදී තමා බෝම්බ ගහන්නේ කෙසේද යන්න හෝ අහිංසක මිනිස්සු මරන ලෙසට පැවසීමක් හෝ අවි පුහුණුවක් ලබා දීමක් හෝ බෝම්බ ප්‍රහාරයක් ශ්‍රී ලංකාවේ සිදු කිරීමට මෙම සාක්ෂිකරු ඉදිරියේ දී සිදු නොකල බවට කරන ලද යෝජනාව සාක්ෂිකරු පිළිගෙන ඇත.

මෙම සාක්ෂිකරුගෙන් 11 වන චූදිත හුසෙයිනුල් රිස්වි කාලිද් සමීර් විසින්ද හරස් ප්‍රශ්න අසා ඇති අතර, සාක්ෂිකරු 11 වන චූදිතව TID එකේදි දුටු බවත්, තමාලා එකට සිටි බවත් පවසා ඇති අතර, මෙම සාක්ෂිකරුගෙන් 11 වන චූදිත අසා ඇත්තේ මෙම සාක්ෂිකරු මෙන්ම මහේස්ත්‍රාත්වරයාට 127 වගන්තිය යටතේ ප්‍රකාශයක් දෙන්න ඕනෑ යැයි පවසා 11 වන චූදිත වන තමාවද මෙම සාක්ෂිකරු සමඟ තියාගෙන සිටිය බවට වුවද එයට පිළිතුරු දෙමින් සාක්ෂිකරු පවසා ඇත්තේ එවැනි ක්‍රියාවලියක් සිදු වන බව තමා දන්න බවත් 11 වන චූදිත එලෙස ප්‍රකාශයක් ලබා දීමට කැමැත්තෙන් සිටින බවට 11 වන චූදිත තමාට පවසා තිබෙන බවත් එම ප්‍රකාශය ලියුවාද නැද්ද තමා දන්නේ නැති බවත් සාක්ෂිකරු පවසා ඇත. තවදුරටත් හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් සාක්ෂිකරු පවසා ඇත්තේ දිගන හා අළුත්ගම ප්‍රදේශවල සිද්ධීන් වලින් පීඩාවට පත් වුනේ මුස්ලිම් ජනතාව බවත්, පාස්කු සිද්ධි මාලාවෙන් වැඩිපුරම පීඩාවට පත් වුනේ ක්‍රිස්තියානි ජනතාව බවත් දිගන හා අළුත්ගම ප්‍රදේශවල සිදු වුන

සිද්ධීන් සිදු කලේ ක්‍රිස්තියානි ජාතිකයින් යැයි කියන්න තමාට බැරි බවත්, එය කලේ කවුද යන්න තමා දන්නේ නැති බවත් සාක්ෂිකරු පවසා ඇත.

මෙම සාක්ෂිකරුගෙන් 14 වන චූදිත රෂීඩ් මොහොමඩ් ඉබ්‍රාහිම් විසින්ද හරස් ප්‍රශ්න අසා ඇති අතර, එහිදී සාක්ෂිකරු පවසා ඇත්තේ තමා 14 වන චූදිතගේ පොඩි පුතා සමග එකට ඉගෙන ගත්ත බවත්, තමා 14 වන චූදිතගේ නිවසටද ගොස් තිබෙන බවත් රාමසාන් උපවාස කාලයේදී දෙල්ගහගොඩ ජුම්මා පල්ලියේදී මෙන්ම තමාගේ පාසැලේ පවත්වන ලද වැඩසටහන් වලදී ද 14 වන චූදිත විසින් දේශනා පවත්වා ඇති බවක් එකී දේශනාවන් වලදී 14 වන චූදිත නීතිවිරෝධි දේවල් ගැන කිසිවක් හෝ පවසා නැති බවත් ඔහු එලෙස දේශනාවන් පැවැත්වූ නිසා තම ගමේ ප්‍රශ්න හෝ ආරවුල් ඇති වී නැති බවත්ය.

මෙම සාක්ෂිකරුගෙන් පැමිණිල්ල විසින් නැවත ප්‍රශ්න අසා ඇති අතර එම ප්‍රශ්නවලට පිළිතුරු ලබා දෙමින් සාක්ෂිකරු පවසා සිටියේ තමා විමර්ශන කටයුතුවලදී ත්‍රස්ත මර්දන සහ විමර්ශන කොට්ඨාසයේ නිලධාරීන්ට සහ උගත් මහේස්ත්‍රාත්තුමාට ප්‍රකාශ ලබා දී ඇති බවත් එම ප්‍රකාශවල කිසිවිටෙක බොරුවක් පවසා නොමැති බවත්ය.

මාවනැල්ල, දෙල්ගහගොඩ තව්හීද් පල්ලියේ පැවති

පුහුණු මධ්‍යස්ථානයක් සම්බන්ධ සාක්ෂි

විශ්ලේෂණය සහ නිගමනය

මෙම සාක්ෂිකරුගේ සාක්ෂියෙන් පෙනී යන්නේ Sri Lanka Islamic Student Movement මඟින් වැඩමුළුවක් දෙල්ගහගොඩ, තවුහීද් පල්ලියේදී සංවිධානය කර ඇති බවත්, එම වැඩමුළුව සංවිධානය කිරීම සඳහා මෙම නඩුවේ 04 වන චූදිත වන මොහොමඩ් ඊබ්‍රාහිම් සාදික් අබ්දුල්ලා යන අය සහ මොහොමඩ් ඊබ්‍රාහිම් සාහිඩ් අබ්දුල් හක් යන අය කටයුතු කළ බවත්, එම වැඩමුළුවට සිසුන් 40 දෙනෙකු පමණ සහභාගී වී ඇති බවත් පෙනී යයි. එම වැඩමුළුවේදී මෙම නඩුවේ 04 වන චූදිත වයිට් බෝඩ් සහ ප්‍රොජෙක්ටර් භාවිතා කරමින් සන්නද්ධ පුද්ගලයන්ගේ සහ යුධ උපකරණ වල ඡායාරූප පෙන්වමින් පලස්තීනය වැනි අරාබි රට වල සහ ඉස්ලාම් ඉතිහාසයේ යුද්ධ පිළිබඳව කරුණු පැහැදිලි කර දී ඇත. තවද, තම දේශනා වලදී " මුස්ලීම් නොවන රටක් මුස්ලීම් රටක් බවට පත් කරනවා නම් අපි යුද්ධයක් කරන්න ඕනේ. අපි යුද්ධයක් පටන් ගන්න යන්නේ " ලෙස පවසා ඇති අතර, අනෙක් ආගම් වල අයට විරුද්ධව මෙම යුද්ධයේදී මියයන පුද්ගලයන් කෙලින් ස්වර්ගයට යන බවද පවසා ඔවුන්ගේ සංවිධානය සමඟ එක්වී අවසානය තෙක් රැඳී සිටින ලෙසට ඉල්ලා ඇත.

මෙම වැඩමුළුවේ මෙම නඩුවේ 09 වන චූදිත වන මොහොමඩ් රමීෂ් මොහොමඩ් සාජිත් යන අයද දේශනා පවත්වා ඇති අතර, ඔහුගේ දේශනයේදී ‘‘සහජීවනය කියල එහෙම දෙයක් නැහැ, ආගම් අතර එහෙම සහජීවනයක් පැවැත්වෙන්න බැහැ,’’ යනුවෙන් පවසා ඇති අතර, ‘‘මුස්ලිම් රටක් නොවන රටක මුස්ලිම් කට්ටියට ජීවත් වෙන්න බැහැ’’ ලෙසට ප්‍රකාශ කර ‘‘ එසේම මුස්ලිම් රටක් නොවනවා නම් ඒ රට මුස්ලිම් රටක් විධියටම අපි චේන්ජ් කරන්න ඕනෑ.’’ ලෙසද ‘‘එසේම මේ අප ඉන්න රට මුස්ලිම් රටක් නොවන නිසා මේ රට මුස්ලිම් රටක් බවට අප පවත්වාගන්න ඕනෑ.’’ ලෙසටද දේශනා පවත්වා ඇත.

මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය පරීක්ෂා කිරීමේදී පෙනී යන්නේ, හිඟුල, දෙල්ගොඩ ප්‍රදේශයේ පිහිටි තවුහීද් ජමාත් පල්ලියේ මෙම නඩුවෙහි 04, 05, 09 සහ 14 චූදිතයින් එක්ව දිවයිනේ විවිධ ප්‍රදේශ වලින් පැමිණි තරුණ සිසුන් 40 කට වැඩි ප්‍රමාණයකට දින 05 ක අන්තවාදී වැඩමුළු පවත්වා ඇති බවත් ය.

සමන්තුරේ සෙන්නල් ග්‍රාමය යන ප්‍රදේශයේ තිබූ ආරක්ෂිත නිවසක් සම්බන්ධ සාක්ෂි

පැ.සා.2234 ස්මයිල් ලෙබ්බේ අබ්දුල් රහීම් යන අය සාක්ෂි දෙමින් පවසා සිටියේ, ඔහු සමන්තුරේ සෙන්නල් ග්‍රාම 01, අංක 170/18 දරණ ලිපිනයේ පදිංචිව සිටින බවත්, රැකියාවක් ලෙස කඩයක් පවත්වාගෙන ගිය බවත්, එම ගමේම තමාට අලුතින් නිවසක් සාදා ගෙන ගිය බවත්, එම නිවස සම්පූර්ණ කර නොතිබූ බවත්, නමුත් එම නිවසේ ගරාජය සම්පූර්ණ කර තිබූ බවත්, එම ගරාජ් කාමරයට අඩි 10 ක් පළළ අඩි 12 ක් උස පහළට ඇදීමට හැකි ගේට්ටුවක් සවිකර තිබූ බවත්, 2019.04.21 වන දින පාස්කු ඉරු දින බෝම්බ ප්‍රහාරයට දින 15 කට පමණ පෙර උදෑසන තමා තමාගේ වෙළඳසැලෙහි සිටින විට පුද්ගලයෙකු පැමිණ අම්පාර ප්‍රදේශයේ පාවහන් ව්‍යාපාරයක් සිදු කරගෙන යන බව පවසා තමාගෙන් ඒ අවට නිවසක් කුලියට ගැනීමට තිබේදැයි විමසූ බවත්, තමා නිවාස කුලියට නොමැති බව පැවසූ බවත්, ඉන් දවස් 10 කට පමණ පසුව නැවතත් එම පුද්ගලයා පැමිණි බවත්, ඒ වෙලාවේ ඔහුත් සමඟ කාන්තාවක්ද පැමිණි බවත්, එලෙස පැමිණි ඔහුගේ බිරිඳට දරුවෙකු ලැබීමට සිටින බවත්, ඔවුන් දැනට මරදමුනෙයි ප්‍රදේශයේ පදිංචි වී සිටින බවත්, එම නිවසෙහි බඩු තබා ගැනීමට ප්‍රමාණවත් ඉඩපහසුකම් නොමැති බැවින් කාමරයක් කුලියට ගැනීම සඳහා සොයන බවට පැවසූ බවත්, තමාගේ අලුතින් සාදන ලද නිවසෙහි ඇති ගරාජ් කාමරය එම තැනැත්තාට

මසකට රුපියල් 5000/- ක මුදලකට කුලියට ලබා දුන් බවත්, එම කාමරය ඔහු විසින් කුලියට ලබා ගැනීමෙන් පසුව අලුත් ඉබි යතුරක් දමා ගත් බවත්, ඉන්පසුව තමා ඔහුව නොදුටු බවත්, කුලියට දුන් ගරාජ් කාමරයට කුමන භාණ්ඩ රැගෙන පැමිණියාදැයි තමා නොදන්නා බවත්, දින 10 කට පසුව ඔහු නැවත යතුරු පැදියකින් තමාගේ වෙළඳසැල අසළට පැමිණි බවත්, ඒ අවස්ථාවේදී ඔහුගේ දුරකථන අංකය තමාට ලබා දුන් බවත්, ඉන්පසුව අම්පාරේ යන බව පවසා පිටව ගිය බවටත් සාක්ෂි ලබා දෙන ලදි. පසුව අම්පාර පොලිසියෙන් පැමිණ තමා විසින් ගරාජ් කාමරය කුලියට ලබා දීම සම්බන්ධයෙන් විමර්ශනය කළ බවත්, ඒ අවස්ථාවේදී තමාගේ ගරාජ් කාමරය කුලියට ගත් පුද්ගලයාගේ නම නියාස් ලෙසට තමා දැන ගත් බවත්, තමා විසින් ඔවුන්ට තමාගේ ගරාජ් කාමරය පෙන්වූ බවත්, පොලිස් නිළධාරීන් විසින් එම ගේට්ටුවෙහි ඉබි යතුරු කඩා දමා විවෘත කළ බවත්, පොලිස් නිළධාරින්, යුධ හමුදා ,නාවික හමුදා සහ තවත් ආරක්ෂක අංශ වලට දැනුම් දුන් බවත්, එලෙස පොලිසිය විසින් එම කාමරය පරීක්ෂා කරන ලද දිනයේ සයින්දමරදු ප්‍රදේශයේ නිවසක බෝම්බයක් පුපුරා ගිය බව තමා දැන ගත් බවත්, පොලිස් නිලධාරීන් විසින් එම ගරාජ් කාමරය විවෘත කිරීමෙන් පසුව ඒ තුළ භාණ්ඩ තොගයක් තිබූ බවත්, ඒවා තමාගේ භාණ්ඩ නොවන බවටත් සාක්ෂි ලබා දී ඇත. මෙම සාක්ෂිකරුට සංයුක්ත තැටියක අඩංගු කර තිබූ ඡායාරූපයක් පෙන්වා සිටි අතර, එම ඡායාරූපයේ සිටි පුද්ගලයා තමාගේ ගරාජ් කාමරය කුලියට ගත්

නියාස් යන පුද්ගලයා ලෙසට හඳුනා ගෙන ඇති අතර,එම ඡායාරූපය පැ.829(A) ලෙසට පැමිණිල්ල විසින් ලකුණු කරන ලදි.

පැ.සා. 1627, නියෝජ්‍ය පොලිස්පති **සාමන්ත දීපාල් විජේසේකර** යන අය මෙම අධිකරණයේ සාක්ෂි ලබා දී ඇති අතර, ඔහුගේ සාක්ෂියට අනුව ඔහු 2019 අප්‍රේල් මාසය වන විට අම්පාර කොට්ඨාශය භාර පොලිස් අධිකාරි ලෙස කටයුතු කර ඇති අතර, 2019.04.21 වන දින සිදුවූ පාස්කු ඉරු දින ප්‍රහාරයෙන් දින 05 කට පසුව රාජ්‍ය බුද්ධි සේවයේ ස්ථානාධිපතිගෙන් ලැබුණු තොරතුරක් මත සමන්තුරෙයි ෆවුස් මාවතේ සෙන්නල් ග්‍රාමය යන ප්‍රදේශයේ අංක 77/ඒ, දරණ නිවස පරීක්ෂාවට ලක් කිරීමට පියවර ගෙන ඇති අතර, එදින එම නිවසේ තිබී ගරාජය තුළ තිබී පුපුරණ ද්‍රව්‍ය, බයිසිකල් බෝල, රසායනික ද්‍රව්‍ය අඩංගු විශාල භාණ්ඩ තොගයක් මෙම සාක්ෂිකරුගේ අධීක්ෂණය යටතේ සොයා ගෙන ඇත.

පැ.සා. 1988 සහකාර පොලිස් අධිකාරී දඩල්ලගේ ටරෝෂන් ලසන්ත යන අය සාක්ෂි ලබා දෙමින්, 2019 අප්‍රේල් 26 වන දින සමන්තුරේ සෙන්නල් ග්‍රාමයේ පිහිටි ස්මයිල් ලෙබ්බේ නමැති අයගේ නිවසේ සැකකටයුතු ද්‍රව්‍යයක් සඟවා ඇති බවට ලද දැනුම් දීමක් අනුව තමා සොකෝ නිළධාරීන්, නිල සුනඛ අංශයේ නිළධාරීන් සහ විශේෂ කාර්ය බලකා නිළධාරීන් කණ්ඩායමක්ද සමඟ එදින පැය 15.00 ට පිටවීමේ සටහන් යොදා පො.කොා.රි 80843 අසේල නිළධාරියා විසින් පදවන ලද

අංක KO-198 දරණ ජීප් රථයෙන් පිටත්ව අදාළ නිවස වෙත ගිය බවත්, එම නිවස මහල් 02 කින් සමන්විත නිවසක් වන අතර, එය පරීක්ෂා කිරීමෙන් කිරීමේදී ඒ තුළ තිබී කිසිදු නීතිවිරෝධී දෙයක් සොයා ගැනීමට නොහැකි වූ බවත්, එම නිවසට ඉදිරිපසින් ගරාජයක් වැනි කොටසක් තිබූ බවත්, ඉන්පසු එම වසා තිබූ ගරාජ් කොටස පරීක්ෂා කිරීමට යාමේදී එය රෝලර් ගේට්ටුවක් දමා වසා තිබූ බවත්, නිවසේ හිමිකාර අබ්දුල් රහීම් යන අයගේ කැමැත්ත ඇතිව තමන්ලා විසින් එම ගරාජය විවෘත කර පරීක්ෂා කළ කිරීමේදී ඒ තුළ පුපුරණ ද්‍රව්‍ය , බයිසිකල් බෝල, පුපුරණ ද්‍රව්‍ය නිර්මාණය කිරීමට උපයෝගී කරගන්නා උපකරණ සහ විවිධ රසායනික ද්‍රව්‍ය ගබඩා කර තිබූ බවටත් පවසා සිටින ලදි. විශේෂ කාර්ය බලකා නිළධාරීන් ලවා එම ද්‍රව්‍ය එකිනෙක සූක්ෂම ලෙස උපක්‍රමශීලීව පරීක්ෂා කළ බවත්, එම පරීක්ෂා කිරීම් සිදු කරන අවස්ථාවේ උ.පොෙ.ප. ප්‍රගලාදන් නිළධාරියා සහ පොෙ.සැ. 40563 දසනායක නිළධාරියා එම ස්ථානයේ සිටි බවත්, ඉන් පසු එහි සඟවා තිබූ අධි පුපුරන ද්‍රව්‍ය, බයිසිකල් බෝල සහ රසායනික ද්‍රව්‍ය තමන්ගේ භාරයටගත් බවටත් සාක්ෂි ලබා දෙන ලදි.

ඉන්පසුව පැය 5.40 ට පමණ නින්දවූර් ප්‍රදේශයේ නිවසකද තවත් මෙවැනිම ආකාරයේ පුපුරණ ද්‍රව්‍ය ගබඩා කර ඇති බවට තොරතුරක් ලැබුණු බවත්, තමා ඒ සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම සඳහා ඒ ස්ථානයෙන් පිටත් වූ බවත්, කෙසේ වුවද, අදාළ නිවසින් සොයා ගන්නා ලද භාණ්ඩ

පොලිස් ස්ථානය වෙත රැගෙන යන ලෙසට පොලිස් අධිකාරි සාමන්ත විජේසේකර මහතාට තමා දැනුම් දීමක් කළ බවය.

තවද, මෙම නඩුවේ සාක්ෂි ලබා දුන් පැ.සා. 2254 සමන් කුමාර යන අයගේ සාක්ෂිය අනුව 2019.04.20 වන දින පානදුර පරත්ත පාර නිවසේ සිට භාණ්ඩ තොගයක් නැගෙනහිර ප්‍රදේශයට එනම්, කල්මුණේ, සමන්තුරේ සෙන්නල් ග්‍රාම යන ප්‍රදේශයේ පිහිටි නිවස්වලට රැගෙන ගොස් ඇති අතර, එම භාණ්ඩ පරත්ත පාර නිවසින් පැ.සා. 2254 සමන් කුමාර යන සාක්ෂිකරුගේ වාහනයට පටවා ගැනීමේදී පෙට්ටියක් තුළ තිබී ලෝහ බෝල එනම්, බයිසිකල් බෝල වැටුණු බවට සඳහන් කර ඇත.

<u>අංක 77/ඒ, ෆවුස් මාවත, සමන්තුරේ සෙන්නල් ග්‍රාමය යන ප්‍රදේශයේ තිබූ ආරක්ෂිත නිවසක් සම්බන්ධ සාක්ෂි විශ්ලේෂණය සහ නිගමනය</u>

මෙම නඩුවේ අංක 77/ඒ, ෆවුස් මාවත, සමන්තුරේ සෙන්නල් ග්‍රාමය දරණ ලිපිනයේ පිහිටි ආරක්ෂක ස්ථානයක් සම්බන්ධව සාක්ෂි හෙළි වී ඇත. මෙම ස්ථානය එම ගම්මානයේ පදිංචි වී සිටි පැ.සා.2234 ස්මයිල් ලෙබ්බේ අබ්දුල් රහීම් යන අයට අයත් අලුතෙන් සාදාගෙන නිවසේ ගරාජ්

කොටසක් වන අතර, නියාස් යන තැනැත්තකු විසින් එම ගරාජ් කාමරය කුලියට ගෙන ඇත. එලෙස කුලියට ලබා ගෙන ඇත්තේ 2019.04.21 වන දින සිදුවූ පාස්කු ඉරු දින බෝම්බ ප්‍රහාරයට දින 15 කට පමණ පෙර බවත්, ඉන්පසු 2019.04.26 වන දින ආරක්ෂක නිළධාරීන් හට ලැබුණු තොරතුරක් මත එම ස්ථාන ආරක්ෂක නිළධාරීන්ගේ පරීක්ෂාවට ලක් වී ඇත. එම අවස්ථාවේදී අදාළ නිවස තුළ ගරාජ් කාමරය තුළ තිබී විශාල පිපුරුම් ද්‍රව්‍ය තොගයක් සොයා ගෙන ඇත. 2019.04.20 වන දින පානදුර, පරත්ත පාරේ පිහිටි 'නස්මියා විලා' නමින් හැඳින්වූ නිවසකින් මෙම ස්ථානයට භාණ්ඩ තොගයක් රැගෙනවිත් ඇති බවට කරුණු අනාවරණය වී ඇත. 2019.04.21 වන දින සිදුවූ පාස්කු ඉරු දින බෝම්බ ප්‍රහාරයෙන් පසුව පානදුර, පරත්ත පාරේ පිහිටි එම නිවස ආරක්ෂක නිළධාරීන්ගේ පරීක්ෂාවට ලක් වී ඇති අතර, එම නිවසින් සොයා ගෙන ඇති යම් භාණ්ඩ මත පුපුරණ ද්‍රව්‍ය ශේෂ හඳුනා ගෙන ඇත. තවද, ලෝහ බෝල ඇසුරුම් කිරීමට භාවිතා කරන හිස් බෑග් විශාල තොගයක් සොයා ගෙන ඇති අතර, එම නිවසින් 2019.04.20 වන දින පැ.සා.2254 සමන් කුමාර යන අය විසින් භාණ්ඩ පටවා ගැනීමේදී ලෝහ බෝල වැටෙනවා නිරීක්ෂණය කර ඇත. මෙම ලෝහ බෝල 2019.04.21 වන දින පාස්කු ඉරු දින ප්‍රහාරයේදී පාවිච්චි කරන ලද පිපුරුම් උපකරණ වලට යොදා ගෙන ඇති ලෝහ බෝල වලට බරින් සහ විෂ්කම්භයෙන් සමාන බව ආණ්ඩුවේ රස පරීක්ෂක සාක්ෂි මඟින් කරුණු තහවුරු වී ඇත. මෙම සාක්ෂි

දෙස අවධානය යොමු කළ විට පානදුර පරත්ත පාර නිවස සහ මෙම ස්ථානය එනම්, සෙන්නල් ග්‍රාමයේ පිහිටි මෙම ස්ථානය පරිහරණය කර තිබෙන පුද්ගලයන් අතර යම් සම්බන්ධතාවයක් තිබී ඇති අතර, ඔවුන් යම් වරදක් කිරීමේ පොදු අරමුණින් කණ්ඩායමක් ලෙස කටයුතු කර ඇති බවට නිගමනය කළ හැකිය. එම තැනැත්තන් විසින් සෙන්නල් ග්‍රාමයේ පිහිටි මෙම ස්ථානය පිපුරුම් ද්‍රව්‍ය සඟවා ගැනීමට පාවිච්චි කර ඇති බවටද පෙනී යයි.තවද, පානදුර, පරත්ත පාරෙහි පිහිටි නිවස මොහොමඩ් අසාම් මොහොමඩ් මුබාරක් යන අය විසින් බදු ගිවිසුමක් මත කුලියට ලබා ගෙන තිබූ අතර, එම ගිවිසුමට මෙම නඩුවේ 06 වන චූදිත වන මොහොමඩ් අන්වර් මොහොමඩ් රිස්කාන් යන අය සාක්ෂිකරුවකු ලෙස අත්සන් කර ඇති අතර, ඉන්පසුවත් 06 වන චූදිත එම ස්ථානයේ නැවතී සිටි බවටද සාක්ෂි මඟින් අනාවරණය වී ඇත. එකී පානදුර, පරත්ත පාර නිවසෙහි අයිතිකරු වන පැ.සා.2244 අබ්දුල් සතාර් මොහොමඩ් ඉල්හාම් 06 වන චූදිත එම නිවසේ සිටිනවා දැක ඇති අතර, 06 වන චූදිතගේ ඇඟිලි සටහන් එම නිවසේ තිබී සොයා ගෙනද ඇත. ඊට අමතරව මෙම නඩුවේ 07 වන චූදිත වන මොහොමඩ් මන්සූර් මොහොමඩ් සනස්දීන් යන අයගේ ඇඟිලි සළකුණුද පානදුර පරත්ත පාරේ නිවසේ තිබී සොයා ගෙන ඇත. එවැනි පසුබිමක් තුළ ඉහත සඳහන් මුබාරක් යන බෝම්බකරුත් සමඟ මෙම නඩුවේ 06 වන සහ 07 වන චූදිතයන් සම්බන්ධතාවයක් පවත්වාගෙන

ගොස් ඇති බවට සහ යම් වරදක් කිරීමේ පොදු අරමුණින් සංවිධානාත්මක ලෙස කටයුතු කර ඇති බවට සාධාරණව නිගමනය කළ හැකිය.

පැ.සා. අංක 2306. පොා.ප. මොහිදීන් මොහොමඩ් ජේසුලි යන අය සාක්ෂි ලබා දෙමින් තමා, 2019 වර්ෂයේ කාත්තන්කුඩි පොලිස් ස්ථානයට අනුයුක්තව උප පොලිස් පරීක්ෂකවරයෙක් වශයෙන් සේවය කරමින් සිටියදී 2019 අප්‍රේල් 17 වන දින යතුරු පැදියක් ගිනි තබා අනර්ථයක් සිදු කළ බවට ලද පැමිණිල්ලක් අනුව ස්ථානාධිපති, පොලිස් පරීක්ෂක නිශාන්ත ප්‍රභාත් කස්තුරිආරච්චි මහතාද සමඟ කාත්තන්කුඩි කිරිතෝන ප්‍රදේශයට ගිය බවත්, එම අවස්ථාවේ රාත්‍රී කාලය බැවින් විදුලි පන්දම් එළියෙන් නිරීක්ෂණය කිරීම් සිදු කළ බවත්, එහිදී යතුරු පැදියක් පුපුරවා හැරීමක් සිදු කර ඇති බවට නිරීක්ෂණය වූ බවත්, ඉන් පසුව එම ස්ථානය අවට ආරක්ෂා කිරීම සඳහා පොා.කොා. 76624, පොා.කොා.79586 යන නිළධාරීන් යෙදූ බවත්, පසු දින එනම්, 2019.04.18 වන දින එම ස්ථානය පරීක්ෂා කිරීම සඳහා සොකෝ නිළධාරීන් කැඳවා තමාද එම ස්ථානයට පිටත් වූ බවත්, සිදු වූ යතුරුපැදි පිපිරීම පරීක්ෂා කර වැසි අංකය (ME4JF396FF8007612) අනාවරණය කරගත් බවත්, එම යතුරුපැදියේ කොටස් (පැ.1722) සහ පස් සාම්පල් (පැ.1723) මඩකලපුව මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කර ඇති බවත්, එම වැසි අංකය ඔස්සේ පරීක්ෂා කිරීමේදී ව්‍යාජ හැඳුනුම්පතක් (Gerard Yasasthi de Silva නමින්) භාවිතා

කර මෙම යතුරුපැදිය මිලදී ගෙන ඇති බවට අනාවරණය කරගත් බවටත් සඳහන් කර තිබේ.

මෙම සාක්ෂිකරුගෙන් 02,07,08,10,15,18 සහ 19 චූදිතයන් වෙනුවෙන් නීතීඥ කනිල් මද්දුමාගේ මහතා විසින් හරස් ප්‍රශ්න අසා ඇති අතර, එම ප්‍රශ්න වලට පිළිතුරු දෙමින් සාක්ෂිකරු කියා සිටියේ, මොහොමඩ් සරීබු ආදම් ලෙබ්බේ නොහොත් ගපූර් මාමා නමැති තැනැත්තකු 2019.04.26 වන දින කාත්තන්කුඩිය පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන පැය ගණනක් රඳවා තබා ගෙන ඉන්පසු වැඩිදුර විමර්ශන සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට භාර දුන් බවය. තවද, එලෙස ඔහුව කාත්තන්කුඩි පොලිසියේ රඳවා ගෙන සිටියදී මෙම සාක්ෂිකරු සහ තවත් නිළධාරීන් විසින් ඔහුට පහර දුන් බවට කරන ලද යෝජනාව සාක්ෂිකරු විසින් ප්‍රතික්ෂේප කර ඇත.

03 වන චූදිත විසින්ද මෙම සාක්ෂිකරුව හරස් ප්‍රශ්න වලට භාජනය කර ඇති අතර, 2019 වර්ෂයේදී නව කාත්තන්කුඩිය, මොහිදීන් ජුම්මා පල්ලිය මාවතේ පිහිටි 03 වන චූදිතගේ නිවසට මෙම සාක්ෂිකරු තවත් නිළධාරීන් කණ්ඩායමක් සමඟ පැමිණ එහි තිබූ Pulsar 150 වර්ගයේ යතුරු පැදියක් රැගෙන යාම සම්බන්ධයෙන් මතකයක් තිබෙනවාදැයි ප්‍රශ්න කළ අතර, ඒ සම්බන්ධයෙන් විශේෂ මතකයක් නැති බවට සාක්ෂිකරු පවසා සිටින ලදි.

මෙම සාක්ෂිකරුගෙන් අනෙකුත් චූදිතයන් විසින් හරස් ප්‍රශ්න අසා නොමැත.

පැ.සා. 2007 ක්‍රිෂ්ණපිල්ලෙයි රවිචන්ද්‍රන් යන අය සාක්ෂි දෙමින් පවසා සිටියේ, තමා 1989.12.18 වන දින පොලිස් සේවයට බැඳුනු බවත්, දැනට අවුරුදු 15 ක පමණ කාලයක් මඩකලපුව අපරාධ ස්ථාන පරීක්ෂණාගාරයට අනුයුක්තව සේවය කරන බවත්, 2019.04.18 වන දින කාත්තන්කුඩි පොලිසිය විසින් කාත්තන්කුඩි පොලිස් වසම තුළ පිහිටි අපරාධ ස්ථානයක් සම්බන්ධව දැනුම් දුන් බවත්, එම ස්ථානය පරීක්ෂා කිරීම සඳහා තමා පොලිස් කණ්ඩායමක් සමඟ එම ස්ථානයට ගිය බවත්, එම ස්ථානය කාත්තන්කුඩි පොලිස් වසම තුළ පිහිටි පාළමුණේ කිරිතෝනා වත්ත නමින් හඳුන්වන ප්‍රදේශය බවත්, අපරාධ ස්ථානය මොහොමඩ් මුස්තාෆා හසනුල් ෆස්රි යන තැනැත්තෙකුට අයත් ඉඩමක් බවත්, එම ඉඩමේ මායිම් කොන්ක්‍රීට් කණු සිටුවා අමානෝ ෂීට් වලින් වට කර තිබූ බවත්, එම ස්ථානය වැලි සහිත ඉඩමක් බවත්, එම ඉඩමේ එක් පැත්තක මීටර් 200 ක් දුරින් මුහුද පවතින බවත්, ඉඩමේ තවත් පැත්තක හමුදා කඳවුරක් පිහිටා තිබූ බවත්, එම ඉඩම තුළ සවුක්කු ලෙස හඳුන්වන ගස් එනම්, ෆයිනස් ගස් තිබූ බවත්, තමා එම ස්ථානයට යන විට එම ස්ථානයේ කාත්තන්කුඩි පොලිසියේ ස්ථානාධිපති කස්තුරිආරච්චි, විමර්ශන නිළධාරීන් උ.පොා.ප. මොහොමඩ්, පොා.කොා. 76624 දිසානායක, පොා.කොා. 79586 මොහොමඩ් යන නිළධාරීන් සිටි බවත්, තමා එම භූමියට

ගොස් අපරාධය සිදු වූ බවට පෙන්වා දුන් ස්ථානයක් පරීක්ෂා කළ බවත්, තමාට කාත්තන්කුඩි පොලිස් ස්ථානය විසින් දැනුම් දී තිබුනේ ගිනි තැබීමක් සිදු වූ බවට වුවද, එම ස්ථානය නිරීක්ෂණය කරන අවස්ථාවේ එහි තිබූ අමානෝ ෂීට් තහඩු විසි වී තිබූ බවත්, එම ස්ථානය පරීක්ෂා කිරීමේදී අන්ර්ථයකට ලක්වූ යතුරු පැදියක කොටස්, එනම්, යතුරු පැදියක හැඩල් 01 ක් සහිත ට්‍රිම් එකක් සහ යතුරු පැදියක කොළ සහ සුදු පැහැති ප්ලාස්ටික් කෑලි තැනින් තැන විසි වී තිබූ බවට තමාට නිරීක්ෂණය වූ බවත්, ඒ ස්ථානයේ යකඩ බෝලද විසි වී තිබූ බවත්, තමා විසින් නිරීක්ෂණය කරන ලද යතුරු පැදියේ කොටසේ එම් ME4JF396FF8007612 ලෙස වැසි අංකයක් නිරීක්ෂණය වූ බවටත් සාක්ෂිකරු කියා සිටින ලදි. තවද, අවට තිබූ කොන්ක්‍රීට් කණු වලට හානි වී තිබූ බවත්, අමානෝ ෂීට් ඉරී විසි වී ගොස් තිබූ බවත්, තමාගේ නිරීක්ෂණය අනුව යතුරු පැදියක සවිකර තිබූ බෝම්බයක් පිපිරී යාමෙන් එම අනර්ථය සිදුවී ඇති බවට පෙනී ගිය බවටත් සාක්ෂිකරු පවසා සිටින ලදි. එම ස්ථාන පරීක්ෂණයේදී තමා විසින් අංක 01 ලෙස ලකුණු කරන ලද වැලි සාම්පලයක් භාරයට ගත් බවත්, අංක 02 ලෙස යතුරු පැදියක සුදු සහ කොළ පැහැති ප්ලාස්ටික් කැබලි, අංක 03 ලෙස ලකුණු කරන ලද යතුරු පැදියක ටයර් සහ හැඩලය සහිත කොටසක්, අංක 04 ලෙස බෝම්බය පිපිරුණ ස්ථානයේ තිබූ තවත් වැලි සාම්පලයක් තමාගේ භාරයට ගත් බවත්, අංක 01,02,03 සහ 04 ලෙස ලකුණු කරන ලද නඩු භාණ්ඩ

මඩකලපුව අපරාධ ස්ථාන පරීක්ෂණාගාරයේ නඩු භාණ්ඩ පිළිවෙළින් 48/2019, 49/2019, 50/2019 ලෙස නඩු භාණ්ඩ කුවිතාන්සි පොතේ ඇතුළත් කළ බවත්, අංක 03 ලෙස ලකුණු කරන ලද භාණ්ඩ වැඩිදුර විමර්ශනය සඳහා කාත්තන්කුඩි පොලිසියේ විමර්ශන නිළධාරි මොහොමඩ් යන අයට භාර දුන් බවටද සාක්ෂිකරු කියා සිටින ලදි. තවද, එම ස්ථානයේ තිබී විසි වී තිබූ යකඩ බෝල කීපයක් සොයා ගත් බවත්, එම යකඩ බෝල මඩකලපුව අපරාධ ස්ථාන පරීක්ෂණාගාරයේ අංක 51/2019 ලෙස නඩු භාණ්ඩ කුවිතාන්සි පොතේ ඇතුළත් කළ බවටත් මෙම සාක්ෂිකරු සාක්ෂි ලබා දෙන ලදි.

පැමිණිල්ල විසින් මඩකලපුව අපරාධ ස්ථාන පරීක්ෂණාගාරයේ තිබූ කුවිතාන්සි පොතේ 48/2019, 49/2019, 50/2019 සහ 51/2019 දරණ කුවිතාන්සි වලට අදාළ පිටු පැ.1585, පැ.1586, පැ.1587 සහ පැ.1588 ලෙස ලකුණු කරන ලදි. සාක්ෂිකරු විසින් අදාළ අපරාධ ස්ථානයෙන් සොයා ගන්නා ලද භාණ්ඩ අධිකරණයේදී හඳුනා ගෙන ඇත.

මෙම සාක්ෂිකරු විසින් තවදුරටත් කියා සිටියේ, තමා විසින් 2019.04.18 වන දින පරීක්ෂාවට ලක් කරන ලද එම ස්ථානය රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ රොෂාන් ප්‍රනාන්දු මහතා සහ සුසන්ත යන මහත්වරුන් විසින් 2019.04.23 වන දින නිරීක්ෂණය කර ඇති බවට දැන ගත් බවය.

පැ.සා. 2007 ක්‍රිෂ්ණපිල්ලෙයි රවිචන්ද්‍රන් යන අය සාක්ෂි දෙමින් පවසා සිටියේ, තමා 1989.12.18 වන දින පොලිස් සේවයට බැඳුනු බවත්, දැනට අවුරුදු 15 ක පමණ කාලයක් මඩකලපුව අපරාධ ස්ථාන පරීක්ෂණාගාරයට අනුයුක්තව සේවය කරන බවත්, 2019.04.18 වන දින කාත්තන්කුඩි පොලිසිය විසින් කාත්තන්කුඩි පොලිස් වසම තුළ පිහිටි අපරාධ ස්ථානයක් සම්බන්ධව දැනුම් දුන් බවත්, එම ස්ථානය පරීක්ෂා කිරීම සඳහා තමා පොලිස් කණ්ඩායමක් සමඟ එම ස්ථානයට ගිය බවත්, එම ස්ථානය කාත්තන්කුඩි පොලිස් වසම තුළ පිහිටි පාළමුණේ කිරිතෝනා වත්ත නමින් හඳුන්වන ප්‍රදේශය බවත්, අපරාධ ස්ථානය මොහොමඩ් මුස්තාෆා හසනුල් ෆස්රි යන තැනැත්තෙකුට අයත් ඉඩමක් බවත්, එම ඉඩමේ මායිම් කොන්ක්‍රීට් කණු සිටුවා අමානෝ ෂීට් වලින් වට කර තිබූ බවත්, එම ස්ථානය වැලි සහිත ඉඩමක් බවත්, එම ඉඩමේ එක් පැත්තක මීටර් 200 ක් දුරින් මුහුද පවතින බවත්, ඉඩමේ තවත් පැත්තක හමුදා කඳවුරක් පිහිටා තිබූ බවත්, එම ඉඩම තුළ සවුක්කු ලෙස හඳුන්වන ගස් එනම්, ෆයිනස් ගස් තිබූ බවත්, තමා එම ස්ථානයට යන විට එම ස්ථානයේ කාත්තන්කුඩි පොලිසියේ ස්ථානාධිපති කස්තුරිආරච්චි, විමර්ශන නිළධාරීන් උ.පො.ප. මොහොමඩ්, පො.කො. 76624 දිසානායක, පො.කො. 79586 මොහොමඩ් යන නිළධාරීන් සිටි බවත්, තමා එම භූමියට ගොස් අපරාධය සිදු වූ බවට පෙන්වා දුන් ස්ථානයක් පරීක්ෂා කළ බවත්, තමාට කාත්තන්කුඩි පොලිස් ස්ථානය විසින් දැනුම් දී තිබුනේ

ගිනි තැබීමක් සිදු වූ බවට වුවද, එම ස්ථානය නිරීක්ෂණය කරන අවස්ථාවේ එහි තිබූ අමානෝ ෂීට් තහඩු විසි වී තිබූ බවත්, එම ස්ථානය පරීක්ෂා කිරීමේදී අන්ර්ථයකට ලක්වූ යතුරු පැදියක කොටස්, එනම්, යතුරු පැදියක හැඩල් 01 ක් සහිත ට්‍රිම් එකක් සහ යතුරු පැදියක කොළ සහ සුදු පැහැති ප්ලාස්ටික් කෑලි තැනින් තැන විසි වී තිබූ බවට තමාට නිරීක්ෂණය වූ බවත්, ඒ ස්ථානයේ යකඩ බෝලද විසි වී තිබූ බවත්, තමා විසින් නිරීක්ෂණය කරන ලද යතුරු පැදියේ කොටසේ එම් ME4JF396FF8007612 ලෙස වැසි අංකයක් නිරීක්ෂණය වූ බවටත් සාක්ෂිකරු කියා සිටින ලදි. තවද, අවට තිබූ කොන්ක්‍රීට් කණු වලට හානි වී තිබූ බවත්, අමානෝ ෂීට් ඉරී විසි වී ගොස් තිබූ බවත්, තමාගේ නිරීක්ෂණය අනුව යතුරු පැදියක සවිකර තිබූ බෝම්බයක් පිපිරී යාමෙන් එම අනර්ථය සිදුවී ඇති බවට පෙනී ගිය බවටත් සාක්ෂිකරු පවසා සිටින ලදි. එම ස්ථාන පරීක්ෂණයේදී තමා විසින් අංක 01 ලෙස ලකුණු කරන ලද වැලි සාම්පලයක් භාරයට ගත් බවත්, අංක 02 ලෙස යතුරු පැදියක සුදු සහ කොළ පැහැති ප්ලාස්ටික් කැබලි, අංක 03 ලෙස ලකුණු කරන ලද යතුරු පැදියක ටයර් සහ හැඩලය සහිත කොටසක්, අංක 04 ලෙස බෝම්බය පිපිරුණ ස්ථානයේ තිබූ තවත් වැලි සාම්පලයක් තමාගේ භාරයට ගත් බවත්, අංක 01,02,03 සහ 04 ලෙස ලකුණු කරන ලද නඩු භාණ්ඩ මඩකලපුව අපරාධ ස්ථාන පරීක්ෂණාගාරයේ නඩු භාණ්ඩ පිළිවෙළින් 48/2019, 49/2019, 50/2019 ලෙස නඩු භාණ්ඩ කුවිතාන්සි පොතේ

ඇතුළත් කළ බවත්, අංක 03 ලෙස ලකුණු කරන ලද භාණ්ඩ වැඩිදුර විමර්ශනය සඳහා කාත්තන්කුඩි පොලිසියේ විමර්ශන නිළධාරි මොහොමඩ් යන අයට භාර දුන් බවටද සාක්ෂිකරු කියා සිටින ලදි. තවද, එම ස්ථානයේ තිබී විසි වී තිබූ යකඩ බෝල කීපයක් සොයා ගත් බවත්, එම යකඩ බෝල මඩකලපුව අපරාධ ස්ථාන පරීක්ෂණාගාරයේ අංක 51/2019 ලෙස නඩු භාණ්ඩ කුවිතාන්සි පොතේ ඇතුළත් කළ බවටත් මෙම සාක්ෂිකරු සාක්ෂි ලබා දෙන ලදි.

පැමිණිල්ල විසින් මඩකලපුව අපරාධ ස්ථාන පරීක්ෂණාගාරයේ තිබූ කුවිතාන්සි පොතේ 48/2019, 49/2019, 50/2019 සහ 51/2019 දරණ කුවිතාන්සි වලට අදාළ පිටු පැ.1585, පැ.1586, පැ.1587 සහ පැ.1588 ලෙස ලකුණු කරන ලදි. සාක්ෂිකරු විසින් අදාළ අපරාධ ස්ථානයෙන් සොයා ගන්නා ලද භාණ්ඩ අධිකරණයේදී හඳුනා ගෙන ඇත.

පැ.සා. අංක 2306. පො.ප. මොහිදීන් මොහොමඩ් ජේසුලි යන අය සාක්ෂි ලබා දෙමින් තමා, 2019 වර්ෂයේ කාත්තන්කුඩි පොලිස් ස්ථානයට අනුයුක්තව උප පොලිස් පරීක්ෂකවරයෙක් වශයෙන් සේවය කරමින් සිටියදී 2019 අප්‍රේල් 17 වන දින යතුරු පැදියක් ගිනි තබා අනර්ථයක් සිදු කළ බවට ලද පැමිණිල්ලක් අනුව ස්ථානාධිපති, පොලිස් පරීක්ෂක නිශාන්ත ප්‍රභාත් කස්තුරිආරච්චි මහතාද සමඟ කාත්තන්කුඩි කිරිතෝන ප්‍රදේශයට ගිය බවත්, එම අවස්ථාවේ රාත්‍රී කාලය බැවින් විදුලි පන්දම්

එළියෙන් නිරීක්ෂණය කිරීම් සිදු කළ බවත්, එහිදී යතුරු පැදියක් පුපුරවා හැරීමක් සිදු කර ඇති බවට නිරීක්ෂණය වූ බවත්, ඉන් පසුව එම ස්ථානය අවට ආරක්ෂා කිරීම සඳහා පො.කො. 76624, පො.කො.79586 යන නිළධාරීන් යෙදූ බවත්, පසු දින එනම්, 2019.04.18 වන දින එම ස්ථානය පරීක්ෂා කිරීම සඳහා සොකෝ නිළධාරීන් කැඳවා තමාද එම ස්ථානයට පිටත් වූ බවත්, සිදු වූ යතුරුපැදි පිපිරීම පරීක්ෂා කර වැසි අංකය (ME4JF396FF8007612) අනාවරණය කරගත් බවත්, එම යතුරුපැදියේ කොටස් (පැ.1722) සහ පස් සාම්පල් (පැ.1723) මඩකලපුව මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කර ඇති බවත්, එම වැසි අංකය ඔස්සේ පරීක්ෂා කිරීමේදී ව්‍යාජ හැඳුනුම්පතක් (Gerard Yasasthi de Silva නමින්) භාවිතා කර මෙම යතුරුපැදිය මිලදී ගෙන ඇති බවට අනාවරණය කරගත් බවටත් සඳහන් කර තිබේ.

මෙම නඩුවට අදාළව පැමිණිල්ලේ සාක්ෂි මෙහෙයවීම අවසන් කිරීමෙන් අනතුරුව එතෙක් ඉදිරිපත් වූ සියළු සාක්ෂි සැළකිල්ලට ගෙන අප විසින් මෙම නඩුවේ සියළුම චූදිතයින්ගෙන් විත්තිවාචකය කැඳවීමට කටයුතු කරන ලද අතර, ඒ අනුව ඔවුනට ව්‍යවස්ථාපිතව හිමිවී ඇති සියළුම අයිතිවාසිකම් අප විසින් ඔවුනට පහදා දෙන ලදී. 6 වන චූදිත වන මොහොමඩ් රිස්කාන් යන චූදිත පමණක් විත්තිකූඩුවේ නිහඬව සිටින ලද අතර, අනෙකුත් සියළුම චූදිතයින් විත්තිකූඩුවේ සිට ප්‍රකාශයන් කරන බවට

අධිකරණයට දැනුම් දෙන ලදී. ඒ අනුව ඔවුනට විත්තියේ විභාගය සඳහා සූදානම් වීමට අවස්ථාව අප විසින් ලබා දෙන ලදී.

<u>විත්තියේ නඩු විභාගය</u>

<u>චූදිතයින් විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයන්</u>

<u>සම්පිණ්ඩනය කර ඇගැයීමට ලක් කිරීම</u>

මෙම නඩුවේ පැමිණිල්ලේ නඩුව අවසානයේ අප විසින් සියලුම චූදිතයින්ගෙන් ඔවුනට එරෙහිව ඉදිරිපත් කර තිබෙන සියලුම චෝදනාවන් සම්බන්ධයෙන් විත්තිවාචකය කදවන ලදී. ඒ අනුව සියලුම චූදිතයින් ට ව්‍යවස්ථාපිතව උරුම වී ඇති අයිතිවාසිකම් සියල්ල අප විසින් ඔවුනට මනාව පහදා දෙන ලදී. කෙසේ වුවද 01 සිට 24 දක්වා සියලුම චූදිතයින් විසින් විත්තිකූඩුවේ සිට ප්‍රකාශයන් සිදු කරන ලදී. විත්තිකරුවකු විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයන් සම්බන්ධව කවර ආකාරයකින් අධිකරණය විසින් කටයුතු කල යුතු ද යන්න සම්බන්ධයෙන් මෙහිදී අප ***Gunasiri and two others vs Republic of Sri Lanka (2009) 01 SRI.LR 47*** යන නඩුවෙහි ගරු සිසිර ආබා විනිසුරුතුමාණන් පෙන්වා දී ඇති නීතිමය තත්ත්වය සළකා බලන ලදී. එම නඩුවේදී සඳහන් කර ඇති

"In evaluating a dock statement, the Trial Judge must consider the following principles:

(1) If the dock statement is believed it must be acted upon.

(2) If the dock statement creates a reasonable doubt in the prosecution case the defense must succeed

(3) Dock Statement of one accused person should not be used against the other persons"

යන කරුණු අපගේ සැලකිල්ලට ගනිමු. එමෙන්ම ***Kularatne vs The Queen 71 NLR 529*** යන නඩුවෙහිදී අපරාධ අභියාචනාධිකරණය විසින් ද පෙන්වා දී ඇති පරිදි විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයක් සම්බන්ධයෙන් නඩුව අසන විනිසුරුවරයා විසින් අනුගමනය කල යුතු නිතිමය තත්ත්වය අප විසින් සැලකිල්ලට ගනිමු. එනම්, විත්තිකූඩුවේ සිට කරන ප්‍රකාශයක් ඇගයීමට ලක් කිරීමේදී

01.විත්තිකූඩුවේ සිට කරන ප්‍රකාශය විශ්වාස කරන්නේ නම්, ඒ මත පිහිටා කටයුතු කළ යුතුය.

02.විත්තිකූඩුවේ සිට කරන ප්‍රකාශයෙන් පැමිණිල්ලේ නඩුව කෙරෙහි සාධාරණ සැකයක් ජනිත වන්නේ නම් එකී සැකයේ වාසිය විත්තිකරුට ලබා දී විත්තිකරු නිදොස් කොට නිදහස් කළ යුතුය.

03.එක් විත්තිකරුවකු විත්තිකූඩුවේ සිට කරන ප්‍රකාශයක් අනිකුත් විත්තිකරුවන්ට එරෙහිව උපයෝගි කර නොගත යුතුය.

යන නෛතික තත්ත්වයන් කෙරෙහි අපගේ අවධානය යොමු කරමින් මෙම නඩුවෙහි චූදිතයින් විසින් විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයන් සියල්ල එකිනෙක අනුපිළිවෙලින් සළකා බැලීමට කටයුතු කරමු.

01 චූදිත මොහොමඩ් ඊබ්‍රාහිම් මොහොමඩ් නවුෆර් විසින්

විත්ති කූඩුවේ සිට කරන ලද ප්‍රකාශය

මෙම නඩුවේ 01 චූදිත මොහොමඩ් ඊබ්‍රාහිම් මොහොමඩ් නවුෆර් තමා 47 හැවිරිදි, දරුවන් තිදෙනෙකුගේ පියෙකු වන අතර වෘත්තියෙන් අරාබි භාෂා ගුරුවරයෙකු බව ඔහු පවසා ඇති අතර, ඔහු ශ්‍රී ලංකාවේ ඉපදී නිදහස් අධ්‍යාපනය ලැබූ ඔහු, මාදම්පේ ඉස්ලාහියා අරාබි විද්‍යාලයෙන් මවුලවි අධ්‍යාපනය ලබා රජයේ අල්-ආලිම් විභාගය සමත් වූ බව පවසා ඇත. පසුව අග්නිදිග විශ්ව විද්‍යාලයෙන් අරාබි සාහිත්‍යය පිළිබඳ සිවි වසරක උපාධියක් ලබා ඇති ඔහු, කාත්තන්කුඩියේ ධාරුල් අදර් නැමැති ස්ථානයේ ආගමික ප්‍රචාරකයෙකු ලෙසත්, වසර දහයක් කටාර් රාජ්‍යයේ භාෂා පරිවර්තකයෙකු ලෙසත් සේවය කර තිබෙන බවත් පවසා ඇත. එසේම

දෙමළ භාෂාවෙන් පොත් කිහිපයක් ලියා ඇති ඔහු, අන්තර්ජාලය සහ මුහුණු පොත හරහා ආගමික දැනුම බෙදාහදා ගැනීමට කටයුතු කර ඇත.

2018 වසරේ නැවත ලංකාවට පැමිණ හෙට්ටිපොල අරාබි පාසලක සේවය කරමින් සිටියදී, 2019 අප්‍රේල් 21 වන දින දඹුල්ල ප්‍රදේශයේදී තමා අත්අඩංගුවට ගත් බව ඔහු පවසයි. ඉන්පසු වසර එකහමාරක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව භාරයේ රඳවා සිටි අතර, එම කාලය තුළ CID නිලධාරීන් තමාට පහර දුන් බවත් ඒ පිළිබඳව තමා අධිකරණ වෛද්‍ය නිලධාරියාට පැමිණිලි කළ බවත් ඔහු සඳහන් කරයි.

ඔහු විත්ති කූඩුවේ සිට කරන ලද ප්‍රකාශය මඟින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශ ලබා ගැනීමේදී අනුගමනය කළ ක්‍රියා කලාපය පිළිබඳව බරපතල චෝදනා එල්ල කරමින් ඔහු පවසා ඇත්තේ තමාගෙන් මුලින් ලබාගත් සාමාන්‍ය විස්තරවලට ඔවුන්ට අවශ්‍ය කරුණු එකතු කර, යතුරු ලියනය කරන ලද ලේඛනවලට තමාට කියවීමටවත් ඉඩ නොදී බලහත්කාරයෙන් අත්සන් ලබා ගත් බවයි. මෙලෙස අත්සන් ලබා ගැනීම සඳහා තම බිරිඳ සහ පුතා අත්අඩංගුවට ගෙන ඔවුන් දිගටම සිරගත කරන බවට පවසමින් තමා බිය ගැන්වූ බව ඔහු පවසා ඇත. අවසාන වශයෙන් ඔහු පවසන්නේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ඉදිරිපත් කරන ප්‍රකාශයන් තමා ස්වේච්ඡාවෙන් ලබා දුන් ඒවා නොව, ඔවුන් විසින් ව්‍යාජ ලෙස සකස් කරන ලද ඒවා බවයි.

මෙම ප්‍රකාශය මගින් 01 චූදිත තමන්ට එල්ල වී ඇති ත්‍රස්තවාදී චෝදනා සියල්ල සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරයි. ඔහු ප්‍රධාන වශයෙන් පෙන්වා දෙන්නේ තමන් අත්සන් කළ බව කියන පාපොච්චාරණය විමර්ශන නිලධාරීන් විසින් ව්‍යාජ ලෙස සකස් කරන ලද්දක් බවයි. එම ලේඛනය තමන්ට කියවාදීමක් හෝ පැහැදිලි කිරීමක් නොකර බලහත්කාරයෙන් අත්සන් ලබා ගත් බව ඔහු චෝදනා කරයි. පාස්කු ප්‍රහාරයට සම්බන්ධ සහරාන් ඇතුළු පිරිස සමඟ එක්ව අන්තවාදී දේශන පැවැත්වීම, ජාතීන් අතර වෛරය වැපිරීම සහ ජාතික සමගියට හානි කිරීම සම්බන්ධයෙන් තමාට එරෙහිව චෝදනා 940 කට අධික ප්‍රමාණයක් ගොනු කර ඇති බවත්, තමන් කිසිදු දිනක ත්‍රස්තවාදයට අනුබල දෙන දේශන පවත්වා නොමැති බවත් ඔහු පවසා ඇත. පැමිණිල්ල විසින් ඉදිරිපත් කළ සාක්ෂිකරුවන්ගේ විශ්වසනීයත්වය පිළිබඳව ඔහු දැඩි ලෙස හඬ කර ඇති අතර, ඔහු වැඩිදුරටත් පවසා ඇත්තේ, අස්මියා නැමැති සාක්ෂිකාරිය ඇයව රඳවා තබා ගෙන සිටි අවස්ථාවේදී පොලිස් නිලධාරීන්ගේ තර්ජන සහ බලපෑම් මත බොරු සාක්ෂි දුන් බව මෙම අධිකරණයේදී පිළිගෙන ඇති බවය. එසේම පැමිණිල්ලේ සාක්ෂි අංක 1400 අනස් යන සාක්ෂිකරුවාගේ ප්‍රකාශ පරස්පර විරෝධී බවත්, ඔහු පවසන කරුණු තහවුරු කිරීමට කිසිදු සාක්ෂියක් පැමිණිල්ලෙන් ඉදිරිපත් කර නැති බවත් ඔහු පවසා ඇත.

මෙම චූදිත පවසන ආකාරයට, ඔහුට එරෙහිව ඇති පාපොච්චාරණය සහ සාක්ෂි සියල්ලම පාහේ බලහත්කාරයෙන් හෝ වංචනික ලෙස ලබාගත් ඒවා වේ. තමන්ට විරුද්ධව ගොනු කර ඇති අතිවිශාල චෝදනා ප්‍රමාණයට කිසිදු පදනමක් නැති බවත්, තමන් සහරාන් ඇතුළු කණ්ඩායම සමඟ එක්ව කිසිදු අන්තවාදී දේශනයක් පවත්වා නැති බවත් ඔහු පවසා ඇති අතර, ඔහු වැඩිදුරටත් සඳහන් කර ඇත්තේ මෙම අධිකරණයේදී සාක්ෂි දුන් පුද්ගලයන් පවා විමර්ශන නිලධාරීන්ගේ බලපෑමට යටත්ව බොරු සාක්ෂි ලබාදී ඇති බවත් වේ. එසේම තමන් කිසිදු වරදක් කර නැති බවත්, මෙම නඩුව තමන්ව දේශපාලනික හෝ වෙනත් අරමුණක් මත සිරකර තැබීමට ගොනු කරන ලද්දක් බවත් ඔහු පවසා ඇත. 01 චූදිත තමාට එරෙහිව ඉදිරිපත් වී ඇති සාක්ෂි පරස්පර බවට සඳහන් කර ඇති අතර ඔහු "ජිහාඩ්" යන ඉස්ලාමීය සංකල්පය පිළිබඳව දීර්ඝ හා සවිස්තරාත්මක පැහැදිලි කිරීමක් සිදු කරමින් පෙන්වා දීමට උත්සහ දරා ඇත්තේ තමා ජිහාඩ් සම්බන්ධයෙන් ආගමික විද්වතුන් ඉදිරියේ කිසිදු වැරදි සහගත කැඳවීමක් සිදු නොකළ බවත්, තමාගෙන් හරස් ප්‍රශ්න අසන විට සාක්ෂිකරුට තමා කළ දේශනාවල වචන මතක නොතිබූ බවත්ය. පැමිණිල්ලේ සාක්ෂිකරුවෙකු වන අනස් යන සාක්ෂිකරු සාක්ෂි ලබා දෙමින් මෙම චූදිත තමා ආයුධ සන්නද්ධ අරඹලයකට උසිගැන්වූ බවට කළ ප්‍රකාශය මෙම චූදිත ප්‍රතික්ෂේප කරමින් පවසා ඇත්තේ, තමා සඳහන් කල ජිහාඩ් යනු "ජුහුද්" හෙවත් අසීරුවෙන් සිදු කරන සෑම යහපත්

උත්සාහයක්ම අර්ථවත් කරන පදයක් බවයි. මෙයට ධර්ම ශාස්ත්‍රීය පර්යේෂණ (ඉජ්තිහාඩ්) සහ මනසේ ඇති වන නරක සිතුවිලි පාලනය කිරීමේ ආධ්‍යාත්මික අරඹලය (මුජාහදා) ඇතුළත් වන බව ඔහු පෙන්වා දෙන අතර, ඔහු වැඩිදුරටත් පවසා ඇත්තේ, ආයුධ සන්නද්ධ අරගලය ගැන කතා කිරීමේදී එය ආකාර දෙකක් බවත්, ඉන් පළමුවැන්න සඳහා මුස්ලිම් රාජ්‍යයක් සහ පාලකයෙකු සිටිය යුතු බවත් ඔහු අවධාරණය කරන අතර, දෙවැන්න ලෙස ඔහු හඳුන්වන්නේ තමන්ට එරෙහිව ප්‍රහාරයක් එල්ල වන විට සහ රාජ්‍ය ආරක්ෂක අංශවලින් නිසි ආරක්ෂාවක් නොලැබෙන විට තමන්ගේ ජීවිත, දේපල සහ ආගමික ස්ථාන ආරක්ෂා කර ගැනීම සඳහා සිදු කරන ආත්ම ආරක්ෂක අරඹලය බවයි.

ඔහු වැඩිදුරටත් පවසා ඇත්තේ තමා දේශනා කළ මෙම පුළුල් සහ විනයානුකූල අදහසින් එක් වාක්‍යයක් පමණක් ගෙන පැ.සා 1400 අනස් යන සාක්ෂිකරු තමාට එරෙහිව වැරදි සාක්ෂි දුන් බවයි. විශේෂයෙන්ම, සන්නද්ධ අරඹලයක් සඳහා රාජ්‍යයක් තිබිය යුතු බවට තමා කළ ප්‍රකාශය සාක්ෂිකරු හිතාමතාම මගහැර ඇති බව ඔහු චෝදනා කරයි. ඔහු තවදුරටත් පැහැදිලි කරන්නේ "අබු සෙයිඩ්" යනු තමා 2005 සහ 2006 වකවානුවල ලේඛන කටයුතු සඳහා තම පුතාගේ නම ඇසුරින් භාවිතා කළ ආරූඪ නමක් මිස රහසිගත නමක් නොවන බවයි. පැ. සා. 1400 අනස් යන සාක්ෂිකරුගේ සාක්ෂිය ප්‍රතික්ෂේප කරමින් ඔහු සඳහන් කර ඇත්තේ, එම

සාක්ෂිකරු මුලින් සහරාන් ඇතුළු පිරිසක් ගැන පමණක් සඳහන් කර පසුව තම නමද ප්‍රකාශවලට ඇතුළත් කර ඇති බවයි. එසේම මෙම චූදිත අවධාරණය කරන්නේ, IS සංවිධානයට සම්බන්ධ වීඩියෝ පෙන්වීම, ආයුධ පුහුණුව, පුපුරණ ද්‍රව්‍ය අත්හදා බැලීම හෝ එම සංවිධානයට ප්‍රතිඥා දීම (බයිඅත්) වැනි කිසිදු ක්‍රියාවක් සිදුවන අවස්ථාවක තමා එහි සිටි බවට හෝ ඒ පිළිබඳව තමා දැනුවත්ව සිටි බවට අනස් යන සාක්ෂිකරු විසින් කිසිදු සාක්ෂියක් ඉදිරිපත් කර නොමැති බවත් ඒ අනුව තමා එම අන්තවාදී ක්‍රියාවලට සම්බන්ධ නොමැති බවයි.

තමා ISIS වීඩියෝ දර්ශන නැරඹූ බවට, අවි පුහුණුව ලබාගත් බවට හෝ බෝම්බ සෑදීම පිළිබඳව ඉගෙන ගත් බවට එල්ල වන චෝදනා පදනම් විරහිත බවට මෙම චූදිත පවසා ඇති අතර, අනස් නමැති සාක්ෂිකරුගේ සාක්ෂිය පිළිබඳව සඳහන් කරමින් ඔහු පවසන්නේ, අදාළ සාක්ෂිකරු තමා කිසිදු අවි පුහුණුවකට හෝ අන්තවාදී ක්‍රියාවකට සම්බන්ධ වූ බවට සාක්ෂි ලබා දී නොමැති බවයි. නුවරඑළිය සහ පාලමුණේ ප්‍රදේශවල පැවති 'බයාන්' දේශනාවලට තමා සහභාගී වූ බව ඔහු පිළිගත්තද, එම වැඩසටහන් සාමාන්‍ය ආගමික දේශනා පමණක් වූ බවත් එහිදී කිසිදු අන්තවාදී හෝ ත්‍රස්තවාදී අදහස් ප්‍රකාශ නොවූ බවත් ඔහු අවධාරණය කරයි. සහරාන් සහ සෙයිනි යන අය එම දේශනාවලට සහභාගී වූ බව ඔහු පවසන නමුත්, තමා

කිසිවිටෙකත් ISIS සංවිධානයට පක්ෂපාතීව දිවුරුම් දී නොමැති බව මෙම චූදිත පවසා සිටී.

මෙම චූදිත තම දීර්ඝ ප්‍රකාශයේ දී පවසා ඇත්තේ තමා පොලිසිය දැක පලා ගිය බවට කරන ප්‍රකාශය අසත්‍ය බවත්, සිංහල භාෂාව නොදන්නා නිසා ඇති වූ සන්නිවේදන ගැටලු හේතුවෙන් තමා අත්අඩංගුවට ගත් බවත් වේ. තවද, ඔහු විසින් ස්වේච්ඡාවෙන් පාපොච්චාරණයක් ලබා දුන් බවට පවසා අධිකරණයට ඉදිරිපත් කර ඇති ලේඛනය සම්පූර්ණයෙන්ම ව්‍යාජ එකක් බවත්, එය විජිත පෙරේරා නමැති නිලධාරියෙකු විසින් සකස් කරන ලද්දක් බවත් ඔහු පවසයි. තමාව අත්අඩංගුවට ගත් අවස්ථාවේ තමා සතුව තිබී හමු වූ බව කියන අරාබි අකුරු සහිත කොළය හෝ ජංගම දුරකථනය කිසිදු විද්‍යාත්මක පරීක්ෂණයකට යොමු කර නොමැති බව පවසන ඔහු, තමාට එරෙහිව කිසිදු ස්ථිර සාක්ෂියක් නොමැති බව පවසමින් තමා නිර්දෝෂී බව ප්‍රකාශ කරයි.

